# උඩුනුවර ප්‍රාදේශීය සභාවේ පැවැති 07 වන සභා වාරයේ පනස් හතරවන සභා රැස්වීම් වාර්තාව

දිනය :- 2022.09.08 පෙ.ව. 9.30

1. ටී.පී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා ගරු සභාපති
2. එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා ගරු උප සභාපති
3. රංජිත් වනිගසිංහ ඒකනායක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
4. ඩී. ආරියරත්න දෙලංකාවල මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
5. ආර්.එම්. ජයවීර රත්නායක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
6. ඒ.ආර් සුමනාවති මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
7. පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි ගරු ප්‍රා.ස.මන්ත්‍රී
8. එල්.එච්. කරුණාසේන දයාතිලක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
9. පී.ජී.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
10. එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
11. පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
12. කේ.එම්. කුලතුංග මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
13. එන්. එච්. ලාල් ජයන්තසිරි මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
14. එල්.ආර්. චන්ද්‍රසේකර බංඩාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
15. එච්.පී. ජයතිලක මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
16. ආර්.ජී.ඩී. සිසිර ශාන්ත කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
17. කේ. ප්‍රේමසිරි මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
18. කේ.වී.පී. නයනා කුමුදුනි මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
19. කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
20. ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
21. එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
22. ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
23. ඩබ්. රාණි මැණිකේ මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී
24. ඩබ්.ඩී. දර්ශන නුවන් ගරු ප්‍රා.ස.මන්ත්‍රී

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

1. ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
2. කේ.බී. විමලරත්න මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
3. එන්.පී. චතුරංග දර්ශන කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
4. ඒ. ලලිත් කුමාර මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
5. එන්. අමරකීර්ති මයා ගරු ප්‍රා.ස.මන්ත්‍රී
6. ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී

01.ආගම සිහිකිරීම හා මියගිය රණ විරුවන් සිහිකිරීම

**ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදු රණවිරුවන් සිහි කිරීමෙන්ද පසු පෙ.ව. 9.30 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදි.**

**රැස්වීම ආරම්භයේදි ගරු මන්ත්‍රීවරුන් 16 දෙනෙක් පැමිණ සිටින ලදි.**

| | | |
|---|---|---|
| 1. | **ටී.පී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා** | **ගරු සභාපති** |
| 2. | **රංජිත් වනිගසිංහ ඒකනායක මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 3. | **ආර්.එම්. ජයවීර රත්නායක මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 4. | **පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 5. | **එල්.එච්. කරුණාසේන දයාතිලක මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 6. | **පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී** |
| 7. | **එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 8. | **පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 9. | **කේ.එම්. කුලතුංග මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 10. | **එන්. එච්. ලාල් ජයන්තසිරි මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 11. | **ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 12. | **කේ. ප්‍රේමසිරි මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 13. | **කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 14. | **එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |
| 15. | **ඩබ්. රාණි මැණිකේ මිය** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී** |
| 16. | **ඩබ්.ඩී. දර්ශන නුවන්** | **ගරු ප්‍රා.ස.මන්ත්‍රී** |

**02.පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපතිතුමා**

මා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාව ස්ථිර කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.45 ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.වී.ජී. නයනා කුමුදුනී මිය පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා.**

පසුගිය සභාවාරයේ පැන නැගුණු ප්‍රශ්නයක් අනුව මේ සභාවාරයේ න්‍යාය පත්‍රයට ආගම සිහිකිරීම හා මියගිය රණවිරුවන් සිහිකිරීම ඇතුලත් කිරීම පිළිබඳව ප්‍රථමයෙන් ස්තුති වන්ත වන බව ප්‍රකාශ කරන ලදි.එසේම සභාපතිතුමනි ඔබතුමා ආගම සිහිකිරීම ගැන සඳහන් කරන විට රණවිරුවන් සිහිකිරීමත් සඳහන් කලයුතු යැයි පෙන්වා දෙන ලදි.පසුගිය සභා වාරයේදී JCB යන්ත්‍රයේ ධාවන සටහන එම ආකාරයෙන්ම ඇතුලත් කර ඇති බවත් පෙන්වා දෙන ලදි. JCB යන්ත්‍රයේ ධාවන සටහන නිවැරදි කර මේ සභාවට ඉදිරිපත් කර නොමැති බවත් මේ සභාවාර්තාව සම්මත කරන විට එම වැරදි ධාවන සටහනත් සම්මත වන බවත් පෙන්වා දෙන ලදි.එය ලබන සභා වාරයේදී හෝ නිවැරදි කර සභාවට ඉදිරිපත් කලයුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්ප කුමාර මහතා.**

ගරු සභාපතිතුමනි ,මේ සභාවේ නියෝජනය කරන මන්ත්‍රීවරු ගණන කොපමණදැයි විමසන ලදි.මා දන්නා ආකාරයට මන්ත්‍රීවරු 31 දෙනෙක් සිටින බවත් ,නමුත් දැන් සභාවාර්තාවේ 30 දෙනෙකුගේ පමණක් නම් තිබෙන බවත් , එයට හේතුව විමසන ලදි.

**ගරු සභාපතිතුමා.**

මන්ත්‍රීවරු 31 දෙනෙක් සිටිය බවත් , ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙකු පුරප්පාඩු වූ බවත් , එයින් එක් පුරප්පාඩුවකට දර්ශන නුවන් මන්ත්‍රීතුමා පැමිණි බවත් ,තව එක් පුරප්පාඩුවක් පවතින බවත් , ඒ අනුව දැනට මන්ත්‍රීවරු 30 දෙනෙකු සිටින බවත් ප්‍රකාශ කරන ලදි. දිස්නා මන්ත්‍රීතුමියගේ මන්ත්‍රීධූරය අහෝසිකර ලිපියක් ලැබී ඇති බවත් , එය පසුගිය සභාවාරයකදී සභා ගත කල බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්ප කුමාර මහතා.**

මේ සභාවාර්තාව ගත්විට පසුගිය සභා වාරයේ මන්ත්‍රීවරු විසිදෙනෙකු සභාව නියෝජනය කර ඇති බවත් , ඒය මුල් ලැයිස්තුවේ සදහන්ව ඇති බවත් , නමුත් මෙම සභා වාර්තාවේ නොපැමිණි මන්ත්‍රීවරු 08 ක් බව සදහන් කර ඇති බවත් , සභාව පටන්ගන්නා විට ආරම්භයේදී මන්ත්‍රීවරු 11 දෙනෙකු පැමිණ සිටි බව සදහන් කර ඇති බවත් , නැවත වරින් වර පැමිණි මන්ත්‍රීවරුන්ගේ නම් සදහන්ව ඇත්තේ 09 දෙනෙකුගේ බවත් , එසේ ගත් විට පැමිණ සිටින මන්ත්‍රීවරු 20 දෙනෙකුගේ නම් පමණක් සදහන් වී ඇති බවත් ,ඉතිරි මන්ත්‍රීවරු දෙදෙනාට කුමක් සිදුවී ඇත්දැයි විමසන ලදි.නමුත් මන්ත්‍රීවරු 22 ක් සභාව නියෝජනය කල බව සදහන් වී ඇති බැවින් මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ නම් සදහන් නොවීම ගැටළුවක් බව පෙන්වා දෙන ලදි.නමුත් ඒම මන්ත්‍රීවරු දෙදෙනා නොපැමිණි ලැයිස්තුවේ නම සදහන් වි නොමැති බවත් , පැමිණි වේලාවකුත් නොමැති බවත් , මේ මන්ත්‍රීවරු දෙදෙනාට කුමක් සිදු වී දැයි විමසන ලදි.මේ සභාවට පැමිණෙන මන්ත්‍රීවරයාට වෙච්ච දේ මෙම සභා වාර්තාවේ සදහන් වී නොමැති නම් ඒය බරපතල ප්‍රශ්නයක් බවත් , සභා වාර්තාව කියන එක තනි බොරුවක් බවත් ප්‍රකාශ කරන ලදි.මෙය අධීක්ෂණය කලායැයි අත්සන් කර තිබෙන බවත් , ලේකම් තුමිය අත්සන් කර තිබෙන බවත් , මේ අඩුපාඩුව වාර්තාව හදන නිළධාරීන් දන්නේ නැත්නම් , ජනතාව ගැන අප කරන සෙල්ලම , විහිළුව , කුමක්දැයි විමසන ලදි.මම මේ කතා කරන්නේ සාමාන්‍ය ජනතාව ගැන නොවන බවත් , මන්ත්‍රීවරු දෙදෙනෙකු ගැන බවත් ප්‍රකාශ කරන ලදි.මෙය බරපතල ප්‍රශ්නයක් බව ප්‍රකාශ කරන ලදි. තමන්ගේ රාජකාරිය හරියට කරන්න බැරිනම් රස්සාවෙන් එළියට දමන ලෙස ප්‍රකාශ කරන ලදි.සභාවාර්තාව හරියට කරන්නට බැරිනම් , සභාපතිතුමා කියන දේ පිළිපදින්න බැරිනම් , ලේකම් කියන දේ පිළිපදින්න බැරිනම් , මෙවැනි නිළධාරී මණ්ඩලයක් සමග සභාවක් ඉස්සරහට ගන්නට පුළුවන් දැයි විමසන ලදි.අවුරුදු හතරක් තිස්සේ මේ පිළිබද කතා කරන බවත් ප්‍රකාශ කරන ලදි.සභාවල මේ වගේ දේවල් වන විට රටක් ලෙස රට ඉස්සරහට යයිදැයි විමසන ලදි. එමනිසා මෙවැනි දේවල් මින් ඉදිරියට වීමට ඉඩ නොතබන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.හරියාකාරව වැඩ කටයුතු කර ඉස්සරහට වැඩ කරන්නැයි ප්‍රකාශ කරන ලදි.නම් සදහන් වී නොමැති මන්ත්‍රීවරු දෙදෙනා නම් ලලිත් කුමාර මන්ත්‍රීවරයා හා ජගත් ප්‍රසන්න මන්ත්‍රීවරයා බව ප්‍රකාශ කරන ලදි.මෙය නොසැලකිලිමත් කම නිසා සිදුවූ වරදක් බවත් මින් ඉදිරියට ඒසේ නොවීමට වගබලා ගතයුතු බවත් ප්‍රකාශ කුරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.00 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.ආර්.චන්ද්‍රසේකර බණ්ඩාර මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.05 ගරු ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.ජී.ජයතිලක මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.06 ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ආරියරත්න දෙලංකාවල මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.07 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඊ.ආර් සුමනාවතී මිය පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී ඩබ්.රාණි මැණිකේ මිය.**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙකුට කුමක්ද සිදුවූයේ යැයි පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නයක් නැගූ බවත් 2021 වර්ෂයේ අපේ පක්ෂයේ විනය පරීක්ෂණයක් සිදුවූ බවත් , එම විනය පරීක්ෂණයේ අවසානයේ ගත් තීරණය අනුව අපේ මන්ත්‍රීවරු දෙදෙනෙක් පක්ෂයෙන් ඉවත් කල බවත් , ඔවුන් වූයේ නිමල් බණ්ඩාර මන්ත්‍රීතුමා හා දිස්නා ජානකී මන්ත්‍රීතුමිය බව ප්‍රකාශ කරන ලදි.එම මන්ත්‍රීවරුන්ගේ ඉවත් වීම ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම්දුන් බවත් , එම පුරප්පාඩු වලින් එක් පුරප්පාඩුවක් පිරවී ඇති බවත්, තව එක් පුරප්පාඩුවක් පිරවීම සදහා ඇති බවත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා විමසූ ප්‍රශ්නයට පිළිතුරු ලෙස මෙය ප්‍රකාශ කරන බව සදහන් කරන ලදි.එසේම හැමදාම සභාවේ වාඩිවී සභා වාර්තාවේ අඩුපාඩු කතා කිරීම සිදු නොවේවි යැයි සිතුවාට හැමදාම එය සිදුවන බව ප්‍රකාශ කරන ලදි.සභාවේ නාම ලේඛනය ගැන විමසිලිමත් වීම ගැන පුෂ්පකුමාර මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදි.සභාවේ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය සම්බන්ධව විමසිලිමත් වීම අප සැමගේම වගකීමක් බවත් , සභා වාර්තාවේ සිදු වී තිබෙන අඩුපාඩුව සම්බන්ධව කණගාටුවට පත්වන බවත් ප්‍රකාශ කරන ලදි.මේ පිලිබදව පරිශීලනය කිරීමට සභාපතිතුමාට වේලාවක් නොතිබෙන්නට ඇති බවත්, නමුත් ඉදිරියේදීවත් මේ නාම ලේඛනය සම්බන්ධව ලේකම්තුමිය ඔබතුමිය සොයා බලන ලෙසත් ප්‍රකාශ කරන ලදි.ඔබතුමියත් කාර්ය බහුල වනවා ඇති නමුත් මෙම වාර්තාවට අත්සන් තැබීමට පෙර ඒ පිළිබදව සැලකිලිමත්වන ලෙස ඉල්ලා සිටින ලදි.මන්ත්‍රීවරුන්ගේ පැමිණීම පිටවීම පිළිබඳ සටහන් කිරීමේදී සැලකිලිමත්ව වගකීමකින් කටයුතු කිරීම සිදුවිය යුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්.කරුණාසේන දයාතිලක මයා විසින් සංශෝධන සහිතව සභා වාර්තාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සභා වාර්තාව සම්මත විය.**

**03.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - නැත**

**04.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන -**

**පලාත් පාලන ආයතන වල වරිපනම් බදු කාර්ය සදහා දේපල තක්සේරු කිරීම සම්බන්ධ ලිපි සභාගත කරන ලදි.**

උළ්ළූරාට්චිත් තිණෛක්කළම්
කිழக்கு மாகாணம்
පළාත් පාලන දෙපාර්තමේන්තුව
නැගෙනහිර පළාත
DEPARTMENT OF LOCAL GOVERNMENT
EASTERN PROVINCE

කාර්යාලය Office 026-2223087
කොමසාරිස් Commissioner 026-2220074
ෆැක්ස් Fax 026-2220075
ඊ-මේල් E-mail clg@ep.gov.lk

මගේ අංකය My No. EP/14/LEGAL/GEN/2022 | ඔබේ අංකය Your No. | Date : 2022.05.19

ප්‍රාදේශීය සභා කාර්යාලය 24 MAY 2022

ප්‍රාදේශීය සභාව,
උහන.

**පළාත් පාලන ආයතන වල වරිපනම් බදු කාර්යය සඳහා දේපළ තක්සේරු කිරීම**

උක්ත කරුණ සම්බන්ධව පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ අංක. PL/6/8/ප.පා/තක්සේරු දරණ 2022 අප්‍රේල් මස ලිපිය හා බැදේ. (ලිපියේ පිටපත අමුණා ඇත)

02. ඒ අනුව, මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව තුළ තක්සේරුකරුවන්ගේ හිඟයක් පවතින බැවින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධි ලබා සිටින උපාධිධාරින් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන පළාත් පාලන ආයතන වල තක්සේරු කටයුතු නිමකර ගත හැකි බව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක. RAD/RA.SP.A/පොදු හා 2022.03.03 දිනැති ලිපිය මගින් දැනුම්දී ඇති බව සඳහන් කර ඇත.

03. එසේම, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක. VD/DCV(S)/2022/01 හා 2022.03.29 වන දිනැති පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය හැදෑරූ උපාධිධාරින් 28ක් යොදවා තක්සේරු කටයුතු නිමකර ගත හැකි පළාත් පාලන ආයතන වල ලේඛණයක් යොමු කර ඇත. එම ලේඛණයෙන් ඔබ ප්‍රාදේශීය සභාව වෙතද දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධි ලබා සිටින උපාධිධාරින් දෙදෙනකු ලබාදීමට යෝජනා වී ඇත.

03. ඒ අනුව, දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය හැදෑරූ උපාධිධාරින් වෙත දිනකට රු.2000/= ක දීමනාවක් හා සමීක්ෂණ වල යෙදෙන තක්සේරු නිළධාරින් මෙම කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා එක් දේපලකට රු.60/=ක දීමනාවක් ගෙවීමට එකඟවී ඇත. එබැවින් මෙම ගෙවීම් සිදු කිරීම සඳහා ඔබ ප්‍රාදේශීය සභාවේ සභා අනුමැතිය ලබාගෙන, තක්සේරු කරනු ලබන දේපල පිළිබඳව තොරතුරු සමඟ එම උපාධිධාරින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වී අවශ්‍ය ඉදිරි කටයුතු නොපමාව සිදු කිරීමට කටයුතු කරගන්නා ලෙසත් ඒ පිළිබඳව මා දැනුවත් කරන ලෙසත් දන්වා සිටිමි.

එන්. මනිවන්නන්,
පළාත් පාලන කොමසාරිස්,
නැගෙනහිර පළාත

පිටපත්-

01. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය , කොළඹ - කරු.දැ.ස
02. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, නැ.ප - කරු.දැ.ස

Department of Local Government
Kanniya Road
Varodaya Nagar

| | | |
|---|---|---|
| அலுவலகம் / කාර්යාලය / Office — 026-2223087 | உள்ளூராட்சித் திணைக்களம் / கிழக்கு மாகாணம் / පළාත් පාලන දෙපාර්තමේන්තුව / නැගෙනහිර පළාත / DEPARTMENT OF LOCAL GOVERNMENT / EASTERN PROVINCE | தொலைநகல் / ෆැක්ස් / Fax — 026-2220075 |
| ஆணையாளர் / කොමසාරිස් / Commissioner — 026-2220074 | | மின்னஞ்சல் / ඊ-ලිපිනය / E-mail — clg@ep.gov.lk |
| எனது இல. / මගේ අංකය / My No. — EP/14/LEGAL/GEN/2022 | உமது இல. / ඔබේ අංකය / Your No. | Date : 2022.06.16 |

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
උහන.

**<u>පළාත් පාලන ආයතන වල වරිපනම් බදු කාර්යය සඳහා දේපළ තක්සේරු කිරිම</u>**

උක්ත කරුණ සම්බන්ධව පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යංශයේ අංක. PL/6/8/ප.පා/තක්සේරු දරණ 2022.05.23 වන දිනැති ලිපිය හා මාගේ සමාංක දරණ 2022.05.19 වන දිනැති ලිපි හා බැඳේ. (ලිපියේ පිටපත අමුණා ඇත)

02. ඒ අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන පළාත් පාලන ආයතන වල තක්සේරු කටයුතු නිමකර ගැනිමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔබ වෙත ඉහත ලිපි මගින් දන්වා ඇති අතර ඒ පිළිබඳව මේ වන විට ඔබ විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව වාර්ථාවක් කඩිනමින් මා වෙත යොමු කරන ලෙස දන්වා සිටිමි.

**එන්. මනිවන්නන්,**
පළාත් පාලන කොමසාරිස්,
නැගෙනහිර පළාත

පිටපත්-

01. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය , කොළඹ - කරු.දැ.ස
02. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, නැ.ප - කරු.දැ.ස

Department of Local Government
Kanniya Road
Varodava Nagar

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා -

**යෝජනා අංක 06/2022/09(01)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වන උප වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2022 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2022 වර්ෂයේ ආදායම මෙහි පහත උප ලේඛනයේහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2023 මාර්තු 31 දිනට ප්‍රථම උහන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි තීරණය කරමි.

ඉහත කී උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
|---|---|
| 2022 වර්ෂයේදී ආදායම | රු. ශත. |
| රු. 6000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු. 6000 ඉක්මවන එහෙත් රු. 12000 නොඉක්මවන අවස්ථාවක | රු. 90.00 |
| රු. 12000 ඉක්මවන නමුත් රු. 18750 නොඉක්මවන අවස්ථාවක | රු. 180.00 |
| රු. 18750 ඉක්මවන නමුත් රු. 75000 නොඉක්මවන අවස්ථාවක | රු. 360.00 |
| රු. 75000 ඉක්මවන නමුත් රු. 150000 නොඉක්මවන අවස්ථාවක | රු. 1200.00 |
| රු. 150000 ඉක්මවන අවස්ථාවක | රු. 3000.00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්. ලාල් ජයන්තසිරි මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(02)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළව වරිපනම් පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

(අ) 1987අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් උහන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුකල ප්‍රදේශය ඇතුලත පිහිටි සියලුම නිවාස වල, ගොඩනැගිලි වල, ඉඩම්වල, ගෙපත්වල 2023 වාර්ෂික වටිනාකම සඳහා 2007 වර්ෂයේ තක්සේරු කරනු ලදුව 2022 වර්ෂයේදී පිළිගෙන ක්‍රියාත්මක කරන ලද වාර්ෂික වටිනාකම 2023 වර්ෂයේ පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 10% ක වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (6) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුලදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙසද, බද්දට යටත් වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට උහන ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්.කරුණාසේන දයාතිලක මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(03)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය හා 151 වගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්ති යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා උහන ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2023 මාර්තු 31 දිනට ප්‍රථම උහන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි තීරණය කරමි.

| 1 වන තීරය | 11 වන තීරය |
|---|---|
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම |

| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|
| ***අන්තරාදායක ව්‍යාපාර*** | | | |
| කබොක් ගල්, බොරළු ගල් කළු ගල් කැණීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඉන්ධන පිරවුම් හල් | 500.00 | 750.00 | 1000.00 |
| වැලි ගොඩ දැමීමේ හා අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බොරළු පස් කැණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යාන්ත්‍රික ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යාන්ත්‍රික නොවන ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පාපැදි හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ධාන්‍ය එක්රැස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| බලය දෙනු ලබන කාර්යය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| වාහන විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රානුසාරයෙන් කළු ගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගඩොල් හෝ උළු නිපදවීම හා පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කාබනික පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හා අළෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| දුම් කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම හා අළෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| යන්ත්‍රානුසාරයෙන් කෝපි ධාන්‍ය වර්ග මාංශ භෝග කුළු බඩු හෝ පිටි ඇඹරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| පස් කැණීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගෑස් අළෙවිය හා බෙදා හැරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යාන්ත්‍රිකව වැලි සේදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඉන්ධන පිරවුම්හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පෙරමුසු කොන්ක්‍රීට් ස්ථානයක් පවත්වාගෙන යාම (කාපට්) | | | |
| විද්‍යුත් ලෝහ ආලේපන කරන ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| බැටරි චාර්ජ් කිරීමේ හෝ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මෝටර් වාහන සේවා කිරීම හෝ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලි බලය පාවිච්චි කර වී කෙටීම හෝ සහල් පාහින මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 1. අශ්ව බල 01 සිට 10 දක්වා<br>2. අශ්ව බල 10 සිට 20 දක්වා<br>3. අශ්ව බල 20 ට වැඩි | 500.00<br>500.00<br>500.00 | 750.00<br>750.00<br>750.00 | 1000.00<br>1000.00<br>1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| ඉන්ධන භාවිතා කර වී කෙටීම හෝ සහල් පෑහීමේ මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 1. අශ්ව බල 01 සිට 10 දක්වා<br>2. අශ්ව බල 10 සිට 20 දක්වා<br>3. අශ්ව බල 20 ට වැඩි | 500.00<br>500.00<br>500.00 | 750.00<br>750.00<br>750.00 | 1000.00<br>1000.00<br>1000.00 |
| දැව නොවන ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| වෑල්ඩින් වැඩපලක් පවත්වා ගෙන යාමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ග්‍රෝස් 10ට වැඩි ප්‍රමාණයක් ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඇසිඩ් වර්ග හා ස්ප්‍රීත්තු වර්ග ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| සිසිල් බීම නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| අයිස් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| එළවළු තෙල් හෝ පොල් තෙල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| කොහු හෝ වෙනත් කෙදි වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| කොහු හෝ වෙනත් කෙදි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ,ආයුධ, උපකරණ නිපදවීම) | 500.00 | 750.00 | 1000.00 |
| මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පුපුරණ ද්‍රව්‍යන් , පුපුරණ බෙහෙත් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| ***පීඩාකාරී ව්‍යාපාර*** | | | |
| මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |

| | | | |
|---|---|---|---|
| 1. එළු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම<br>2. කුකුල් මස් විකිණීමේ ස්ථානයක් වත්වාගෙන යාම<br>3. ඌරු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම<br>4. ගව මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00<br>500.00<br>500.00<br>500.00 | 750.00<br>750.00<br>750.00<br>750.00 | 1000.00<br>1000.00<br>1000.00<br>1000.00 |
| කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුකුල් ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම හෝ එම භාණ්ඩ පමණක් විකිණීමට තබා ඇති ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුලු කෑම හා ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| කරවල, ලුණු මාළු ජාඩි ගබඩා කර තබා ගැනිම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| බිත්තර විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බැටළුවන්,කුකුළන්, ඌරන්, එළුවන්, හා එළ ගවයන් 25ට වැඩි ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුකුළන් හා කිකිළියන් 100කට වැඩි ගණනක් සඳහා ගාලක් හෝ කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| සත්ව ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| සබන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| ලෝහ සුන්බුන් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| ගෘහ භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| වේවැල් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| සිරප් හෝ පලතුරු බීම නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| රස කැවිලි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම) | 500.00 | 750.00 | 1000.00 |
| රා එකතු කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| විනාකිරි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| දැව ඉදිරීම | 500.00 | 750.00 | 1000.00 |
| පින්තාරු තීන්ත , වානිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| සෝඩා නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| පළතුරු,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරී | 500.00 | 750.00 | 1000.00 |
| කෝපි , ධාන්‍ය වර්ග පිටි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| බේකින් පවුඩර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ලී භාණ්ඩ සඳහා වූ පොටි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| කපුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| රෙදිසෝදන නිල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| සුවඳ විලවුන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| පාසල් රටහුණු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් හෝ ටියුබ් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් නැවත පිරවීම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටර් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| වැලි කඩදාසි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ගඩොල් පිළිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500.00 | 750.00 | 1000.00 |
| උළු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| නිමි ඇදුම් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| කුකුළු වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විෂබීජ නාෂක නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර්/ටියුබ්/අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| සපත්තු බෑග් /සම්/ භාණ්ඩ නිෂ්පාදන කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| සිගරට්,බීඩි,සුරුට්ටු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| බලය දෙනු ලබන කාර්යය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| ***වෙනත්*** | | | |
| බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| බත් කඩයක්/හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| තේ,කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| එළවළු හා පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| රස කැවිලි වර්ග නිෂ්පාදනය ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බේකරි නිෂ්පාදන අලෙවි කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කිරි එකතු කිරීමේ, ශීත කිරීමේ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුළු බඩු පැකට් කිරීම හා අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| අයිස් ක්‍රීම්, යෝගට් ආදී ශීතකරණ ලද ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| බිම්මල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පපඩම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මී කිරි, පස්ගෝ රස නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| පළතුරු යුෂ නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු , කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| ඩ්‍රයික්ලීන් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| තෙල් හෝ සත්ව මේදය නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වාඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| කෘමි නාශක, දිලීර නාශක,පැළෑටි හෝ පළිබොධ නාශක නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| විෂබීජ නාශක නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| මදුරු දඟර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| වීදුරු භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| කැඩපත් , වීදුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| යකඩ තහඩු ගැල්වනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| වායු සමීකරණ යන්ත්‍ර , ශිතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රෝපකරණ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලි භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ඉලෙක්ට්‍රොනික උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| වී මෝල් | 500.00 | 750.00 | 1000.00 |
| මීනි පෙට්ටි තැනීම | 500.00 | 750.00 | 1000.00 |
| දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| අවමංගල්‍ය සේවා මධ්‍යස්ථානය (මල් ශාලාව) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්. ලාල් ජයන්තසිරි මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(04)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් හා 151 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි 1 තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයිද,

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (3) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත 2023 මාර්තු 31 දිනට පෙර උහන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි තීරණය කරමි.

ඉහත කී උපලේඛනය

| I වන තීරය | II වන තීරය | | |
|---|---|---|---|
| කර්මාන්තය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| පාවහන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| වීදුරු ආශ්‍රිත නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පොල්තෙල් නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| සබන්, සුවඳ විලවුන් නිෂ්පාදනය හා අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඉටිපන්දම් වර්ග නිෂ්පාදනය, විකිණීම හා ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් වඩු වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ප්ලාස්ටික්, ෆයිබර් ආශ්‍රිත වැඩපලක් හෝ කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |

| I වන තීරය | II වන තීරය | | |
|---|---|---|---|
| කර්මාන්තය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| ලොරිබොඩි සාදන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කඩදාසි බෑග් නිෂ්පාදනය හා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුෂන් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මෙට්ට නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| විද්‍යුත් ලෝහාලෝපණය කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| මෝටර් වාහන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම, සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලිකර්මාන්ත වැඩපලක් හෝ කැසට් රේඩියෝ රූපවාහිණී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කොහු හෝ වෙනත් කෙදි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රෝපකරණ භාවිතා කරන ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් හෝ ටියුබ් වොල්කනයිසින් කිරීම හා ටයර් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බ්ලොක් ගල් හා සිමෙන්ති ආශ්‍රිත නිශ්පාදන හා අළෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| ඉහත සඳහන් නොවන වෙනත් ව්‍යාපාරයක් | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්.කරුණාසේන දයාතිලක මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(05)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේදී පහත උප ලේඛනයෙහි I තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා අය කුළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තියේ (3) උප වගන්තිය ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත 2023 මාර්තු 31 දිනට පෙර ගෙවිය යුතු යැයි ද යෝජනා කරමි.

උපලේඛණය

| I තීරුව | II තීරුව |
|---|---|
| | රු. ශත. |
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| (අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |

| | |
|---|---|
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| සෑම ඇතෙකු සඳහා | 50.00 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උප ලේඛනයෙහි වෙළඳ කාර්යන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී පී.ඒ. ඉමාලි සන්ධ්‍යා මිය විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(06)**

## 01. උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළව පෝරම, සහතික පත්‍ර නිකුත් කිරීමේ හා සේවා ගාස්තු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය සඳහා පහත දක්වා ඇති පෝරම, සහතික පත්‍ර නිකුත් කිරීමේ හා සේවා සඳහා පහත අනුරූප සටහනෙහි නිරූපිත ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

01. වීථි රේඛා සහතික නොපවරා ගැනීමේ සහතික පෝරම ගාස්තු — රු. 250.00
02. වීථි රේඛා සහතික නොපවරා ගැනීමේ, සහතික පරීක්ෂා කිරීමේ ගාස්තු — රු. 3000.00
03. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු — රු. 300.00
04. ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීමේ ගාස්තු

| විශාලත්වය | නේවාසික | වාණිජ |
|---|---|---|
| වර්ග අඩි 500 ට අඩු | රු. **1000.00** | රු. **2000.00** |
| වර්ග අඩි 501 සිට 800 දක්වා | රු. **2000.00** | රු. **3500.00** |
| වර්ග අඩි 801 සිට 1000 දක්වා | රු. **2500.00** | රු. **4500.00** |
| වර්ග අඩි 1001 සිට 1500 දක්වා | රු. **3500.00** | රු. **5500.00** |
| වර්ග අඩි 1501 සිට 2000 දක්වා | රු. **4500.00** | රු. **6000.00** |
| වර්ග අඩි 2001 සිට 2500 දක්වා | රු. **5500.00** | රු. **7500.00** |
| වර්ග අඩි 2501 සිට 3000 දක්වා | රු. **6500.00** | රු. **8500.00** |
| වර්ග අඩි 3000 ට වැඩි | රු. **7500.00** | රු. **9800.00** |

තාප්පයක් සඳහා දික් අඩි 01 කට රු. **100.00** රු. **200.00**

05. සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීම සඳහා ගාස්තු
    0m සිට 20m දක්වා රු. 50000.00
    20m සිට වැඩි වන සෑම 1m සඳහාම රු. 10000.00
06. අනුකූලතා සහතිකයක් සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු රු. **3000.00**
07. සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු රු. 2500.00
08. ගොඩනැගිලි ඉදිකිරීම පෙරසැරි ගාස්තුව

| ගෙබිමේ විශාලත්වය | පදිංචිය සඳහා එක් වර්ග මීටරයක් රු. | වාණිජ හෝ වෙනත් රු. |
|---|---|---|
| 45 අඩු | 10.00 | 50.00 |
| 45-90 | 25.00 | 100.00 |
| 91-180 | 50.00 | 200.00 |
| 181-270 | 200.00 | 500.00 |
| 271-450 | 500.00 | 750.00 |
| 451-675 | 750.00 | 1000.00 |
| 676-900 | 1000.00 | 1250.00 |
| 900 ට වැඩි | 1000.00 | 1250.00 |
| | වර්ග මීටර 90 ක් වන එක් එක් එක් ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 50 බැගින් | අමතර වර්ග මීටර 90 ක් වන එක් ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 50 බැගින් |

09. ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු

| ඉදිකිරීම් අදියර | නේවාසික වර්ග මීටර 01 | වාණිජ වර්ග මීටර 01 |
|---|---|---|
| 1. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කොට ඇති විට (කයිරු මට්ටම) | **100.00** | **200.00** |
| 2. වහල මට්ටම දක්වා ඉදිකොට ඇති (වහලය රහිතව) | **70.00** | **120.00** |
| 3. වහලය ඇතුළුව ඉදි කොට ඇති විට | 80.00 | 140.00 |
| 4. සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට | 100.00 | 160.00 |
| 5. මහල් නිවාස සඳහා (එක් මහලකට) | 100.00 | 160.00 |
| 6. තාප්පය සඳහා (දික් අඩියකට) | 100.00 | 200.00 |

01. පරිසර බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු රු. 250.00
02. පරිසර බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර රු. 100.00
03. පරිසර බලපත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු රු. 2000.00
04. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු රු. 4000.00
05. දීර්ඝ කාලීන බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 300.00
06. දීර්ඝ කාලීන බලපත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු රු. 1500.00

07. වාර්ෂිකව ත්‍රී රෝද රථ ගාල්කිරීමේ ගාස්තු රු 1000.00
08. බයිසිකල් තහඩු සඳහා සේවා ගාස්තු රු 50.00
09. සුනඛයින් එන්නත් කිරීමේ සේවා ගාස්තු රු 100.00
10. පුස්තකාල පෝරම ගාස්තු (පාසල් ළමුන් සඳහා) රු 50.00
11. පුස්තකාල පෝරම ගාස්තු (වැඩිහිටියන් සඳහා) රු 50.00
12. වරිපනම් නාම සංශෝධන පෝරම ගාස්තු රු 200.00
13. පුස්තකාල ඇප තැන්පත් ගාස්තු (පාසල් ළමුන් සඳහා) රු 100.00
14. පුස්තකාල ඇප තැන්පත් ගාස්තු (වැඩිහිටියන් සඳහා) රු 300.00
15. භූමිය කුලියට දීම රු 2000.00

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(07)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය, සවි කිරීම සඳහා ගාස්තු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය සඳහා පහත දක්වා ඇති දැන්වීම් පුවරු ප්‍රදර්ශනය, සවි කිරීම හා ජංගම ප්‍රදර්ශනය සඳහා පහත අනුරූප සටහනෙහි නිරූපිත ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

බැනර්, පෝස්ටර්,කටවුට් සඳහා වර්ග අඩියකට ගාස්තු

| I වන තීරය | II වන තීරය | | | |
|---|---|---|---|---|
| | මාසයකට හෝ ඉන් කොටසක් සඳහා | | ලිත් වර්ෂයක් සඳහා | |
| | එක පැත්ත | දෙපැත්ත | එක පැත්ත | දෙපැත්ත |
| බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීම් සඳහා (වර්ග අඩියකට විදුලිය රහිත) | 50.00 | 100.00 | 150.00 | 200.00 |
| ලෑල්ලක් ආධාරයෙන් හෝ බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීම් සඳහා (වර්ග අඩියකට විදුලිය රහිත) | 50.00 | 75.00 | 150.00 | 200.00 |
| බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක් ආධාරයෙන් හෝ බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීම් සඳහා (වර්ග අඩියකට විදුලිය සහිත) | 75.00 | 150.00 | 175.00 | 250.00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්. ලාල් ජයන්තසිරි මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

යෝජනා අංක **06/2022/09(08)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළව විවිධ ගාස්තු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

අවුරුදු උත්සව අවස්ථා හා තාවකාලික වෙළඳසැල් වලින් 2023 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස 31ක් වන දින දක්වා කාලය තුළ උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන I හි සඳහන් ගාස්තු ද සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන සන්දර්ශන සඳහා පහත උපලේඛන II හි සඳහන් ගාස්තු ද අය කරන බව මෙයින් යෝජනා කරනු ලැබේ.

### උපලේඛන I

ජංගම වෙළඳාම හා ජංගම අළෙවි ප්‍රවර්ධනය හා තාවකාලික වෙළඳාම - (උපරිම දින පහක් පමණී) පහත අයිතමයන් සඳහා අය කරනු ලැබේ.

01. වාහන සඳහා එක් දිනකට රු. 2500.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
02. ලීබඩු උපකරණ/විදුලි උපකරණ එක් දිනකට රු. 1500.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
03. ආහාර පාරිභෝගික ද්‍රව්‍ය එක් දිනකට රු. 1000.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
04. (කිරි,යෝගට්,බීම වර්ග,රෙදිපිළි හා කාපට්, බෑග්,සෙරෙප්පු සපත්තු,මල් පැල, ප්ලාස්ටික් හා ඇළුමිනියම් උපකරණ ආදිය)
05. නෂ්‍ය භාණ්ඩ (එළවළු හා පළතුරු) සහ පාසල් උපකරණ, පොත්පත් සඳහා එක් දිනකට රු. 500.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
06. සන්නිවේදන කටයුතු හා ආයතන ප්‍රවර්ධන කටයුතු එක් දිනකට රු. 2000.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
07. වෙනත් - වර්ග අඩියක් සඳහා දිනකට රු. 50.00

### උපලේඛන II

01. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල තාවකාලික වෙළඳාම සඳහා සතියකට රු. 300.00

### උපලේඛන III

1. තාවකාලික චිත්‍රපට දර්ශන, සර්කර්ස් දර්ශන, මැජික් සන්දර්ශන වෙනත් යම් සන්දර්ශනයක් සඳහා ප්‍රවේශ පත්‍ර වලින් 25% විනෝද බදු
2. සංගීත සන්දර්ශනයක් සඳහා ප්‍රවේශ පත්‍ර වලින් 25% විනෝද බදු

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඊ.ආර්. සුමනාවති මිය විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(09)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ වාහන වල පාලනය හා ධාවනය හා බර පාලනය කිරීම සඳහා ගාස්තු අය කිරීමේ යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයෙහි ............ මස .......... දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**<u>උපලේඛනය</u>**

01. ගල්, වැලි ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය, පස්, වෙනත් ඛනිජ ද්‍රව්‍ය, රබර් ආශ්‍රිත නිෂ්පාදන.
කාලය පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා

| | | රු: ශත |
|---|---|---|
| (I) | ට්‍රැක්ටර් ලෝඩ් එකක් ගමන් වාරයක් සඳහා | රු:- 100.00 |
| (II) | කියුබ් එකක වාහනයක් එක් ගමන් වාරයක් සඳහා | රු:- 100.00 |
| (III) | ලොරි,ටිපර්,ට්‍රක් රථයක් සඳහා එක් වාරයක් සඳහා | රු:- 300.00 |

02. දර, උණ දඬු හා දැව කඳන් ප්‍රවාහනය

| | |
|---|---|
| ට්‍රැක්ටරයක් සඳහා එක් ගමන් වාරයකට | රු. 100.00 |
| ලොරි, ටිපර්,ට්‍රක් රථයක් එක් ගමන් වාරයකට | රු. 200.00 |
| ඇතුන් ලවා දැව කඳන් ඇද්දවීම, එක් දිනකට | රු. 500.00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්. කරුණාසේන දයාතිලක මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(10)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ සති පොළ ගාස්තු අය කිරීමේ යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සති පොළෙහි 2023 වර්ෂය වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි බදු අය කිරීමට 2022 වර්ෂයෙහි .......... මස ............. දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | ස්ථිර කඩ කාමරයක් සඳහා | රු. | 200.00 |
| 02. | තාවකාලික කඩ කාමරයක් සඳහා අවම ගාස්තු අය කිරීම (වර්ග අඩි 2x2) | රු. | 50.00 |
| 03. | තාවකාලික කඩ කාමරයක් සඳහා වර්ග අඩි 2x2 සිට වැඩි වන සෑම වර්ග අඩියකට | රු. | 5.00 |
| 04. | වෙළඳ ලොරියක් සඳහා | රු. | 200.00 |
| 05. | වෙළඳ වෑන් රථයක් ත්‍රී රෝද රථයක් සඳහා | රු. | 150.00 |
| 06. | මාළු ලෑල්ලක් සඳහා | රු. | 500.00 |
| 07. | සති පොළේ/භූමියේ වෙළඳාම් නොකරන සියලුම වාහන ගාල් කිරීම සඳහා (සතිපොළ භූමිය අවහිරවීම පිළිබඳ මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ) | රු. | 500.00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්. කරුණාසේන දයාතිලක මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

යෝජනා අංක **06/2022/09(11)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීමේ යෝජනාව

### ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බල ප්‍රදේශය තුල යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 2023 වර්ෂය සඳහා උහන ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කේ. තරිඳු තුෂාන් මයා විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

යෝජනා අංක **06/2022/09(12)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වාහන කුලියට දීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයෙහි .............. මස .......... දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් මිල ගණන් යටතේ වාහන කුලියට දීම ගැසට් පත්‍රයේ පළ කිරීමට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| | | |
|---|---|---|
| 01. ටොන් 01 ගල්රෝල දිනකට<br>රැඳවීම් ගාස්තු දිනකට (රු. **1**,000.00) | රු. | **6**,000.00 |
| 02. ටොන් 08 ගල්රෝල පැයකට<br>(නවතා තැබීමේ ගාස්තු 50% දිනකට අවම පැය 04) | රු. | 5,500.00 |
| 03. ටොන් 12 ගල්රෝල පැයකට<br>(රැඳවීම් ගාස්තු 50% දිනකට අවම පැය 04) | රු. | 12,000.00 |
| 04. JCB යන්ත්‍රය පැයකට කුලියට දීම (දිනකට අවම පැය 02) | රු. | 7,000.00 |
| 05. මෝටර් ග්‍රේඩරය පැයකට කුලියට දීම<br>(දිනකට අවම පැය 04) | රු. | 10,000.00 |
| 06. ජල බවුසර 01 ක් සඳහා (ජල ගාස්තු හැර) | රු. | 1,000.00 |
| 07. ට්‍රැක්ටරය දිනකට කුලියට දීම | රු. | 7.500.00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඊ.ආර්. සුමනාවති මිය විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(13)**

## උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා රැස්වීම් ශාලාව කුලියට දීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව

1989 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයෙහි ............ මස ............ දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| 1වන තීරුව | 11 වන තීරුව | |
|---|---|---|
| | රු. | ශත |
| 01. රැස්වීම් ශාලාව එක් දිනකට කුලියට දීමේ ගාස්තු | 3,000. | 00 |
| 02. ශබ්ද විකාශන යන්ත්‍ර අවශ්‍ය වූ විට (1ක් දිනකට) | 1,500. | 00 |

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී පී.ඒ. ඉමාලි සන්ධ්‍යා මිය විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(14)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් 2023 පලාත් පාලන ආයතන වල වරිපනම් බදු කාර්ය සඳහා දේපල තක්සේරු කිරීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කලමනාකරණය හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් දෙදෙනෙක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලෙස පලාත්පාලන කොමසාරිස් විසින් දැනුම් දී ඇත .ඒ අනුව උපාධිධාරීන් වෙත දිනකට රු.2000.00 ක දීමනාවක් හා එක් දේපලකට රු.60.00 ක දීමනාවක් ගෙවීමට දන්වා ඇත. ඉහත කරුණු සම්බන්ධයෙන් සභා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා විසින් ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

2006 වර්ෂයේ දී පමණ දේපල තක්සේරු කිරීම සඳහා රජයෙන් නිළධාරීන් එවූ බවත් , නමුත් රජයේ වැටුපට අමතරව එම නිළධාරීන්ටත් සභාවෙන් ගෙවීම් කල බවත් පෙන්වා දෙන ලදි.එසේම කෑමබීම හා නවාතැන් පහසුකම් ද සලසාදුන් බව පැහැදිලි කරන ලදි.දැනට වසර දහයකදී පමණ සිට මේ තක්සේරුව සිදු නොකරන ලද බවත් , තට්ටු තුනේ ගොඩනැගිල්ලට තවම රු.100.00 ක් අය කිරීම කරන බවත් , පෙන්වා දෙන ලදි.වරිපනම් ලබා ගැනීමට නොහැකිවී ඇති බවත් , වරිපනම් දායකයින් තවම සිටින්නේ 1200 ගණනක් පමණක් බවත් , අපේක්ෂිත ආදායම 1200000.00 බවත් එතනින් එහාට එය හෙලවෙන්නේ නැති බවත් , එම මුදලින් 50% අඩුවෙන් සභාවට ආදායම ලැබෙන බවත් පෙන්වා දෙන ලදි.ඒ අනුව බැලීමේදී මෙය ඉතාම හොද අවස්ථාවක් බවත් , එසේම එම නිළධාරීට අනෙක් පහසුකම් ටික ලබා දියයුතු දැයි විමසන ලදි.නවාතැන් පහසුකම් ඉල්ලා සිටියොත් ඒ සඳහා ස්ථානයක් ලබාදිය යුතු බවද පෙන්වා දෙන ලදි.මෙය සිදු කල හොත් රු. 1200000.00 යේ තිබෙන අපේක්ෂිත ආදායම රු.2500000.00 දක්වා පමණ යාහැකි බවද පැහැදිලි කරන ලදි. පිරිමි නිළධාරීන් දෙදෙනෙක් බඳවා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදි.කාන්තා නිළධාරීන් බඳවා ගත්විට පහසුකම් සැලසීම කරදර බැවින් පිරිමි නිළධාරීන් බඳවා ගන්නා

ලෙස ප්‍රකාශ කරන ලදි.එම නිළධාරීන්ට යතුරු පැදියක් ලබාදියයුතු වේවි බවත් , එම නිසා යතුරුපැදියක් සූදානම්කර තබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදි.වරිපනම් අපට ඕන ලෙස පැනවීම සිදුකිරීම නොහැකි බවත් , ප්‍රථමයෙන්ම වරිපනම් දැන්වීමක් පලකල යුතු බවත් , විරෝධතා තිබෙනම් ඒ සඳහා අවස්ථාව ලබාදියයුතු බවත් , ප්‍රකාශ කරන ලදි.අද අප විසින් වරිපනම් තක්සේරුවකට අවශ්‍යාය ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි. පුවත්පත් දැන්වීමක් මගින් එය කල හැකි බවත් , එසේ කිරීම වියදම් අධික නම් දැන්වීමක් මගින් දැනුම් දීම සිදුකල හැකි බවද ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

පත්තරේක පිටු භාගයක් පමණ අරගෙන වරිපනම් තක්සේරුව හා උහන හා වැරැන්කැටගොඩ කඩ කාමර ටෙන්ඩර් කිරීම යන සියල්ල එකට දැන්වීමක් ද දැමීමට අදහස් කරන බව ප්‍රකාශ කරන ලදි. එසේ සිදු නොකලොත් කඩ ටෙන්ඩර් කිරීම පිලිබද ප්‍රශ්නයක්ද පැන නගින බැවින් පත්තරේ දැන්වීම දැමීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ක්ෂේත්‍රය හදුනා දීම සඳහා ආදායම් පරීක්ෂකවරු දෙදෙනාද මේ සඳහා යෙදවිය යුතු බවත් , එවිට ඒ දෙදෙනාට වගකීමක් තිබෙන බැවින් , එම දෙදෙනාට පැහැදිලිව කොට්ඨාශ වෙන් කර දීම සිදුවිය යුතු බව ප්‍රකාශ කරන ලදි.කෙසේ හෝ මාස දෙකක් ඇතුලත මෙය සිදුවුව හොත් අයවැයේ අපේක්ෂිත ආදායම වැඩි කල හැකි බව පෙන්වා දෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.25 ගරු උප සභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා පැමිණෙන ලදි.

**ගරු සභාපතිතුමා.**

මේ සති දෙක ඇතුලත මාකට් එකේ කඩ ටික ටෙන්ඩර් කරන බවත් , උහන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් ඕනම කෙනෙකුට අයදුම් කල හැකි බව ප්‍රකාශ කරන ලදි.වැරැන්කැටගොඩ කඩ කාමර දෙකක් ඇති බවත් ඒවාද ටෙන්ඩර් කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

වැරැන්කැටගොඩ කඩ කාමර ගැන සඳහන් කිරීමේදී එක් කඩ කාමරයක් හැමදාම වසා ඇති බවත් , මේ සභාවට මුදල් පමණක් ගෙවුවාට ඇති වැඩක් නැති බවත් , ගිවිසුම අනුව ක්‍රියාත්මක විය යුතු බවත් පෙන්වා දෙන ලදි. ගිවිසුම උල්ලංගනය කර තිබෙන නිසා කඩය සීල් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු උප සභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා.**

වැරැන්කැටගොඩ කඩ කාමර ගැන කතා කිරීමේදී එම කඩ කාමර වල නඩත්තු කටයුතු සිදු නොවන බවත්, ඒ පිළිබඳ විශාල ලෙස දෝෂාරෝපන තිබෙන බවත්, ඉදිරිපස කාණු පද්ධතිය කැඩී ඇති බවත්, මමත් මේ පිළිබදව සභාපතිතුමා දැනුවත් කල බවත්, එය රු.10000.00 පමණ වැඩක් බවත් ප්‍රකාශ කරන ලදි. අපි ඒ කඩ වලින් මුදල් ලබා ගන්නා නිසා ඒවායේ නඩත්තු කටයුතු සිදුකර දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.හැකිතාක් ඉක්මනට ඒය සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා.**

උහන කඩ පේලියේ මීට සති දෙකකට පමණ ඉහතදී හොරු පැමින කඩයක් කඩා පරිප්පු මිටියක් රැගෙන ගොස් ඇති බවත් ,නමුත් එම කඩ පේලියේ ඉදිරිපස විදුලි ආලෝකය තිබුනා නම් ඒසේ නොවන්නට තිබූ බවත් , එම කඩ අයිති අයට හෝ කියා විදුලි ආලෝකයක් දමන්නට හැකියාව තිබේනම් ඉතා සුදුසු බව පෙන්වා දෙන ලදි.එසේම කනිටු විදුහලට යන මාර්ගයේ කානු පද්ධතිය අක්‍රිය වී ඇති බවත් , එයද සොයා බලන ලෙසත් ,ප්‍රකාශ කරන ලදි.කණිෂ්ට ලග ඉදන් එහාට වීදි ලාම්පු නොමැති බවත් ඒවාට වීථි ලාම්පු සවි

කිරීමට හැකිනම් ඉතා සුදුසු බව ද පෙන්වා දෙන ලදි.බස් හෝල්ට් එක ලගට වීථි ලාම්පුවක් දැමීමට හැකිනම් හොද බවද ,සවස් වන විට බස් හෝල්ට් එක ලගට යන්න මිනිස්සු බය බවත් ප්‍රකාශ කරන ලදි. එසේම පොදු වැසිකිලිය සම්බන්ධවත් විශේෂ අවධානයක් යොදවනවා නම් හොද යැයි ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

සතියකට වාරයක් පොදු වැසිකිලිය ශුද්ධපවිත්‍ර කරන බවත් ,නමුත් ඊලග සතියේ නැවත අර ආකාරයටම වීදුරු බෝතල් , ගඩොල් කැට ආදිය දමා වැසිකිලිය විනාශ කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

පොදු වැසිකිළිය සම්බන්ධව කටයුතු කිරීම සඳහා පුද්ගලයෙකු හමුවූ බවත් මේ සභාවේ ඉස්සර වැඩ කල සේවකයෙක් බවත් , ඔහු විසින් පොදු වැසිකිළිය භාර අරගෙන දිගටම නඩත්තු කරගෙන යාමට කැමති බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය.**

පොදු වැසිකිළිය ගැන කතා කිරීම නිසා මෙය ඉදිරිපත් කරන බවත් ගොනාගොල්ල කගරයත් ප්‍රධාන නගරයක් බවත් එහි පොදු වැසිකිලි පද්ධතියක් තිබෙන බවත් , නමුත් දැන් එය පාවිච්චි නොකරන බවත් , ඒ වැසිකිළි පද්ධතියත් නැවත පිළිසකර කර මහජනතාවට පරිභෝජනයට ගතහැකි වන ලෙස සකස් කරන්නේ නම් ඉතා හොඳ බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්.කරුණාසේන දයාතිලක මයා.**

කාණු පද්ධතිය ගැන කතා කිරීම නිසා මේ කාරණයත් ඔබතුමාට ඉදිරිපත් කලයුතු බවත් , රජගලතැන්න උළු කම්හල හන්දියේ කාණු පද්ධතියේ ප්ලේට් නොදා තිබෙන බවත් , එතන ආගමික ස්ථානයක් බැවින් මහ ජනතාව විශාල වශයෙන් ගැවසෙන ස්ථානයක් වී ඇති බවත් , පෝය දිනවල රාත්‍රියේ කිහිප දෙනෙක් එම කාණුවට වැටී තුවාල සිදුවී ඇති බවත් , එම නිසා ඒ ගැනත් අවධානය යොමු කර , ගතහැකි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

උහන නගරයේ හා වැරැන්කැටගොඩ අපේ කඩ පද්ධති ඉදිරිපිට ත් කාණු පද්ධතිය සකස් කිරීමට ඇති බවත් , හදිසියේම ප්ලේට් ගන්න පුළුවන් කමක් නැති බවත් ,ඒ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බවත් , කෙසේ හෝ සකස් කිරීමට බලාපොරොත්තු වන බවත් , මාර්ග සංවර්ධන අධිකාරියේ කැඩුණු ප්ලේට් ටිකක් තිබෙන බව පවසා ඇති බවත් , ඒවා හෝ රැගෙන විත් කාණු පද්ධතිය පිලිසකර කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.

**ඉහත වරිපනම් බදු සම්බන්ධ යෝජනාව සඳහා සභා අනුමැතිය ලබාදෙන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(15)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් 2023 වර්ෂය සඳහා උහන ප්‍රාදේශීය සභාවට කමිටු පත් කිරීමට හා කමිටුවල බලතල, වගකීම් හා කාර්යන් නියම කිරීම සඳහා පහත සඳහන් පරිදි යෝජනා කරන ලදී.

# 2023 වර්ෂය සඳහා කමිටු පත් කිරීම

## මුදල් හා ප්‍රතිපත්ති කමිටුව

| | | |
|---|---|---|
| 1 | ටී.පී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 2 | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 3 | ඩී.ඒ. දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4 | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5 | එන්.පී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6 | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7 | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8 | කේ.එච්. චමින්ද පුෂ්පකුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9 | ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්ණුදේව මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

## නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

| | | |
|---|---|---|
| 1 | ටී.පී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 2 | ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3 | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 4 | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5 | ඒ. ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6 | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7 | කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනි |
| 8 | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9 | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

## පරිසර කමිටුව

| | | |
|---|---|---|
| 1 | ටී.පී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 2 | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 3 | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4 | පී.ඒ. ඉමාලි සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මනිත්‍රිනි |
| 5 | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6 | පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7 | එල්.ආර්. චංද්‍රසේකර බංඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8 | ආර්.ඒ.ඩී. සිසිර සාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9 | ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස. මනිත්‍රිනි |

## කාර්මික සේවා කමිටුව

| | | |
|---|---|---|
| 1 | ටී.පී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 2 | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3 | ඊ.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මනිත්‍රිනි |
| 4 | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5 | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6 | එන්. අමරකීර්ති මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7 | ඒ.එන්. ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මනිත්‍රිනි |
| 8 | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මනිත්‍රිනි |
| 9 | ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්ණුදේව මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

## නිවාස හා ගොඩනැගිලි කමිටුව

| | | |
|---|---|---|
| 1 | ටී.ජී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 2 | ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3 | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4 | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස.මන්ත්‍රී |
| 5 | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6 | ඒ. ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7 | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8 | කේ.වී.ජී. නයනා කුමුදුනී මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 9 | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10 | පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය | ලේකම් ප්‍රා.ස. උහන. |
| 11 | සභා බල ප්‍රදේශය තුල අදාල වසම්වල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු | |
| 12 | උහන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අදාල ජනපද නිලධාරි | |
| 13 | උහන ප්‍රාදේශිය සභාවේ කාර්මික නිලධාරීන් | |

## ප්‍රසම්පාදන කමිටුව

| | | |
|---|---|---|
| 01 | ටී.ජී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 02 | පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය | ලේකම් ප්‍රා.ස. උහන. |
| 03 | යූ.අයි. රුළිගු මිය | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, උහන |
| 04 | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 05 | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 06 | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 07 | ඩබ්.එස්.ආර්. කුමාරි මිය | ප්‍ර. ක. සේවා නිලධාරි, ප්‍රා.ස., උහන |

## පුස්තකාල කමිටුව

| | | |
|---|---|---|
| 01 | ටී.ජී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 02 | පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය | ලේකම් ප්‍රා.ස. උහන. |
| 03 | ප්‍රජා සංවර්ධන නිලධාරි | ප්‍රා.ස.කොමසාරිස් කාර්යාලය අම්පාර |
| 04 | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 05 | කේ.එච්. චමින්ද පුෂ්පකුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 06 | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මනිත්‍රිනි |
| 07 | එල්.ඩබ්.එල්.ආර්.එල්.ලියනගේ මිය | සංවර්ධන නිලධාරී ප්‍රා.ස. උහන |

## අභ්‍යන්තර විගණන කමිටුව

| | | |
|---|---|---|
| 01 | එස්.එස්.කුසුමලතා මිය | මුදල් සහකාර |
| 02 | ඩබ්.එස්.ආර්. කුමාරි මිය | ප්‍ර. ක. සේවා නිලධාරි, |
| 03 | එන්.ඩබ්. ජයසේකර මිය<br>කාර්මික නිලධාරි | කාර්මික නිලධාරි |
| 04 | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 05 | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 06 | ඒ. ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 07 | කේ.වී.ජී. නයනා කුමුදුනී මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

**කසළ කළමනාකරණ කමිටුව**

| | | |
|---|---|---|
| 01 | පි.ඒ.අයි.අයි. මැණිකේ මෙය | ලේකම් ප්‍රා.ස. උහන. |
| 02 | ඩබ්.එස්.ආර්. කුමාරි මිය | ප්‍රධාන ක. සේවා නිලධාරි, |
| 03 | එන්.ඩබ්.ජයසේකර මිය | කාර්මික නිලධාරි |
| 04 | එම්.අයි.අබ්දුෂ් සලාම් මයා | කාර්මික නිලධාරි |
| 05 | පී.පී.ගයාන් පුෂ්ප කුමාර මයා | කාර්මික නිලධාරි |
| 06 | ආර්.පී.පී.ඒ.විජේසිංහ මිය | සංවර්ධන නිලධාරි |
| 07 | කේ.ඒ.සී.නිලංගනි පෙරේරා | සංවර්ධන නිලධාරි |

**කළමනාකරණ මෙහෙයුම් කමිටුව**

| | | |
|---|---|---|
| 01 | ටී.පී. උපුල් ප්‍රියන්ත මයා | ගරු සභාපති |
| 02 | පි.ඒ.අයි.අයි. මැණිකේ මෙය | ලේකම් ප්‍රා.ස. උහන |
| 03 | ඩබ්.එස්.ආර්. කුමාරි මිය | ප්‍රධාන ක. සේවා නිලධාරි, |
| 04 | එස්.එස්.කුසුමලතා මිය | මුදල් සහකාර |
| 05 | එන්.ඩබ්.ජයසේකර මිය | කාර්මික නිලධාරි |
| 06 | යු.පී.ඩී.උබේසිංහ මිය | සංවර්ධන නිලධාරි |
| 07 | එල්.ඩබ්.එල්.ආර්.එල්.ලියනගේ මිය | සංවර්ධන නිලධාරි |
| 08 | ඩබ්.ඩී.මහේෂිකා මිය | කළමනාකරණ සේවා නිලධාරි |
| 09 | ඊ.අයි.එම්.එදිරිසිංහ මිය | කළමනාකරණ සේවා නිලධාරි |

# කමිටුවල වගකීම් කාර්යය භාර්යය

## මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව

- සභාවේ මූල්‍ය තත්වය ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යාම අරමුණු වේ.
- සභාවේ වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබා දීම.
- මාසික ආදායම් වියදම් පරීක්ෂා කිරීම.
- ත්‍රෛමාසික අර්ධවාර්ෂික ගිණුම් පරීක්ෂා කිරීම සමාලෝචනය කිරිම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නව ආදායම් උත්පාදන ක්‍රම සොයා බැලීම යෝජනා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු
- කොන්ත්‍රාත් ඉදිකිරීම සම්බන්ධ පරීක්ෂා කිරීම, වාර්තා කිරීම,නිර්දේශ ඉදිරිපත් කිරීම.
- දෛනික ධාවන සටහන් පරීක්ෂා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- වියදම් අනුමත කිරීමේ සීමා නිර්දේශ කිරීම.
- හිඟ ආදායම් අයකිරීමට කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

## නිවාස සහ ප්‍රජා සංවර්ධනය කමිටුව

- නිවාස ප්‍රතිපත්ති සම්පාදනය කිරිම.
- ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම.
- අනවසර ඉදිකිරීම් පරීක්ෂා කිරීම අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- සභා පාරවල් හා වීථි ආදිය සම්බන්ධ සුදුසු ප්‍රතිපත්ති තීරණය කිරීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා පුස්තකාල සංවර්ධනය කිරීම.

## කාර්මික සේවා කමිටුව

- කර්මාන්ත සහ වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- කර්මාන්ත සහ වෙළඳ බදු පැනවීම නිර්දේශ කිරීම සහ යෝජනා කිරීම.

- මහජන සෞඛ්‍යයට අහිතකර වෙළදාම් කර්මාන්ත සම්බන්ධ සුදුසු තීරණ යෝජනා කිරීම නිර්දේශ කිරීම.
- වෙළද කර්මාන්ත සහ වෙනත් ගාස්තු නිර්දේශ කිරීම යෝජනා කිරීම.
- ස්වයං රැකියා උත්පාදන ක්‍රම යෝජනා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## පරිසරය හා පහසුකම් කමිටුව

- ප්‍රජා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම.
- ඩෙංගු,මැලේරියා වැනි බෝවන රෝග වැලැක්වීමට අවශ්‍ය කටයුතු කිරීම.
- බෝනොවන රෝග පාලනය
- බෝවන රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට දඩ මුදලක් නිර්දේශ කිරීම.
- කසළ කළමණාකරන කටයුතු
- වීථි ආලෝකකරණය,මංමාවත් පිරිසිදු කිරීම හා නගර අලංකරණය
- ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම.
- වන අලි ප්‍රශ්නය සඳහා විසදුම් සෙවීම

## අභ්‍යන්තර විගණන කමිටුව

- මාසික ලැබීම් හා ගෙවීම් පරික්ෂා කිරීම.
- වාහන හා ඉන්දන සැපයීම සම්බන්ධයෙන් කටයුතු පරික්ෂා කිරීම.
- වැඩබිම්හි ඉදිකිරීම් කටයුතු හා ඒ සම්බන්ධ කටයුතු පරීක්ෂා කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු හා ගබඩා අධීක්ෂණ කටයුතු

## පුස්තකාල කමිටුව

- සභාව සතු පුස්තකාල අධීක්ෂණය
- පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම
- පාඨක පිරිස වැඩි කිරීමට කටයුතු කිරීම
- පුස්තකාල සඳහා කාලීන අවශ්‍යතා හදුනා ගැනීම හා සභාව වෙත නිර්දේශ ලබා දීම

## කළමණාකරන මෙහෙයුම් කමිටුව

- ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර දැක්ම සදහා යාමට සැලසුම් කිරීම සංවිධානය කිරීම මෙහෙයවීම හා පාලනය කිරීමට සහය දැක්වීම
- සැලසුම් කාර්යයන් අධීක්ෂණය හා අඩුපාඩු පෙන්වාදීම
- අයවැය හා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළිබද පසු විපරම හා ඉහල කළමණාකාරීත්වය දැනුවත් කිරීම
- මානව සම්පත කළමණාකරනය

## කසළ කළමණාකරන කමිටුව

- **බල ප්‍රදේශය තුළ කසළ කළමනාකරණ කටයුතු**
- **කසළ තුළින් වන පරිසර හානි වැලැක්වීම**
- **කසළ සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීම**
- **කසළ කළමනාකරණය සම්බන්ධ නිර්දේශ සබාව වෙත ඉදිරිපත් කිරීම**

**<u>නිවාස හා ගොඩනැගිලි කමිටුව</u>**

- සභා බල ප්‍රදේශය තුළ නිවාස ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, නිර්දේශ ලබා දීම.
- සභා බල ප්‍රදේශය තුළ නිවාස ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, අනුමැතිය ලබා දීම.
- අනවසර ඉදිකිරීම් සම්බන්ධව ක්‍රියා මාර්ග ගැනීම.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී පී.ඒ. ඉමාලි සන්ධ්‍යා මිය විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(16)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් උහන ප්‍රාදේශිය සභාවේ විදුලි කාර්මික කටයුතු සිදු කරන හා සම්බන්ධ වන පහත සේවකයින් සඳහා ආරක්ෂාව වෙනුවෙන් පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණයක් ගැනීමට අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සහා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

01. ඒ. වික්‍රමරත්න මයා - ක්ෂේත්‍ර කම්කරු
02. ඩී.එම්. දිලාන් තනුජ මයා - රියදුරු
03. සුධීර සම්පත් මයා - බහුකාර්ය සංවර්ධන සහයක

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.50 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඒ.නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය පැමිණෙන ලදි.

**යෝජනා අංක 06/2022/09(17)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් උහන ප්‍රාදේශිය සභාවේ පරිගණක පුහුණුලාභී ලෙස කටයුතු කරන ආර්.එම්.නවින් සදීප බංඩාර යන අය සභාවේ පරිගණක කටයුතු සම්බන්ධයෙන් සහය දෙමින් කටයුතු කරන අතර, උහන ප්‍රාදේශීය සභාවේ උහන පුස්තකාලයේ පවත්වාගෙන යනු ලබන E-Learning මධ්‍යස්ථානයේ කටයුතු සඳහා සහය දක්වයි.ඔහුගේ පුහුණු කාලය 2022.09.22 දිනෙන් අවසන් වන අතර ඉහත කටයුතු පවත්වා ගෙන යාම සඳහා ඔහුගේ ඉල්ලීම සලකාත්, ඔහුගේ වැඩිදුර පුහුණුව සලකාත්, ඔහුගේ පුහුණුව මාස 02 කින් දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සහා අනුමැතියට යෝජනා කර ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්. ආර්. චන්ද්‍රසේකර බංඩාර මයා විසින් ස්ථිර කරන ලදි.**

**ගරු සභාවේ මන්ත්‍රීවරුන් විසින් එම යෝජනාව සම්බන්ධයෙන් දක්වන ලද අදහස්,**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

මේක පූර්වාදර්ශයක් ලෙස නොගෙන කටයුතු කළ යුතු බවත් මාස 06 කට පමණක් පුහුණුව සඳහා අපි අනුමැතිය ලබා දෙන බවත් විශ්ව විද්‍යාලයට තේරී පත්ව සිටිනවා නම් එයට යාමට ඔහුට පවසා වෙනත් අයෙකු එම පුහුණුව සඳහා බඳවා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි. වෙන අයෙකුටත් පුහුණුව සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.අවුරුදු 04 ඉතිහාසය තුළ පුහුණුවට පැමිණෙන අය මෙහි පැල්පදියම් වූ බවත් වෙන අයට අවස්ථාව ලබා නොදී සිටි බවත්, ඒ තුළින් පුහුණුලාභින්ට අසාධාරණයක් වන බවත් පෙන්වා දෙන ලදි. පරිගණක පුහුණුව සඳහා එම ශිෂ්‍යයා ගන්නා විට අපි විරුද්ධ නොවුනු බවත් ඔහුගේ මාස 06 ක කාල සීමාව ඉවර නම් ඔහුට සහතිකයක් ලබා දී ගෙදර යවා වෙන පුහුණු වන අයෙකුට එම අවස්ථාව ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්. ආර්. චන්ද්‍රසේකර බංඩාර මහතා**

ගරු සභාපතිතුමනි, ඔබතුමා පවසන ආකාරයට එම දරුවා විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා ඇති බවත්, මේ දරුවා තව මාස දෙකකට පමණක් පුහුණු වීමට කාලය ඉල්ලා ඇති බවත්, දිගින් දිගට පුහුණු කාලය දීර්ඝ කරගනිමින් ඔහු රැඳී නොසිටින බව පැහැදිලි බැවින් ඔහුට යම් සහනයක් ලෙස එම මාස දෙක ඔහුගේ පුහුණු කාලය දීර්ඝ කර දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී. ආරියරත්න දෙලංකාවල මහතා**

හිටපු සභාපතිතුමාගේ ප්‍රකාශය නිවැරදි බවත් එවැනි තීරණයක් සභාව විසින් අරගෙන තිබුණු බව සත්‍යයක් බවත් නමුත් මේ සිද්ධිය ඊට එහා සානුකම්පිතව බැලිය යුතු සිද්ධියක් බවත්,ලිඛිතව එම දරුවා ඉල්ලීමක් කර ඇති බවත් , එහි මාස දෙකක කාලයකට යැයි විශේෂ කර ඉල්ලා ඇති නිසාත්, පහුගිය කාලයේ විශාල සේවයක් ඔහුගෙන් සිදුවූ නිසාත් , එම නිසා පූර්වාදර්ශයකට අරගෙන පහුගිය කාලයේ සිදු කලා වගේ දිගින් දිගට කරන්නේ නැතිව විශේෂ අවස්ථාවක් ලෙස සලකා මේ මාස දෙකක කාලය ඔහුට ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.ඉගෙන ගන්නා දරුවෙකුට අතහිත දීමක් ලෙස සළකා මේ කාර්යය සිදු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩබ්.රාණි මැණිකේ මිය**

ගරු සභාපතිතුමනි , දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට ඉගෙන ගන්නා දරුවෙක් නිසා එම මාස දෙක දීර්ඝ කර දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්පකුමාර මහතා**

හිටපු සභාපතිතුමා පැවසූ ආකාරයට ඇත්ත ක්‍රමවේදය එය බවත්, ඔබතුමාගේ එම අදහසට ගරු කරන බවත්, හිස නමන බවත් , නමුත් ඔබතුමාට පිටුපානවාවත් ප්‍රතික්ෂේප කරනවාවත් නොවන බවත් මේ දරුවා ලිඛිතව මාස දෙකකට පමණක් යැයි සඳහන් කර ඉල්ලීමක් කර ඇති බැවින් හා ඔහු විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබූ දරුවෙක් නිසා හා අප සමඟ මාස හයක කාලයක් යම් කාර්යභාරයක් සිදු කලද ඔහු කිසිම ප්‍රශ්නයක් සිදු නොවුන බවත් එම නිසා ඔහුට එම මාස දෙකකට පුහුණු කාලය දිර්ඝ කර දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.තව මාස දෙකකින් එම දරුවා උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වන බැවින් දිගින් දිගට එම පුහුණු කාලය දීර්ඝ කිරීමක් සිදු නොවන බැවින් එම යෝජනාවට කැමැත්ත දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උප සභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා**

ගරු සභාපතිතුමනි, ඒ දරුවා කවුරුන්ද යන්න මම නොදන්නා බවත් දෙළංකාවල මන්ත්‍රීතුමා පැවසූ පරිදි සමහරු අවුරුදු හතර පහ මෙතැන පැල්පදියම් වී සිටි බවත් ඒක වැරදි බවත් මේ දරුවා මාස දෙකක් මෙතන හිටියාට ප්‍රශ්නයක් නැති බවත්, අපේ ආයතනය පූර්වාදර්ශයක් ලෙස බැලූවිට පසුගිය අවුරුදු

හතරක් පමණ දෙදෙනෙක් තියාගෙන සිටින බවත් , එවිට එය සාධාරණ හේතුවක් ලෙස මම කිසිවක් නොදකින බවක් සභාවට පහසුවක් ලෙස එසේ තියාගෙන සිටින බවත් පෙන්වා දෙන ලදි. යම් කාලයක් පුහුණුවී ගෙන යන විට, එම කාර්යය දිගටම කරන විට තව කෙනෙක් අරගෙන පුහුණු කරනවාට වඩා යම් පහසුවක් සභාවට තිබෙන නිසා ඔවුන් දිගටම රඳවාගෙන සිටින බව පෙන්වා දෙන ලදි.නමුත් ප්‍රදේශයේ ජනතාවට ඒ තුළින් අසාධාරණයක් වන බවත්, තව දෙමාපියන්ගේ දරුවෙකුට මෙතනට එන්න තිබෙන අවස්ථාව ගිලිහී යන බවත් පෙන්වා දෙන ලදි.

මේ දරුවා තව මාස දෙකක් මෙහි සිටින එක ප්‍රශ්නයක් නොවන බව පෙන්වා දෙන ලදි. මාස හයෙන් හයට දරුවන්ට පුහුණුවෙන්නට අවස්ථාව ලබා දී සහතිකය ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. මේ දරුවා තව මාස දෙකක් පුහුණුවනවාට විරුද්ධ නොවන බවත් , තවදරුවකුට එම අවස්ථාව ලබා දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය**

එම දරුවා විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ දරුවෙක් බැවින් ඔහුගේ අධ්‍යයන කටයුතු වලට මේ පුහුණුවීම් රුකුලක් විය හැකි නිසාත් තව මාස දෙකකින් මෙම දරුවා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඇතුලත් වන නිසාත් එම දරුවාගේ පුහුණු කාලය මාස දෙකකින් දීර්ඝ කිරීම සුදුසුබව ප්‍රකාශ කරන ලදි .

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී. ආරියරත්න දෙලංකාවල මහතා**

මේ යෝජනාව මේ පමණ දුරදිග ඇදේවියැයි නොසිතූ බවත්, දැඩි ලෙස, හිටපු සභාපතිතුමා එකම මතයේ සිටිම නිසා මෙය මතක් කරන්නට සිතූ බවත් අපි හැමදාම එකම මතයේ සිටි බවත්, හැමදාම කෙනෙකුට හොඳක් වෙන පැත්තේ සිටගෙන සිටි බවත් පෙන්වා දෙන ලදි.මෙහි ඉතිහාසය ගත්විට හිටපු සභාපති රංජිත් ඒකනායක මැතිතුමාගේ කාලයේ, වැඩිම කාලයක් එම කට්ටිය තියාගෙන සිටි බවත් අවුරුදු පහක් වගේ කාලයක් තියාගෙන සිටි බවත්, ඒ කාලයේ මේ ප්‍රදේශයේ දරුවන්ට ලොකු අසාධාරණයක් සිදු වූ බව පෙන්වා දෙන ලදි. දරුවන්ට පුහුණුව ලබා ගන්න තිබූ අවස්ථාව ගිලිහී ගිය බව පෙන්වා දෙන ලදි.ඒ කාලයේ සභාවට විශාල සේවයක් සිදු කල සේවකයන් දෙදෙනෙකු සිටි බවත්, සභා වාර්තාව ගත් විට සභා වාර්තාවේ සියළු කටයුතු එයාලා අතින් සිදු වූ බවත්, පෙන්වා දෙන ලදි.නමුත් ඒ මොහොතේ තව කෙනෙකුගේ අවස්ථාව ගිලිහී ගියත් සේවක හිඟය නිසා ඔවුන්ගේ දක්ෂතා අනුව ඔවුන්ගේ සේවය අගය කරන ගමන් අපි ඒ අයට අවස්ථාව දිගින් දිගටම ලබා දුන් බවත් , එම නිසා එදා තිබුණු තත්ත්වය දිගින් දිගටම තිබිය යුතු යැයි මම නොපවසන බවත්, නමුත් මේ අවස්ථාව විශේෂ අවස්ථාවක් ලෙස සළකා මෙය කරමු යැයි පවසා සිටියේ මෙතනට එන හැම දරුවාම විශ්ව විද්‍යාලයට නොයන බැවින් හා එන හැම දරුවාම රැකියාවකට නොයන බැවින් ඔහු විසින් විශේෂ ඉල්ලීමක් කර ඇති බැවින් බව ප්‍රකාශ කර ලදි.මේ දරුවාට තව මාස දෙකක් පුහුණුව ලබා දිමට අනුමැතිය ලබා දෙමු යැයි ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

මෙය මෙච්චර කතා කළ යුතු දෙයක් නොවන බවත් , මෙම සභාවේ මන්ත්‍රීවරු 30 දෙනෙක් සිටින බවත් , මෙහිදී බහුතරයේ කැමැත්තට තීන්දුවක් ගත හැකි බවත්, විරුද්ධ වීම මම තනිවම හෝ කරන බවත්, එය මාගේ ප්‍රතිපත්තිය බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එන්.එච්. ලාල් ජයන්තසිරි මහතා**

මගෙත් විශ්ව විද්‍යාල දරුවෙක් සිටින බවත්, ආර්ථික අතින් දුෂ්කරතා හැමෝටම තිබෙන බවත්, විශ්ව විද්‍යාල දරුවෝ විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා ගමන් හෝටල් වල පවා වැඩ කර මුදල් හොයන බවත්, මාගේ දරුවාත් එසේ කිරීමට මගෙන් අවසර ඉල්ලා සිටිය බවත්, එසේ බලන විට මෙය මහ ලොකු දෙයක් නොවන බවත්, අපි සානුකම්පිතව සිතා බලා මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්පකුමාර මහතා**

මේ ප්‍රශ්නය දිගින් දිගට ඇදගෙන යා යුතු කාරණයක් නොවන බවත්, මා චූටි උදාහරණයක් ගෙන එන බවත්, මන්ත්‍රීවරු ලෙස අපි අපිවම ආදර්ශයට ගන්නා ලෙස මා ප්‍රකාශ කරන බවත්, එයට හේතු නොවිමසන ලෙසත් ප්‍රකාශ කරන ලදි.අපි තව අයගේ අවස්ථාව අවුරුද්දකට නැති කර ඇති බවත් ,තවත් අවුරුද්දකට අර අදින බවත් පෙන්වා දෙන ලදි.එම නිසා මම මෙය පවසා සිටියේ අපි අපට අවංක විය යුතු නිසා බවත්, , එම නිසා මේ දරුවාට තව මාස දෙකක් පුහුණු වීම සඳහා අවස්ථාව ලබා දෙමු යැයි ප්‍රකාශ කරන ලදි.

**ඉහත යෝජනාව සඳහා ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මන්ත්‍රීතුමා හැර එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියළුම මනිත්‍රීවරුන්ගේ කැමැත්ත මත සභා අනුමැතිය ලබා දෙන ලදි.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.11.05 ගරු ප්‍රා.ස.මන්ත්‍රී  ජේ.ආර්.ජගත් ප්‍රසන්න මහතා පැමිණෙන ලදි.

**යෝජනා අංක 06/2022/09(18)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් 2023 වර්ෂයේ කියවීම් මාසය නිමිති කොටගෙන ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛ 2004/පුස/02(අ)/(සංශෝධිත 2022) අනුව උහන ප්‍රාදේශිය සභාවට අයත් උහන ,ගොනාගොල්ල , වීරගොඩ පුස්තකාල සම්බන්ධ කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් , ඒ සඳහා රු.30000.00 මුදලක් වියදම් දැරීමටත් සභා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
இலங்கைத் தேசிய நூலகம்
**National Library of Sri Lanka**

NLSL

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு Ministry of Education

---

60-12-06 2022.06.06 06/46

නාගරික කොමසාරිස්/ලේකම්

ප්‍රාදේශීය සභාව/නගර සභාව/මහ නගර සභාව

................................

ප්‍රාදේශීය සභාව
16 JUN 2022
උහන.

මහත්මයාණෙනි/මහත්මියනි,

**ජාතික කියවීමේ මාසය - 2022**

සැම වසරකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර ඇත. 2004 වර්ෂයේ සිට දිවයිනේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ජාතික කියවීමේ මාසය සැමරීම සඳහා විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති මහජන පුස්තකාල සමග එක්ව සාර්ථක අයුරින් පැවැත්වීමට පළාත් පාලන ආයතන විසින් ලබා දුන් සහයෝගය අතිශයින්ම අගය කොට සලකමි. මෙවර ද ජාතික කියවීමේ මාසය වැඩසටහන සැමරීම සඳහා කටයුතු යොදා ඇති අතර, පළාත් පාලන ආයතනවල මහජන පුස්තකාල මුල්කරගනිමින් ඒ සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

මේ පිළිබඳව අප මණ්ඩලය විසින් නිකුත් කළ උපදේශක චක්‍රලේඛය ඔබගේ පළාත් පාලන ආයතනයේ පුස්තකාල වෙත යොමු කර කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් ඉටු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වනු ලබන සහයෝගය ඉතා අගය කොට සලකමි.

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07

මහාචාර්ය නන්ද ධර්මරත්න

සභාපති

ඇමුණුම -
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2022)

94 11 2698847, 2685197 | 94 11 2685201 | info@mail.natlib.lk | www.natlib.lk

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 14, නිදහස් මාවත, කොළඹ 07
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை 14, சுதந்திர வீதி, கொழும்பு 07
National Library & Documentation Services Board 14, Independence Avenue, Colombo 07

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ)(සංශෝධිත 2022)

## පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන පුස්තකාලයන්හි "ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම

### 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර තිබේ. 2022 ඔක්තෝබර් මාසයට යෙදෙන **ජාතික කියවීමේ** මාසයට සමගාමීව කියවීම් ප්‍රවර්ධනය සඳහා **විශේෂ වැඩසටහන්** සහ **විශේෂ ව්‍යාපෘති** ක්‍රියාත්මක කරන මෙන් සියලුම මහජන පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. " **දැනුමැති සමාජයක් උදෙසා කියවීම** " යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

### 02. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා **ජාතික කියවීමේ** මාසයේ **ව්‍යාපෘති කමිටුවක්** පත් කර ගැනීම සුදුසු වේ. දැනටමත් පත්කරන ලද පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මඟින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැකිය. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත් කර ගැනීම ද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධානියා - කමිටු සභාපති
- නාගරික කොමසාරිස් හෝ පළාත් පාලන ආයතනයේ ලේකම් - උප සභාපති
- පුස්තකාලයාධිපති/භාරකරු - කමිටු ලේකම්
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- මහජන සෞඛ්‍ය පරීක්ෂක
- කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී
- ප්‍රාදේශීය රෝහල් ප්‍රධානී හෝ නම් කරන නියෝජිතයෙක්
- කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු උපදේශකවරයෙක්
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා සංවර්ධන නිලධාරී

### 03. ක්‍රියාත්මක කළ හැකි විශේෂ වැඩසටහන්

- පොතපත කියවා ජීවිතය ජයගත් පුද්ගලයන්ගේ චරිතාපදාන පුස්තකාල එකතුවට අත්පත් කරගැනීමට කටයුතු කිරීම හා විශේෂිත ක්‍රමයක් යටතේ සංවිධානය කර වර්ෂය පුරා ප්‍රචාරණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම.
- **එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන වැඩසටහනෙහි සිව්වන අරමුණ (SDG 04)** අනුව "පරිපූර්ණ, සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම" යන ඉලක්කය **සපුරා ගැනීම සඳහා ප්‍රජාවගේ සාක්ෂරතාව වර්ධනය කිරීමේ වැඩසටහන් සිදු කිරීම.**

CamScanner

**කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේ දී එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන වැඩසටහනෙහි පස්වන අරමුණ (SDG 05) අනුව ". ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම" යන ඉලක්කය සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම.**

- පර්යේෂකයන් / පාසල් සිසුන් හා තොරතුරු සොයා එන ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා සඳහා තොරතුරු කරා ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් සැපයීම හා සහාය වීම.
- පුස්තකාල ප්‍රජාවගේ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රදේශයේ පාසල් සිසුන් හා උසස් අධ්‍යාපන අවශ්‍යතා සහිත සාමාජිකයන්ගේ තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා කටයුතු කිරීම.
- පළාත් පාලන බල ප්‍රදේශයට අයත් සෑම නිවසකම පුස්තකාලයක් යන සංකල්පය තේමා කොට ගනිමින් ගෘහස්ත පුස්තකාල ආරම්භ කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගෘහ පරිභෝජනය සඳහා සුදුසු වන භෝග හා ශාක වර්ග පිළිබඳව මෙන්ම ආර්ථික භෝග වගා කිරීම පිළිබඳ දැනුවත් කිරීම,එම භෝග වගා කිරීම පිළිබඳ අවශ්‍ය තොරතුරු බෙදා හැරීම සඳහා වන වැඩසටහන් සිදු කිරීම.
- පාඨක සමාජයේ සෑම පාඨකයෙකුගේම නිවාස ආශ්‍රිතව ගෙවතු වගා කටයුතු සිදුකිරීමට පෙළඹවීම.
- අතිරික්ත භෝග අලෙවි කිරීම / හුවමාරු කරගැනීම සඳහා අවශ්‍ය වෙළඳපොළ පුස්තකාල භූමිය ආශ්‍රිතව සලසා දීම.
- අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය ඔස්සේ පුස්තකාල එකතුව පිළිබඳ විස්තර හා තොරතුරු ප්‍රචාරය කිරීම.
- දේශීය කර්මාන්ත ආශ්‍රිතව විවිධ ස්වයං රැකියා සඳහා අවශ්‍ය දැනුම ලබාගැනීම සඳහා මග පෙන්වීම.
- හරිත පුස්තකාල සංකල්පයට අදාළව පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධව පුස්තකාලය ආශ්‍රිතව සිදුකළ හැකි ක්‍රියාකාරකම් සිදුකිරීම.
- ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස පුස්තකාලය කටයුතු කිරීම හෝ අදාළ පළාත් පාලන ආයතනය ඒ සඳහා යොමු කරවීමට කටයුතු කිරීම.
- පාඨක නිර්මාණශීලීත්වය එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සහරා, බිත්ති පුවත්පත් එළි දැක්වීම.
- තේමාවට අදාළව විවිධ තරග සංවිධානය කිරීම ( රචනා තරග ,චිත්‍ර තරග,කථික...)
- තේමාවට අදාළව පෝස්ටර් නිර්මාණය.
- නව සාමාජිකයන් බඳවා ගැනීම හා නොමිලයේ පුස්තකාල සාමාජිකත්වය පිරිනැමීම.
- පුස්තකාලය පිළිබඳ ප්‍රචාරණාත්මක වැඩසටහන් පැවැත්වීම.
- අදාළ බල ප්‍රදේශයේ හොඳම පාඨකයා තේරීම.
- ජංගම පුස්තකාල සේවා පැවැත්වීම.
- දරුවන්ගේ රසඥතාවය ඉහළ නැංවීම සඳහා කතන්දර පැය, ළමා චිත්‍රපට, ළමා නාට්‍ය වැනි රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ළමා කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධ වෙනත් නිර්මාණශීලි වැඩසටහන් සංවිධානය කිරීම.
- අනෙකුත් පුස්තකාල සමඟ කියවීම් ප්‍රවර්ධනය සඳහා සහයෝගිතා වැඩසටහන් සංවිධානය කිරීම.
- පුස්තකාලයේ මුහුණු පොතට (face book) මෙතෙක් සම්බන්ධ වී නොමැති පාඨකයන් හඳුනා ගෙන ඔවුන් ඒ සඳහා සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ එහි කියවීම ප්‍රවර්ධනය සම්බන්ධ උද්ධෘත හා අදහස් හුවමාරු කර ගැනීම.
- පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
- ප්‍රාදේශීය වශයෙන් නව නිපැයුම්,නව සංකල්ප හා අදහස් ඉදිරිපත් කරන දරුවන්, සිවිල් ක්‍රියාකාරීන් ඇගයීම සඳහා කටයුතු කිරීම.

CS CamScanner

## 04. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යාවත්කාලීනව නිකුත් කර ඇති කොවිඩ් -19 (COVID -19)සෞඛ්‍ය මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීම සුදුසු වේ. අදාළ උපදෙස් සඳහා පහත වෙබ් යොමුව පරිශීලනය කරන්න.
http://www.health.gov.lk/moh_final/english/article_read_more.php?id=885

## 05. අරමුදල්

මේ සඳහා අමතරව විශාල වශයෙන් මුදල් යෙදවීම සිදු නොකළ යුතුය. අවශ්‍ය අරමුදල් සපයා ගැනීම අදාළ පළාත් පාලන ආයතනය මගින් හෝ පුස්තකාල මගින් සිදු කළ හැකිය.

## 06. වාර්තාව සකස් කිරීම

සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් (මුද්‍රිත/සංයුක්ත තැටි) සකස් කර අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව **2023 පෙබරවාරි මස 28** වන දින හෝ ඊට පෙර **අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07** යන ලිපිනයට වාර්තාව එවිය යුතුය.

- ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සඳහා ලකුණු ලබාදීමේ දී කියවීම ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. (මුළු ලකුණුවලින් 75% ක්) පුස්තකාලය විසින් කරන ලද වෙනත් ප්‍රජා සේවාවන් සම්බන්ධ තොරතුරු සඳහා 25% ක ලකුණු ප්‍රමාණයක් හිමිවේ.
( කාංශිකාර්මික / පරිසර හිතකාමී වැඩසටහන් වැනි )

- වාර්තාව සකස් කිරීමේ දී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව ඡායාරූප හා **තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින්** ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

## 07. ඇගයීම

ජාතික කියවීමේ මාසය 2022 එලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2023 ජාතික කියවීමේ මාසය ජාතික උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ. ඇගයීම් කටයුතු පුස්තකාල මට්ටමින් සිදුකරන බැවින් එක් එක් පළාත් පාලන ආයතන සතු මහජන පුස්තකාල හා ශාඛා පුස්තකාල වෙන් වෙන් වශයෙන් වාර්තා එවිය යුතුය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් අවසන් වශයෙන් තේරී පත්වන පුස්තකාල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අදාළ පුස්තකාලය සඳහා හිමිවන සම්මාන කවරේ ද යන්න තීරණය කරනු ලැබේ

මහාචාර්ය චන්ද්‍ර ධර්මරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07

සභාපති

විමසීම් - දුරකථන අංකය - 0714452620 /0718331766

වෙබ් අඩවිය - www.natlib.lk

ඇමුණුම - ජාතික කියවීමේ මාසය වාර්තාව සකස් කිරීම පිළිබඳ පොදු උපදෙස් මාලාව

CS CamScanner

## <u>ජාතික කියවීමේ මාසය වාර්තාව සකස් කිරීම පිළිබඳ පොදු උපදෙස් මාලාව</u>

**ඉදිරිපස කවරය සකස් කිරීම**

- වැඩසටහන, අදාළ වර්ෂය සඳහන් කිරීම සහ වාර්තාව ඉදිරිපත් කරන පුස්තකාලයේ නම නිවැරදිව සඳහන් කිරීම.

**ඇතුලත මුල්පිටු**

- පුස්තකාලය පිළිබඳ කෙටි හැඳින්වීම.
  පුස්තකාලය අයත් මව් ආයතනය, ලිපිනය,
  පුස්තකාලය හා සම්බන්ධ විය හැකි අනෙකුත් මාර්ග
  ( දුරකථන අංක,විද්‍යුත් ලිපිනය,වෙබ් පිටු)
- පුස්තකාලයේ මෙහෙවර ප්‍රකාශය
- පුස්තකාලයේ සම්පත් හා සංවිධානය
- පාඨකයන් සඳහා පවත්වාගෙන යන පුස්තකාල සේවා

**පටුන**

(1) ජාතික කියවීමේ මාසය වෙනුවෙන් සිදුකරන ලද විශේෂ වැඩසටහන්.
අදාළ වැඩසටහන් සිදු කිරීම සඳහා ලබාගත් අනුමැතිය
සම්පත්දායකයන්
සහභාගීවූවන් - අත්සන් ලේඛන පිටපත් (සහතික කරන ලද පළමු පිටුව හා අවසන් පිටුව ප්‍රමාණවත්ය.)
වැඩසටහන අතරතුර ලබාගත් ඡායාරූප

- පුස්තකාලය විසින් සංවිධානය කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්
  අදාළ වැඩසටහන් සිදු කිරීම සඳහා ලබාගත් අනුමැතිය
  වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු
  සම්පත්දායකයන්
  සහභාගීවූවන් - අත්සන් ලේඛන පිටපත් (සහතික කරන ලද පළමු පිටුව හා අවසන් පිටුව ප්‍රමාණවත්ය.)
  වැඩසටහන අතරතුර ලබාගත් ඡායාරූප

(2) පුස්තකාලයේ වාර්ෂික සැලැස්මට අනුව සිදු කරන ලද කියවීම් ප්‍රවර්ධන වැඩසටහන්

- ❖ වාර්ෂික සැලැස්ම
- ❖ වැඩසටහන් සිදු කළ බවට සනාථ කළ හැකි ලේඛන

(3) පුස්තකාලය විසින් සිදු කරන ලද වෙනත් ප්‍රජා වැඩසටහන්

(4) ඇමුණුම
වැඩසටහන් සම්බන්ධ සහතික, ප්‍රචාරණ පත්‍රිකා, පුවත්පත් දැන්වීම් ආදිය මේ යටතේ ඇතුළත් කරන්න.

- ❖ මාතෘකා පිටුව, සාරාංශය, හැඳින්වීම සහ යොමු කිරීම් පමණක් වෙනම පිටුවකින් ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, එක් එක් කොටසෙහි ආරම්භය නව පිටුවකින් ආරම්භ කිරීම සුදුසු වේ.
- ❖ ඡායාරූප ඇතුළුව සියලුම පිටු අනුපිළිවෙළින් අංකනය කළ යුතුය.
- ❖ අනවශ්‍ය විසිතුරු ඉදිරිපත් කිරීම සිදු නොකළ යුතුය.

CS CamScanner

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්.ලාල් ජයන්තසිරි මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී. ආරියරත්න දෙලංකාවල මයා.**

මේ සඳහා වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.එච්.ලාල් ජයන්තසිරි මයා.**

2004 වර්ෂයේ සිට කියවීමේ මාසය නම් කර ඇති බවත් , පලාත් පාලන කොමසාරිස් තුමා විසින් වැඩසටහන් ගණනාවක් නම් කර එවා ඇති බවත් , ඒ වැඩපිළිවෙල ක්‍රියාත්මක කල හැකි බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මෙම ලිපියේ නිර්නායක ටික සඳහන්ව ඇති බවත් , රු.30000.00 කින් එයින් දෙකක් වත් කල නොහැකි බවත් ,එම නිර්නායක වලින් අත්‍යාවශ්‍යම දේ මොකක්ද යන්න හඳුනාගෙන කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.ජී.ජයතිලක මයා.**

වීරගොඩ පුස්තකාලය විවෘත කිරීම පිලිබඳව ස්තුතිවන්ත වන බවත් ,නමුත් පුස්තකාලයේ අඩුපාඩු කම් රැසක් තිබෙන බවත් , මේස පුටු ආදිය අඩුපාඩු බවත්,ඒ පිලිබඳවත් සොයා බලා කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

වීරගොඩ හා ගොනාගොල්ල පුස්තකාල දෙක සඳහා ඊ -ලර්නින් සෙන්ටර් ආරම්භ කිරීම සඳහා අවශ්‍යය රූපවාහිනී යන්ත්‍ර දෙක ගෙනත් ඇති බවත් , නමුත් ඒ රූපවාහිනී සවි කිරීමෙන් පසු වගකීම ගන්නේ කෙසේදැයි විමසන ලදි.දැන් එවැනි රූපවාහිනී යන්ත්‍රයක් ලක්ෂ හතරක් පමණ වන බවත්, මුර කරුවකු නොමැති ප්‍රශ්නය නිසා මෙය විශාල ගැටළුවක් බවත් ප්‍රකාශ කරන ලදි.


**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

රු.30000.00 පුස්තකාල තුනට බෙදුන විට එක් පුස්තකාලයකට රු.10000.00 ක මුදලකින් විශාල දෙයක් කල නොහැකි බවත් පුස්තකාල පරිශ්‍රයට පැමිණෙන දරුවන්ට පහසුකම් ටිකක් ලබා දෙන ලෙසත් සුදුසු පරිදි අඩුපාඩු හඳුනාගෙන කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2022/09(19)**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා විසින් උහන ගුවන් හමුදා කඳවුරට අදාළ භූමිය හා එයට අදාළ දේපළ වරිපනම් බදු අය කිරීමට දියුණු ගම් ප්‍රදේශයක් බවට නම් කිරීම සඳහා 11/8 රීතිය යටතේ සභා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.**



රංජිත් වනිගසිංහ ඒකානායක,
ප්‍රාදේශිය සභා මන්ත්‍රී,
7/1/1,
ඒකානායක මාවත
උහන,
2022.09.08

ලේකම්
ප්‍රාදේශිය සභාව

ප්‍රාදේශීය සභාව
08 SEP 2022
උහන.

11/08 විෂය යටතේ යෝජනාව ඉදිරිපත් කිරීම.

උහන ගුවන් හමුදා කඳවුරට අදාළව ඉඩම හා ඒයට අදාළ දේපල වරිපනම් බදු අය කිරීමට දියුණු ගම් ප්‍රදේශයක් ලෙසට නම් කිරීම සඳහා යෝජනාව.

උහන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් ගුවන් හමුදා කඳවුරට අදාළ ඉඩම හා දේපල සඳහා වරිපනම් බදු අය කිරීම සඳහා වරිපනම් බල ප්‍රදේශයක් ලෙස නම් කිරීම සඳහා ~~යෝජනා~~ සභා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරමි.

මෙයට

**එම යෝජනාව ගරු ප්‍රා.ස.මන්ත්‍රී ර්.ආර්.සුමනාවතී මිය විසින් ස්ථිර කරන ලදි.**

ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා

එසේම මේ සභාවම ගොඩ දැමිය හැකි එක් දෙයක් තිබෙන බවත් එය වරිපනම් වලට ගැසට් කල යුතු බවත් ,වැලිකහගොල්ල කොට්ඨාශයෙන් වරිපනම් ලබා ගත හැකි බවත් එහි සියළු පහසුකම් ලබා දී ඇති බැවින් එසේ ගැසට් කලහැකි බව පෙන්වා දෙන ලදි. ගුවන් තොටුපල තිබෙන්නේ වැලිකහගොල්ල වසමේ බවත් එම නිසා වරිපනම් ගැසට් එක යටත්ව ගත යුතු බවත් පෙන්වා දෙන ලදි. කෝටි ගානක දේපල වලින් සභාවට ආදායම ලබා ගත හැකි බව පෙන්වා දෙන ලදි. මෙය මැනුම් කර ගැසට් කිරීම සිදුකල හැකි බව පෙන්වා දෙන ලදි. ගුවන් හමුදා සිතියමට පමණක් මෙම කොටස වරිපනම් බල ප්‍රදේශයක් කල හැකි බව පැහැදිලි කර දෙන ලදි.

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යොජනාව  ඒකමතිකව සම්මත විය.**

ඔරලෝසු වේලාවෙන් ප.ව. 11.20 තේ විවේකය සදහා සභාව කල් තබන ලදි

ඔරලෝසු වේලාවෙන් ප.ව. 11.40 තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදි.

**07.** කාරක සභාවල වාර්තා

**2022.08.24 දින පැවති මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම්  වාර්තාව ඉදිරිපත් කිරීම.**

## 2022.08.24 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

සහභාගිත්වය :-

1. ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා - සභාපති
2. ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා - සාමාජික
3. ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී පී.ඒ. ඉමාලි සන්ධ්‍යා මිය - සාමාජික
4. ගරු ප්‍රා.ස. මන්ත්‍රී ආර්.එම්. ජයවීර රත්නායක මහතා - සාමාජික

කාර්ය මණ්ඩලය :-

1. පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය - ලේකම් ප්‍රා.ස.
2. ඩබ්.එස්.ආර්. කුමාරි මිය - ප්‍රධාන කළ.සේවා නිල.
3. එන්.ඩබ්. ජයසේකර මිය - කාර්මික නිලධාරි
4. ආර්.පී.ටී.ජී. රාජපක්ෂ මයා - කළ.සේවා නිල.
5. පී.ඒ.ඩී. සෞම්‍යා ශ්‍රී ප්‍රභානි මිය - සංවර්ධන නිලධාරි
6. ඩබ්.සී.ඒ. ගලේවෙල මිය - සංවර්ධන නිලධාරි
7. එල්.එල්. රම්‍යා ලක්මිණි මිය - සංවර්ධන නිලධාරි
8. ඩී.කේ. රත්නාවති මිය - කළමනාකරණ සේවා නිලධාරි
9. ඩබ්.ඩී. මහේෂිකා මිය - කළමනාකරණ සේවා නිලධාරි
10. ඩී.එම්. තිස්ස කුමාර මයා - ආදායම් පරීක්ෂක
11. ඩබ්.ඒ. විජේ කුමාරතුංග මයා - කා.කා.ස. (ආදායම් කටයුතු)

2023 වර්ෂයට අදාල අයවැය සැකසීම සම්බන්ධව සාකච්ජා කර නිර්දේශ ලබා ගැනීම හා මූලික ඇස්තමේන්තු සකස් කිරිම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව රැස්වන ලදි. එහිදී 2021,2022 වර්ෂයන් තුළ ඇති වුනු ආර්ථිකමය තත්ත්වයන් පිළිබඳවද සළකමින් පෙර වර්ෂවල ආදායම් වියදම් ඇස්තමේන්තු ද පදනම් කර ගනිමින් 2023 වර්ෂයට අදාල ඇස්තමේන්තු සැකසීමට මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේදි සාකච්ජා කරන ලදි. එසේම එහිදී ප්‍රදේශයේ මහජනතාවගේද අදහස් හා යෝජනා ලබා ගනිමින් එම යෝජනා වලටද ප්‍රමුඛතාවය ලබා දෙමින් අයවැය සකස් කිරිම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශ කළ බැවින් පහත යෝජනා ද මේ සඳහා පාදක කරගන්නා ලදි.

### 01. උහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය

I. මසකට 01 බැගින් ඩෙංගු පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන් 12 පැවැත්වීම සඳහා මසකට 3000.00 බැගින් රු. 36000.00
II. මී උණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් - කන්නයකට 03 බැගින් වසරකට වැඩමුළු 06 ක් පැවැත්වීම සඳහා මසකට 5000.00 බැගින් රු. 30000.00
III. ඩෙංගු මදුරුවන් විනාශ කිරීමේ දුමායන කටයුතු සඳහා භූමිතෙල් 75L ක් සහ පෙට්‍රල් 15L ක් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන

මෙම යෝජනාවන් සහා ආදායම් හා වෙනත් ආයතන මඟින් ලැබෙන ආධාර මුදල් යොදාගෙන සෞඛ්‍ය වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට නිර්දේශ ලබා දෙන ලදි.

**02. ඩී.එම්.ටී.කේ. දසනායක මයා, ආදායම් පරීක්ෂක, උහන ප්‍රාදේශීය සභාව**

i. ආදාහනාගාරයක් තැනීම

ii. උහන සුසාන භූමිය ඉදිරිපස අඩි 20 ක ප්‍රමාණයක් වෙළඳකුටි සඳහා රැකියා විරහිත පුද්ගලයන් හට ලබා දීම

iii. ගොනාගොල්ල හන්දියේ ත්‍රීවිල් රථ ගාල විවෘත කිරීමේදී ලබා දී ඇති පෙට්ටි කඩ කිසිදු පුද්ගලයෙකු විසින් වෙළඳාමක් නොකරන අතර, සභාවට මුදල් ද නොගෙවයි. එම පෙට්ටි කඩ උහන ළමා උද්‍යානය අසළ භූමියට දමා දිනකට රු. 300.00 මුදලකට ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**නව උත්පාදන මාර්ග**

i. බ්ලොක් ගල් කර්මාන්තය ආරම්භ කිරීම (කොන්ක්‍රීට් භාණ්ඩ)

ii. සුසාන භූමියේ භූමිදාන කටයුතු සඳහා මුදල් ලබා ගැනීම

iii. අබලි යකඩ ගැනුම් මධ්‍යස්ථානයක් ඇති කිරීම

iv. පොල්ලෙලි කැලි කපා පැකට් කිරීම සහ අලෙවිය

v. වාර සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම

vi. වැලි තොටුපලක් ආරම්කර වැලි සුද්දකර පැකට් කර අලෙවි කිරීම

vii. CFL වර්ගයේ විදුලි බුබුළු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් ආරම්භ කිරීම

viii. ගඩොල් කර්මාන්තය (නව ඉඩමක) පස් රැගෙනවිත් ආරම්භ කිරීම

ix. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර අලෙවි කිරීම

x. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම (දාන පිංකම්, උත්සව සඳහා)

xi. උත්සව අවස්ථා සඳහා විදුලි බුබුලු වලින් සැරසිලි කිරීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම

xii. උත්සව භාණ්ඩ (මේස, පුටු,පිඟන්) කුලියට ලබා දීමේ ස්ථානයක් පවත්වා ගැනීම

xiii. වීරගොඩ පාරේ දැනට ඇති පොදු ළිං 02 ක ඉවත් කර කඩ කාමර සාදා කීමනි ක්‍රමයට ලබා දීම

ඉහත යෝජනා සභාවේ අද

**03. ගරු ප්‍රා.ස. මන්ත්‍රිනි ජී.ආර්. සුමනාවති මිය**

උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් වැවකට එක් මෝටර් බෝට්ටුවක් බැගින් ලබා දී ඒ සඳහා සුදුසු නිලධාරීන් යොදවා දරුවන් සඳහා බෝට්ටු සේවාවක් ලබා දී සභාවට ආදායමක් ලබා ගැනීම

**04. ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්.එච්. කරුණාසේන දයාතිලක මහතා**

i. රජගල පුරාවිද්‍යා භූමිය සංචාරකයන්ට පහසුකම් සැපයීම සඳහා වන ව්‍යාපෘතිය
ii. රජගලතැන්න මංසන්ධියේ ප්‍රාදේශිය සභාව මඟින් කඩ කාමර පේලිය සාදා බදු දීම

**05. ස්ථානාධිපති. පොලිස් ස්ථානය, බක්කිඇල්ල**

i. රාත්‍රී කාලයේදී ප්‍රධාන හන්දිවල හා අනතුරුදායක ස්ථානවල වීථි ලාම්පු සවි කිරීම හා අලුත්වැඩියාව
ii. නුගේලන්ද සතිපොළ භූමියේ පිරිසිදු කිරීම හා ලදු කැලෑ ඉවත් කිරීම
iii. රජගලතැන්න හා නුගේලන්ද ගම්මාන වල දිවෙන අතුරු මාර්ගවල කාණු පද්ධති සකස් කිරීම
iv. අතුරු මාර්වල දෙපස අනවසර වැටවල් ආදිය හා අනතුරු දායක ගස් ඉවත් කිරීම අදාල නිවසියන් දැනුවත් කර ඉවත් කිරීම සඳහා නියෝග යොමු කිරීම
v. සුසාන භූමි නිරවුල් කිරීම හා එම භූමිවල ඇති මාර්ගය සකස් කිරීම
vi. සිදුකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම
vii. පොලිස් වසම්වල ජනාකීර්ණ ස්ථාන 02 ක් තෝරා ගනිමින් දැනුවීම් ප්‍රදර්ශන පල කිරීම

මෙම යෝජනා වලටද මූලිකත්වය දෙමින් 2023 වර්ෂය සඳහා පහත පරිදි ආදායම් හා වියදම් ඇස්තමේන්තු සකස් කරන ලදි.

## 2023 වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.

(2022 **වර්ෂයේ ආදායම් හා වියදම්** ඇස්තමේන්තු පදනම් කර**මින්** හා **2022.08.24** වන දිනැති මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව සමග පැවති සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ පදනම් කරගෙන මෙම ඇස්තමේන්තු සකස් කිරීම සිදුකරන ලදි.)

**2023** ආදායම් වියදම් ඇස්තමේන්තු සකස් කරන ලදි.)

<u>2023 වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම.</u>

01. <u>පොදු පරිපාලනය</u>

**<u>1/11 වරිපනම් බදු</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 වෙනි වගන්තියේ සිට 167 වෙනි වගන්ති දක්වා අර්ථකථනය කර ඇති පරිදි හා 2007 වරිපනම් බදු තක්සේරුවට අදාළ ව වාර්ෂික ඇස්තමේන්තු වටිනාකම වන රු1,044,784.95 ඇතුලත් කර ඇත.

**<u>1/16 ව්‍යාපාර බදු</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 152 වගන්තිය ප්‍රකාරව මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු ආදායම ඉක්මවා ආදායම ලැ**බී** ඇති බැවින් රු. 1,350,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

**<u>1/35 වාහන හා සත්ත්ව බදු</u>**

1988 අගෝස්තු 23 වැනි දිනැති ගැසට් නිවේදනයේ යෝජනා අංක 06 හි අතුරු ව්‍යවස්ථාව අනුව රු. 50,000.00 මෙම ඇස්තමේන්තුවට උපකල්පනය කර ඇත.

**1/36 විථි රේඛා පරීක්ෂා කිරීමේ ගාස්තු**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මීට පෙරද සභාව විසින් ගෙන ඇති තීරණයට අනුව 2023 වර්ෂය සඳහාද රු. 250,000.00 අයකළ යුතු යැයි උපකල්පනය කර යෝජනා කර ඇත.

**1/52 උසාවි දඩ**

2019 අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක කළ වාහන පැදවීමේ දී රියැදුරන් විසින් සිදුකරන වැරදි හේතුවෙන් යෝජිත දඩ මුදල් සංශෝධනයද සලකා බලා මේ වසරේ රු. 4,500,000.00 ඇස්තමේන්තු කරන ලදි.

**1/61 පොලී**

සභාව නමින් තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතුවලින් වාර්ෂිකව ලැබෙන පොලිය අදායමට රු.200,000.00 ලබා ගැනීමට අපේක්ෂිතව ඇත..

**1/62 විකුණුම්**

2021 හා 2022 ලැබීම් සැලකිල්ලට ගෙන මෙම වර්ෂය සඳහා රු, 100,000.00 ඇස්තමේන්තු කර ඇත.

**1/63 අභ්‍යන්තර බිල් කිරීම්**

2022 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට ගෙන මුද්දර ගාස්තු හා කුළුණු ආදායම මත රු. 4,800,000.00 දක්වා ඇස්තමේන්තු කර ඇත.

**1/64 ක්‍රියාත්මක ආදායම්**

2021වර්ෂයේ දී සේවක තෘප්තිය සලකා බලා සේවක අභිප්‍රේරණ ක්‍රියාමාර්ගයක් ලෙස ආපදා ණය අත්තිකාරම් ලබා දීම හේතුවෙන් එමගින් ලැබෙන පොළී ආදායම සැලකිල්ලට ගෙන රු. 150,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

## 02. සෞඛ්‍ය සේවා

**2/31 වෙළඳ බලපත්‍ර**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තිය **ප්‍රකාරව** හා පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් **මේ** දක්වා ලැබුණු බදු මුදල් සීමාවද සැලකිල්ල ට ගෙන රු. 800,000 ක් දක්වා ඇස්තමේන්තු කර ඇත.

**2/36 පරිසර බලපත්‍ර**

මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට ගෙන වසර 03කට වරක් පමණක් පරිසර බලපත්‍ර නිකුත් කරන බැවින් හා 2022 ඇස්තමේන්තුවද සැලකිල්ලට ගෙන රු. 350,000 ක් දක්වා ඇස්තමේන්තු කර ඇත.

**2/41 ලියාපදිංචි කිරීමේ ගාස්තු හා පරීක්ෂා කිරීමේ ගාස්තු**

මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට ගෙන රු. 150,000 ක් දක්වා ඇස්තමේන්තු කර ඇත.

**2/43 අයකර ගත හැකි ගාස්තු (සුනඛ)**

මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට ගෙන සුනඛ එන්නත් කිරීමේ ගාස්තු රු. 750,000.00 ඇස්තමේන්තු කර ඇත.

## 03. භෞතික සැලසුම් මංමාවත් හා ගොඩනැගිලි

**3/21 පදිංචි නිවාස**

2023 වර්ෂය සඳහා රු.25,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

**3/24 බදු දීම (ග්‍රේඩරය/ගල්රෝල්)**

2021 වර්ෂයේ ලැබීම් හා 2022 වර්ෂයේදී ඇස්තමේන්තුව සැලකිල්ලට ගෙන රු. 5,500,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

**3/25 කුලියට දීම.(භූමිය)**

1988 අගෝස්තු 23 වැනි දිනැති ගැසට් නිවේදනයේ යෝජනා අංක 28 හි අතුරු ව්‍යවස්ථාව අනුව ජංගම අළෙවි රථ,ජංගම අළෙවි ප්‍රවර්ධනය හා වැඩසටහන් සඳහා රු.250,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත

**3/36 දීර්ඝ කාලීන පරීක්ෂාව**

2022 වර්ෂයේ ඇස්තමේන්තුව සැලකිලල්ට ගෙන රු 1000 දක්වා ඇස්තමේන්තු කර ඇත.

**3/41 ලියාපදිංචි කිරීමේ ගාස්තු හා පරීක්ෂා කිරීම**

ගොඩනැගිලි අයදුම්පත් පරික්ෂා කිරීමට අදාළව 2022 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට ගෙන රු 650000.00 ඇස්තමේන්තු ඇත.

**3/42 සේවා සඳහා ගාස්තු**

සේවා සඳහා රු 100,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

05. **වෙනත් උපයෝගි සේවා**

**5/22 කුලී මුදල්**

2022 .08.09 දින ගන්නා ලද සභා තීරණය අනුව නව ගිවිසුමට අනුව ටෙන්ඩර් කිරීමට නියමිත බැවින් හා 2022 වර්ෂයේ කඩබදු කුලිය පදනම් කරගෙන රු 2,520,000.00 ඇස්තමේන්තු කර ඇත.

**5/24 බදු දීම (පොළ බදු)**

2023 වර්ෂය සඳහා රු.4,000,000.00 දක්වා ඇස්තමේන්තු කර ඇත.

**5/25 අයකර ගත හැකි ගාස්තු**

ප්‍රාදේශිය සභා මාර්ග වල වැලි හා පස් ප්‍රවාහනය වෙනුවෙන් රු.100. 00ක ගාස්තුවක් අය කිරීම වෙනුවෙන් බදු මුදල් අය කිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා රු. 2,000,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

**5/52 දඩ**

2021 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට කඩකුලී හා පොල බදු ගෙවීම ප්‍රමාද වුවහොත් අයකිරීම සඳහා රු 50,000.00 ක මෙම මුදල ඇස්තමේන්තු කර ඇත.

06. **සුභ සාදක සේවා ගාස්තු**

**6/15 විනෝද බදු**

2021 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට ගෙන හා වෙසක් උත්සවයෙන් ආදායම් අපේක්ෂාවෙන් රු 400,000.00 ඇස්තමේන්තු කර ඇත.

**6/16 වෙනත් (ප්‍රචාරක දැන්වීම් පුවරු)**

1988 අගෝස්තු 23 වැනි දිනැති ගැසට් නිවේදනයේ යෝජනා අංක 39 හි අතුරු ව්‍යවස්ථාව අනුව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය,සවි කිරීම සඳහා යෝජිත බදු මුදල් සීමාවට අදාළව ගෙන රු 450,000.00 ඇස්තමේන්තු කර ඇත.

**6/43 අයකර ගතහැකි ගාස්තු**

රජගල කන්ද නැරඹීම සඳහා එන පිරිස් සඳහා ටිකට්පතක් නිකුත් කිරීම මගින් ආදායම් ලබා ගැනීමට අපේක්ෂා කරන බැවින් රු 250,000.00 ක මුදල ඇස්තමේන්තු කරන ලදී.

**6/52 දඩ**

2021 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ලැබීම් සැලකිල්ලට පුස්තකාල පොත් ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් දඩ මුදල් අයකිරීම පදනම් කරගෙන රු 7000.00 ඇස්තමේන්තු කර ඇත.'

## 2023 වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම.

**(2022 වර්ෂයේ ආදායම් හා වියදම් ඇස්තමේන්තු පදනම් කරමින් හා 2022.08.24 වන දිනැති මුල්‍ය හා ප්‍රතිපත්ති කමිටුව සමග පැවති සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ පදනම් කරගෙන මෙම ඇස්තමේන්තු සකස් කිරීම සිදුකරන ලදී.)**

01. පොදු පරිපාලනය

**101(1)II** අනියම් වැටුප්

2023 වර්ෂයේ අනියම් සේවකයින් ගේ වැටුප් සඳහා රු 600,480.00 ඇස්තමේන්තු කරන ලදි.

**101(2)** අතිකාල හා නිවාඩු දින වැටුප්

2021 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ අතිකාල ගෙවීම් සීමා කිරීම හේතුවෙන් රු 150,000.00 ක මෙම මුදල ඇස්තමේන්තු කර ඇත.

**101(6)II** ජීවන වියදම් දීමනා

2023 වර්ෂයේ අනියම් සේවකයින් ගේ වැටුප් සඳහා රු' 247,200.00 ඇස්තමේන්තු කරන ලදි.

**101(9)** පුහුණු දීමනා

2023 වර්ෂයේ පුහුණුවීම් සඳහා දෙදෙනෙකුට අවස්ථාව ලබා දීමට අදහස් කරන බැවින් රු 240,000.00 ඇස්තමේන්තු කර ඇත. එසේම වරිපනම් තක්සේරු කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත පුහුණු නිලධාරීන් දෙදෙනතු බඳවා ගැනීමේ අපේෂාවෙන් රු 100,000.00 ඇස්තමේන්තු කර ඇත.

**102(1)** ගමන් වියදම්

2021 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ගෙවීම්,සැලකිල්ලට ගෙන හා මෙම වර්ෂයේ ගමන් වියදම් ගෙවීම සීමා කිරීම මත රු 200,000.00 ක මෙම මුදල ඇස්තමේන්තු කර ඇත.

**103(1)** ලිපිද්‍රව්‍ය හා උපකරණ

2021 වර්ෂයේ ඇස්තමේන්තුවට වඩා වැඩිපුර ඇස්තමේන්තු කිරීමට හේතුව වුයේ සභා වාර්තාව,කමිටු වාර්තා,අයවැය වාර්තා සඳහා A4 කොළ හා ලියාපදිංචි කිරීමේ ගාස්තු වල මිල අධික වීම හේතුවෙන් රු. 800,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**103(2)** ඉන්දන හා ස්නේහක තෙල්

මේ වර්ෂයේ ගෙවීම්,සැලකිල්ලට ගෙන හා ඉන්ධන මිල අධික ලෙස ඉහල යාම හේතුවෙන් මෙම වියදම සඳහා රු. 1,000,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**103(3)** යන්ත්‍රසුත්‍ර හා විදුලි භාණ්ඩ

කාර්යාලයට අවශ්‍ය උපකරණ හා වීථි ලාම්පු සඳහා රු 1,000,000.00 ක මුදල ඇස්තමේන්තු කර ඇත.

**103(7)** නිල ඇඳුම්

කාර්යාලයේ මුරකරුවන්ගේ හා අදායම් පරිපාලක නිළධාරීන්ගේ (පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 1/2018 අනුව) නිළ ඇදුම් දීමනා සඳහා රු 89,000.00 ක මුදල ඇස්තමේන්තු කර ඇත.

**103(8)** වෙනත් ගබඩා ද්‍රව්‍ය

කාර්යාලයේ භාවිතය සඳහා වු වෙනත් ගබඩා ද්‍රව්‍ය සඳහා රු,' 20,000.00 වෙන් කරන ලදි.

**104(1) වාහන යන්ත්‍රසුත්‍ර හා උපකරණ අළුත්වැඩියාව**

කාර්යාලයේ භාවිතා වන වාහන යන්ත්‍ර සුත්‍ර හා උපකරණ අළුත්වැඩියාව සඳහා වෙන් කරන ලද අතර මේ වසරේදී වියදම සැලකිල්ලට ගෙන අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට රු 700,000.00 ඇස්තමේන්තු කරන ලදි.

**104(2)** ගොඩනැගිලි පහසුකම් හා වෙනත්

කාර්යාලීය කටයුතු සඳහා භාවිතා වන ගොඩනැගිලි පහසුකම් සඳහා වෙන් කරන ලද අතර මේ වසරේදී කාර්යාලයේ සුළු අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට සිදුවුවහොත් ඒ සඳහා රු. 250,000.00 ක් ඇස්තමේන්තු කරන ලදි.

**104(3)** ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව

කාර්යාලීය කටයුතු සඳහා භාවිතා වන උපකරණ අළුත්වැඩියා සඳහා රු.800,000.00 ක් ඇස්තමේන්තු කරන ලදි.

**105(2)** සම්බන්ධතා

කාර්යාලීය කටයුතු සඳහා භාවිතා වන දුරකථන,අන්තර්ජාල පහසුකම් ආදි කටයුතු සඳහා රු. 300,000.00 ක් මුදල ඇස්තමේන්තු කරන ලදි.

**105(3)** ආවශ්‍යක සේවා

කාර්යාලීය කටයුතු සඳහා භාවිතා වන විදුලි බිල්පත්, ජල බිල්පත් පහසුකම් ආදි කටයුතු සඳහා රු.500,000.00 ක් මුදල ඇස්තමේන්තු කරන ලදි.

**105(9)** වෙනත් සේවා

කාර්යාලීය කටයුතු සඳහා භාවිතා වන වෙනත් සේවා , නීතිඥ ගාස්තු, සඳහා රු 200,000.00 ක මෙම මුදල ඇස්තමේන්තු කරන ලදි.

**107(2)** සුභ සාධන ගෙවීම්

2020 වර්ෂයේ සිට සැම සභා වාරයක් සඳහාම තේ හා අවශ්‍ය වුවහොත් දිවා ආහාරය ලබා දීම වෙනුවෙන්. ගරු මන්ත්‍රීවරුන්ට හා කාර්යය මණ්ඩලයේ සියළුම දෙනා වෙනුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා තේ වියදම්,දිවා ආහාරය ලබා දීම සඳහා රු 150,000.00 ක මෙම මුදල ඇස්තමේන්තු කරන ලදි.

02. **සෞඛ්‍ය සේවා**

**201(1)II** අනියම් වැටුප්

2023 වර්ෂයේ අනියම් සේවකයින් ගේ වැටුප් ගෙවීම සඳහා රු 1,164,000.00 ඇස්තමේන්තු කරන ලදි.

**201(2)** අතිකාල හා නිවාඩු දින වැටුප්

2021 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ අතිකාල ගෙවීම් සීමා කිරීම හේතුවෙන් රු 150,000.00 ක මෙම මුදල ඇස්තමේන්තු කර ඇත.

**201(6)II** ජීවන වියදම් දීමනා

2023 වර්ෂයේ අනියම් සේවකයින් ගේ වැටුප් සඳහා රු' 494,400.00 ඇස්තමේන්තු කරන ලදි.

**201(9)** වෙනත් දීමනා(මහජන සෞඛ්‍ය පරීක්ෂක හා පරිසර කම්ටු දීමනා)

2023 වර්ෂයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක දිමනා හා කම්කරු දීමනා හා තේ වියදම් සඳහා රු 227,000.00 ඇස්තමේන්තු කරන ලදි.

**202(1)** ගමන් වියදම්

2022 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ගෙවීම් සැලකිල්ලට ගෙන රු 50,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

**203(1)** ලිපි ද්‍රව්‍ය හා උපකරණ

2023 වර්ෂයේ දි සෞඛ්‍ය සේවා කටයුතු සිදුකිරීමේදී අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා උපකරණ සඳහා රු 300,000.00 වෙන් කරන ලදි.

**203(2)** ඉන්දන හා ස්නේහක තෙල්

කම්පැක්ටරය හා සෞඛ්‍ය කාර්යයයන් සඳහා භාවිතා වන වාහන සඳහා ඉන්ධන මිල අධික ලෙස ඉහල යාම හේතුවෙන් අවශ්‍ය ඉන්දන වියදම් සඳහා රු 800,000.00 වෙන් කරන ලදි.

**203(5)** වෛද්‍ය සැපයුම්

සෞඛ්‍ය අංශයේ සේවය කරන සේවකයින්ගේ වෛද්‍ය සැපයුම් ආදි කටයතු සඳහා රු 50,000.00 වෙන් කරන ලදී.

**203(7)** නිල ඇදුම්

සෞඛ්‍ය අංශයේ සේවය කරන සෞඛ්‍ය කම්කරුවන් සඳහා රු 36,000.00 ක මෙම දිමනා වෙන් කර ඇත.

**203(8)** වෙනත් ගබඩා ද්‍රව්‍ය

සෞඛ්‍ය අංශයේ විවිධ කාර්යයන් සඳහා අවශ්‍ය ගබඩා ද්‍රව්‍ය සඳහා රු 25,000.00 ක මෙම දිමනා වෙන් කර ඇත.

**204(1)** වාහන යන්ත්‍ර සුත්‍ර හා උපකරණ අළුත්වැඩියාව

කම්පැක්ටරය හා සෞඛ්‍ය කාර්යයයන් සඳහා භාවිතා වන වාහන යන්ත්‍ර සුත්‍ර හා උපකරණ අළුත්වැඩියාව සඳහා රු 500,000.00 ක් වෙන් කරන ලදි.

**204(5)** කාණු නඩත්තු

නගරයේ කාණු පද්ධතිය නඩත්තු කිරිම සඳහා රු 300,000.00 ක් වෙන් කරන ලදී.

**205(3)** ආවශ්‍යක සේවා(වැසිකිළි)

පොදු වැසිකිළි වැනි ස්ථාන සඳහා ජල බිල්පත් ගෙවීම සඳහා රු 100,000.00 ක මුදල ඇස්තමේන්තු කරන ලදී.

**205(6)** සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා

සුනඛ එන්නත් කිරීම්,ඩෙංගු වැනි කාර්යයන් සඳහා රු 100,000.00 ක මුදලක් වෙන් කර ඇත.

**207(2)** සුභ සාදන ගෙවීම්

සෞඛ්‍ය අංශයේ සුභ සාදන ගෙවීම් සඳහා රු 50,000.00 ක මුදලක් වෙන් කර ඇත.

**207(9)** සුභ සාදන ගෙවීම්

නගර සභාව සඳහා කසල ප්‍රවාහනය සඳහා රු 150,000.00 ක මුදලක් වෙන් කර ඇත.

03. **භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි**

**301(1)II** අනියම් වැටුප්

2023 වර්ෂයේ අනියම් සේවකයින් ගේ වැටුප් ගෙවීම සඳහා රු 1,510,440.00 ඇස්තමේන්තු කරන ලදි.

**301(2)** අතිකාල හා නිවාඩු දින වැටුප්

2021 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ අතිකාල ගෙවීම් සීමා කිරීම හේතුවෙන් රු 150,000.00 ක මෙම මුදල ඇස්තමේන්තු කර ඇත.

**301(6)II** ජීවන වියදම් දීමනා

2023 වර්ෂයේ අනියම් සේවකයින් ගේ වැටුප් සඳහා රු' 618,000.00 ඇස්තමේන්තු කරන ලදි.

**301(9)**වෙනත් දීමනා

2023 වර්ෂයේ ගොඩනැගිලි කමිටු දීමනා  සඳහා රු 127,000.00 ඇස්තමේන්තු කරන ලදි.

**302(1)** ගමන් වියදම්

2022 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ගෙවීම් සැලකිල්ලට ගෙන රු 50,000.00 ක් ඇස්තමේන්තු කර ඇත..

**303(1)** ලිපි ද්‍රව්‍ය හා උපකරණ

2023 වර්ෂයේ දි භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි කටයුතු සිදුකිරීමේදී අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා උපකරණ සඳහා රු 50,000.00 වෙන් කරන ලදි.

**303(2)** ඉන්දන හා ස්නේහක තෙල්

මෝටර් ග්‍රේඩරය,ගල්රෝල JCB යන්ත්‍ර ආදි භෞතික නඩත්තු කටයුතු සඳහා හා කුලියට දීම මත  හා ඉන්ධන මිල අධික ලෙස ඉහල යාම හේතුවෙන් රු 2,500,000.00 වෙන් කරන ලදි.

**303(7)** නිල ඇදුම්

සෞඛ්‍ය අංශයේ සේවය කරන සෞඛ්‍ය කම්කරුවන් සඳහා රු 44,000.00        ක් මෙම දිමනා වෙන් කරන ලදී.

**304(1)** වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව

මෝටර් ග්‍රේඩරය,ගල්රෝල JCB යන්ත්‍ර ආදි භෞතික නඩත්තු කටයුතු හා කුලියට දීම මත  අළුත්වැඩියාව වැඩිවිය හැකි බැවින් රු 1,000,000.00 ක මෙම මුදල වෙන් කරන ලදි.

**304(2)** ගොඩනැගිලි පහසුකම් හා වෙනත්

ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු කිරීම් සඳහා රු 60,000.00 වෙන් කර ඇත.

**304(4)** මංමාවත් පදික වේදිකා හා භෞතික නඩත්තු

නගරයේ මංමාවත් හි පදික වේදිකා නඩත්තු කිරිම සඳහා රු 150,000.00 වෙන් කර ඇත.

භාවිතා කෙරේ.

**307(9)** සුභ සාදන ගෙවීම්

සුභ සාධන කටයුතු සඳහා රු 10,000.00 ක මුදලක් වෙන් කර ඇත.

06. **සුභ සාදන සේවා**

**601(9)** වෙනත් දීමනා (පෙර පැසල්)

පෙර පාසල් සඳහා රු 50000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

**602(1)** ගමන් වියදම්

2022 වර්ෂයේ ඇස්තමේන්තුව හා මේ වර්ෂයේ ගෙවීම් සැලකිල්ලට ගෙන රු 10,000.00 ක් ඇස්තමේන්තු කර ඇත..

**603(1)** ලිපි ද්‍රව්‍ය හා උපකරණ

2023 වර්ෂයේ දී පුස්තකාල හා පෙර පාසල් සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා උපකරණ,පත්තර බිල්පත් සඳහා රු 150,000.00 වෙන් කරන ලදි.

**604(2)** ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තුව

පුස්තකාල හා පෙර පාසල් ගොඩනැගිලි නඩත්තුව සඳහා රු 150,000.00 ක් වෙන් කර ඇත.

**604(9)** වෙනත්(වෙසක් උත්සවය)

වාර්ෂික වෙසක් උත්සවය සඳහා රු 350,000.00 ක් වෙන් කර ඇත.

**604(9)** වෙනත්(සාහිත්‍ය කටයුතු)

පෙර පාසල් සාහිත්‍ය කටයුතු සඳහා රු 25000.00 ඇස්තමේන්තු කර ඇත.

**607(2)** සුභ සාදන ගෙවීම්

පුස්තකාල, පෙර පාසල් හා පාසල් දිරිමත් කිරිමේ වැඩසටහන් හා හදිසි ආපදා තත්වයන් සඳහා සහා අරමුදලින් ආධාර ලබා දීම සඳහා රු 400,000.00 ක් වෙන් කර ඇත.

**607(9)** වෙනත්

පුස්තකාල, පෙර පාසල් හා පාසල් හි වෙනත් ගෙවීම් සඳහා රු 5000.00 භාවිතා කෙරේ.

02. කියවීම් මාසය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්ම කිරීම හා ඇස්තමේන්තු අනුමත කිරීම

සෑම වසරකම ඔක්තොම්බර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. එය නිමිති කොට ගෙන අප ආයතනයේ පුස්තකාල මගින් මේ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ සඳහා රු. 30000.00 ක පමණ මුදලක් වැය වන බැවින් එම මුදල වැය කිරීම සඳහා ඇස්තමේන්තුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. මේ සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශය ලබා දී ඇත.

03. 2023 වර්ෂයේ ආදායම් අය කර ගැනීමට ගැසට් පත්‍රයේ පල කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම

2023 වර්ෂයට අදාළ ආදායම් අය කර ගැනීමේ ගැසට් පත්‍රය පල කිරීම සඳහා පහත නිර්දේශයන් වලට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව එළඹෙන ලදී.

## 02. උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වන උප වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2022 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2022 වර්ෂයේ ආදායම මෙහි පහත උප ලේඛනයේහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2023 මාර්තු 31 දිනට ප්‍රථම උහන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි තීරණය කරමි.

ඉහත කී උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
|---|---|
| 2022 වර්ෂයේදී ආදායම | රු. ශත. |
| රු. 6000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු. 6000 ඉක්මවන එහෙත් රු. 12000 නොඉක්මවන අවස්ථාවක | රු. 90.00 |
| රු. 12000 ඉක්මවන නමුත් රු. 18750 නොඉක්මවන අවස්ථාවක | රු. 180.00 |
| රු. 18750 ඉක්මවන නමුත් රු. 75000 නොඉක්මවන අවස්ථාවක | රු. 360.00 |
| රු. 75000 ඉක්මවන නමුත් රු. 150000 නොඉක්මවන අවස්ථාවක | රු. 1200.00 |
| රු. 150000 ඉක්මවන අවස්ථාවක | රු. 3000.00 |

## 03. **උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළව වරිපනම් පැනවීමේ යෝජනාව**

ඉහත කී යෝජනාව

(අ) 1987අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් උහන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුකල ප්‍රදේශය ඇතුලත පිහිටි සියලුම නිවාස වල, ගොඩනැගිලි වල, ඉඩම්වල, ගෙපත්වල 2023 වාර්ෂික වටිනාකම සඳහා 2007 වර්ෂයේ තක්සේරු කරනු ලදුව 2022 වර්ෂයේදී පිළිගෙන ක්‍රියාත්මක කරන ලද වාර්ෂික වටිනාකම 2023 වර්ෂයේ පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 10% ක වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (6) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුලදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙසද, බද්දට යටත් වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට උහන ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

## 04. **උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාව**

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය හා 151 වගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්ති යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා උහන ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට

බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (3) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2023 මාර්තු 31 දිනට ප්‍රථම උහන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි තීරණය කරමි.

| 1 වන තීරය | 11 වන තීරය | | |
|---|---|---|---|
| | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| බලය දෙනු ලබන කාර්යය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| ***අන්තරාදායක ව්‍යාපාර*** | | | |
| කබොක් ගල්, බොරළු ගල් කළු ගල් කැණීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඉන්ධන පිරවුම් හල් | 500.00 | 750.00 | 1000.00 |
| වැලි ගොඩ දැමීමේ හා අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බොරළු පස් කැණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යාන්ත්‍රික ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යාන්ත්‍රික නොවන ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පාපැදි හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ධාන්‍ය එක්රැස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| බලය දෙනු ලබන කාර්යය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| වාහන විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| යන්ත්‍රානුසාරයෙන් කළු ගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගඩොල් හෝ උළු නිපදවීම හා පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කාබනික පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හා අළෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| දුම් කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම හා අළෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රානුසාරයෙන් කෝපි ධාන්‍ය වර්ග මාංශ භෝග කුළු බඩු හෝ පිටි ඇඹරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| පස් කැණීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගෑස් අළෙවිය හා බෙදා හැරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යාන්ත්‍රිකව වැලි සේදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඉන්ධන පිරවුම්හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පෙරමුසු කොන්ක්‍රීට් ස්ථානයක් පවත්වාගෙන යාම (කාපට්) | | | |
| විද්‍යුත් ලෝහ ආලේපන කරන ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| බැටරි චාර්ජ් කිරීමේ හෝ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මෝටර් වාහන සේවා කිරීම හෝ අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලි බලය පාවිච්චි කර වී කෙටීම හෝ සහල් පාහින මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4. අශ්ව බල 01 සිට 10 දක්වා<br>5. අශ්ව බල 10 සිට 20 දක්වා<br>6. අශ්ව බල 20 ට වැඩි | 500.00<br>500.00<br>500.00 | 750.00<br>750.00<br>750.00 | 1000.00<br>1000.00<br>1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |

| | | | |
|---|---|---|---|
| | | 1500.00 නොඉක්මවන අවස්ථාවක | |
| ඉන්ධන භාවිතා කර වී කෙටීම හෝ සහල් පැහීමේ මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4. අශ්ව බල 01 සිට 10 දක්වා | 500.00 | 750.00 | 1000.00 |
| 5. අශ්ව බල 10 සිට 20 දක්වා | 500.00 | 750.00 | 1000.00 |
| 6. අශ්ව බල 20 ට වැඩි | 500.00 | 750.00 | 1000.00 |
| දැව නොවන ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| වැල්ඩින් වැඩපලක් පවත්වා ගෙන යාමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ග්‍රෝස් 10ට වැඩි ප්‍රමාණයක් ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඇසිඩ් වර්ග හා ස්ප්‍රීත්තු වර්ග ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| සිසිල් බීම නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| අයිස් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| එළවළු තෙල් හෝ පොල් තෙල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| කොහු හෝ වෙනත් කෙදි වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| කොහු හෝ වෙනත් කෙදි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ,ආයුධ, උපකරණ නිපදවීම) | 500.00 | 750.00 | 1000.00 |
| මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පුපුරණ ද්‍රව්‍යන් , පුපුරණ බෙහෙත් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |

| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|
| ***පීඩාකාරී ව්‍යාපාර*** | | | |
| මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 5. එළු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6. කුකුල් මස් විකිණීමේ ස්ථානයක් වත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 7. ඌරු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8. ගව මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුකුල් ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම හෝ එම භාණ්ඩ පමණක් විකිණීමට තබා ඇති ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුලු කෑම හා ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| කරවල, ලුණු මාළු ජාඩි ගබඩා කර තබා ගැනිම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| බිත්තර විකුණන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බැටළුවන්,කුකුළන්, ඌරන්, එළුවන්, හා එළ ගවයන් 25ට වැඩි ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුකුළන් හා කිකිළියන් 100කට වැඩි ගණනක් සඳහා ගාලක් හෝ කොටුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| සත්ව ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| සබන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| ලෝහ සුන්බුන් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| ගෘහ භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| වේවැල් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

| 1 වන තීරය | 11 වන තීරය | | |
|---|---|---|---|
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| සිරප් හෝ පලතුරු බීම නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| රස කැවිලි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම) | 500.00 | 750.00 | 1000.00 |
| රා එකතු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| විනාකිරි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| දැව ඉදිරීම | 500.00 | 750.00 | 1000.00 |
| පින්තාරු තීන්ත , වානිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| සෝඩා නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| පළතුරු,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරීම | 500.00 | 750.00 | 1000.00 |
| කෝපි , ධාන්‍ය වර්ග පිටි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| බේකින් පවුඩර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ලී භාණ්ඩ සඳහා වූ පොටි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| කපුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| රෙදිසෝදන නිල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| සුවඳ විලවුන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| පාසල් රටහුණු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් හෝ ටියුබ් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් නැවත පිරවීම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටර් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| වැලි කඩදාසි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ගඩොල් පිළිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500.00 | 750.00 | 1000.00 |
| උළු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| නිමි ඇදුම් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| කුකුළු වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විෂබීජ නාශක නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| ටයර්/ටියුබ්/අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| සපත්තු බෑග් /සම්/ භාණ්ඩ නිෂ්පාදන කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| සිගරට්,බීඩි,සුරුට්ටු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| ***වෙනත්*** | | | |
| බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බත් කඩයක්/හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| තේ,කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| එළවළු හා පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| රස කැවිලි වර්ග නිෂ්පාදනය ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බේකරි නිෂ්පාදන අලෙවි කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කිරි එකතු කිරීමේ, ශිත කිරීමේ  අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුළු බඩු පැකට් කිරීම හා අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| අයිස් ක්‍රීම්, යෝගට් ආදී ශීතකරණ ලද ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| බිම්මල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පපඩම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| මී කිරි, පස්ගෝ රස නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| පළතුරු යුෂ නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු , කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| ඩ්‍රයික්ලීන් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 1 වන තීරය | 11 වන තීරය | | |
| | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| බලය දෙනු ලබන කාර්යය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| තෙල් හෝ සත්ව මේදය නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වාඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| කෘමි නාශක, දිලීර නාශක,පැළෑටි හෝ පළිබොධ නාශක නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| විෂබීජ නාෂක නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| මදුරු දඟර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| වීදුරු භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| කැඩපත් , වීදුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| යකඩ තහඩු ගැල්වනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| වායු සමීකරණ යන්ත්‍ර , ශිතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රෝපකරණ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලි භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| ඉලෙක්ට්‍රොනික උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| වී මෝල් | 500.00 | 750.00 | 1000.00 |
| මීනි පෙට්ටි තැනීම | 500.00 | 750.00 | 1000.00 |
| දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| අවමංගල්‍ය සේවා මධ්‍යස්ථානය (මල් ශාලාව) පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

## 05. **උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව**

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් හා 151 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි I තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයිද,

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (3) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත 2023 මාර්තු 31 දිනට පෙර උහන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි තීරණය කරමි.

ඉහත කී උපලේඛනය

| I වන තීරය | II වන තීරය | | |
|---|---|---|---|
| | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| කර්මාන්තය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| පාවහන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| වීදුරු ආශ්‍රිත නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| පොල්තෙල් නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| සබන්, සුවඳ විලවුන් නිෂ්පාදනය හා අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ඉටිපන්දම් වර්ග නිෂ්පාදනය, විකිණීම හා ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් වඩු වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| ප්ලාස්ටික්, ෆයිබර් ආශ්‍රිත වැඩපලක් හෝ කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |

| I වන තීරය | II වන තීරය | | |
|---|---|---|---|
| | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| කර්මාන්තය | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| ලොරිබොඩි සාදන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කඩදාසි බෑග් නිෂ්පාදනය හා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කුෂන් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මෙට්ට නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| විද්‍යුත් ලෝහාලෝපණය කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| මෝටර් වාහන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම, සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| විදුලිකර්මාන්ත වැඩපලක් හෝ කැසට් රේඩියෝ රූපවාහිණී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| කොහු හෝ වෙනත් කෙදි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| යන්ත්‍රෝපකරණ භාවිතා කරන ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| ටයර් හෝ ටියුබ් වොල්කනයිසින් කිරීම හා ටයර් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| බ්ලොක් ගල් හා සිමෙන්ති ආශ්‍රිත නිශ්පාදන හා අළෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| ඉහත සඳහන් නොවන වෙනත් ව්‍යාපාරයක් | 500.00 | 750.00 | 1000.00 |

## 06. **උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව**

ඉහත කී යෝජනාව

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේදී පහත උප ලේඛනයෙහි I තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ

සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා අය කළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තියේ (3) උප වගන්තිය ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම යථෝක්ත 2023 මාර්තු 31 දිනට පෙර ගෙවිය යුතු යැයි ද යෝජනා කරමි.

උපලේඛණය

| I තීරුව | II තීරුව |
|---|---|
| | රු. ශත. |
| මෝටර් රථයක්, මෝටර් ත්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ත්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ත්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| (අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| සෑම ඇතෙකු සඳහා | 50.00 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උප ලේඛනයෙහි වෙළඳ කාර්යන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

## 07. **උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළව පෝරම, සහතික පත්‍ර නිකුත් කිරීමේ හා සේවා ගාස්තු පැනවීමේ යෝජනාව**

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය සඳහා පහත දක්වා ඇති පෝරම, සහතික පත්‍ර නිකුත් කිරීමේ හා සේවා සඳහා පහත අනුරූප සටහනෙහි නිරූපිත ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

10. වීථි රේඛා සහතික නොපවරා ගැනීමේ සහතික පෝරම ගාස්තු රු. 250.00
11. වීථි රේඛා සහතික නොපවරා ගැනීමේ, සහතික පරීක්ෂා කිරීමේ ගාස්තු රු. 3000.00
12. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු රු. 3**00.00**
13. ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීමේ ගාස්තු

| විශාලත්වය | නේවාසික | වාණිජ |
|---|---|---|
| වර්ග අඩි 500 ට අඩු | රු **1000.00** | රු **2000.00** |
| වර්ග අඩි 501 සිට 800 දක්වා | රු **2000.00** | රු **3500.00** |
| වර්ග අඩි 801 සිට 1000 දක්වා | රු **2500.00** | රු **4500.00** |
| වර්ග අඩි 1001 සිට 1500 දක්වා | රු **3500.00** | රු **5500.00** |
| වර්ග අඩි 1501 සිට 2000 දක්වා | රු **4500.00** | රු **6000.00** |
| වර්ග අඩි 2001 සිට 2500 දක්වා | රු **5500.00** | රු **7500.00** |
| වර්ග අඩි 2501 සිට 3000 දක්වා | රු **6500.00** | රු **8500.00** |
| වර්ග අඩි 3000 ට වැඩි | රු **7500.00** | රු **9800.00** |
| තාප්පයක් සඳහා දික් අඩි 01 කට | රු **100.00** | රු **200.00** |

14. සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීම සඳහා ගාස්තු
    0m සිට 20m දක්වා — රු 50000.00
    20m සිට වැඩි වන සෑම 1m සඳහාම — රු 10000.00
15. අනුකූලතා සහතිකයක් සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු — රු **3000.00**
16. සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු — රු 2500.00
17. ගොඩනැගිලි ඉදිකිරීම පෙරසැරි ගාස්තුව

| ගෙබිමේ විශාලත්වය | පදිංචිය සඳහා එක් වර්ග මීටරයක් රු | වාණිජ හෝ වෙනත් රු |
|---|---|---|
| 45 අඩු | 10.00 | 50.00 |
| 45-90 | 25.00 | 100.00 |
| 91-180 | 50.00 | 200.00 |
| 181-270 | 200.00 | 500.00 |
| 271-450 | 500.00 | 750.00 |
| 451-675 | 750.00 | 1000.00 |
| 676-900 | 1000.00 | 1250.00 |
| 900 ට වැඩි | 1000.00 | 1250.00 |
| | වර්ග මීටර 90 ක් වන එක් එක් එක් ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 50 බැගින් | අමතර වර්ග මීටර 90 ක් වන එක් ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 50 බැගින් |

18. ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්ත

| ඉදිකිරීම් අදියර | නේවාසික වර්ග මීටර 01 | වාණිජ වර්ග මීටර 01 |
|---|---|---|
| 1. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කොට ඇති විට (කයිරු මට්ටම) | **100.00** | **200.00** |
| 2. වහල මට්ටම දක්වා ඉදිකොට ඇති (වහලය රහිතව) | **70.00** | **120.00** |
| 3. වහලය ඇතුළුව ඉදි කොට ඇති විට | 80.00 | 140.00 |
| 4. සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට | 100.00 | 160.00 |
| 5. මහල් නිවාස සඳහා (එක් මහලකට) | 100.00 | 160.00 |
| 6. තාප්පය සඳහා (දික් අඩියකට) | 100.00 | 200.00 |

16. පරිසර බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු — රු 250.00
17. පරිසර බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර — රු 100.00

18. පරිසර බලපත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු රු. 2000.00
19. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු රු. 4000.00
20. දීර්ඝ කාලීන බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තු රු. 300.00
21. දීර්ඝ කාලීන බලපත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු රු. 1500.00
22. වාර්ෂිකව ත්‍රී රෝද රථ ගාල්කිරීමේ ගාස්තු රු. 1000.00
23. බයිසිකල් තහඩු සඳහා සේවා ගාස්තු රු. 50.00
24. සුනඛයින් එන්නත් කිරීමේ සේවා ගාස්තු රු. 100.00
25. පුස්තකාල පෝරම ගාස්තු (පාසල් ළමුන් සඳහා) රු. 50.00
26. පුස්තකාල පෝරම ගාස්තු (වැඩිහිටියන් සඳහා) රු. 50.00
27. වරිපනම් නාම සංශෝධන පෝරම ගාස්තු රු. 200.00
28. පුස්තකාල ඇප තැන්පත් ගාස්තු (පාසල් ළමුන් සඳහා) රු. 100.00
29. පුස්තකාල ඇප තැන්පත් ගාස්තු (වැඩිහිටියන් සඳහා) රු. 300.00
30. භූමිය කුලියට දීම රු. 2000.00

## 08. **උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය, සවි කිරීම සඳහා ගාස්තු පැනවීමේ යෝජනාව**

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය සඳහා පහත දක්වා ඇති දැන්වීම් පුවරු ප්‍රදර්ශනය, සවි කිරීම හා ජංගම ප්‍රදර්ශනය සඳහා පහත අනුරූප සටහනෙහි නිරූපිත ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

බැනර්, පෝස්ටර්,කටවුට් සඳහා වර්ග අඩියකට ගාස්තු

| **I** වන තීරය | II වන තීරය | | | |
|---|---|---|---|---|
| | මාසයකට හෝ ඉන් කොටසක් සඳහා | | ලිත් වර්ෂයක් සඳහා | |
| | එක පැත්ත | දෙපැත්ත | එක පැත්ත | දෙපැත්ත |
| බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීම් සඳහා (වර්ග අඩියකට විදුලිය රහිත) | 50.00 | 100.00 | 150.00 | 200.00 |
| ලෑල්ලක් ආධාරයෙන් හෝ බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීම් සඳහා (වර්ග අඩියකට විදුලිය රහිත) | 50.00 | 75.00 | 150.00 | 200.00 |
| බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක් ආධාරයෙන් හෝ බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීම් සඳහා (වර්ග අඩියකට විදුලිය සහිත) | 75.00 | 150.00 | 175.00 | 250.00 |

## 09. **උහන ප්‍රාදේශීය සභාවවේ 2023 වර්ෂයට අදාළව විවිධ ගාස්තු පැනවීමේ යෝජනාව**

ඉහත කී යෝජනාව

අවුරුදු උත්සව අවස්ථා හා තාවකාලික වෙළඳසැල් වලින් 2023 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස 31ක් වන දින දක්වා කාලය තුළ උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛන I හි සඳහන් ගාස්තු ද සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන සන්දර්ශන සඳහා පහත උපලේඛන II හි සඳහන් ගාස්තු ද අය කරන බව මෙයින් යෝජනා කරනු ලැබේ.

**උපලේඛන I**

ජංගම වෙළඳාම හා ජංගම අළෙවි ප්‍රවර්ධනය හා තාවකාලික වෙළඳාම - (උපරිම දින පහක් පමණි) පහත අයිතමයන් සඳහා අය කරනු ලැබේ.

08. වාහන සඳහා එක් දිනකට රු. 2500.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
09. ලීබඩු උපකරණ/විදුලි උපකරණ එක් දිනකට රු. 1500.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
10. ආහාර පාරිභෝගික ද්‍රව්‍ය එක් දිනකට රු. 1000.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
11. (කිරි,යෝගට්,බීම වර්ග,රෙදිපිළි හා කාපට්, බෑග්,සෙරෙප්පු සපත්තු,මල් පැල, ප්ලාස්ටික් හා ඇළුමිනියම් උපකරණ ආදිය)
12. නෂ්‍ය භාණ්ඩ (එළවළු හා පළතුරු) සහ පාසල් උපකරණ, පොත්පත් සඳහා එක් දිනකට රු. 500.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
13. සන්නිවේදන කටයුතු හා ආයතන ප්‍රවර්ධන කටයුතු එක් දිනකට රු. 2000.00 (වැඩි වන දිනක් සඳහා මුල් දින අය කල අගයෙන් **50%**)
14. වෙනත් - වර්ග අඩියක් සඳහා දිනකට රු. 50.00

**උපලේඛන II**

02. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල තාවකාලික වෙළඳාම සඳහා සතියකට රු. 300.00

**උපලේඛන III**

3. තාවකාලික චිත්‍රපට දර්ශන, සර්කර්ස් දර්ශන, මැජික් සන්දර්ශන වෙනත් යම් සන්දර්ශනයක් සඳහා ප්‍රවේශ පත්‍ර වලින් 25% විනෝද බදු

4. සංගීත සන්දර්ශනයක් සඳහා ප්‍රවේශ පත්‍ර වලින් 25% විනෝද බදු

## 10. **උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ වාහන වල පාලනය හා ධාවනය හා බර පාලනය කිරීම සඳහා ගාස්තු අය කිරීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයෙහි ............ මස .......... දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

## උපලේඛනය

03. ගල්, වැලි ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය, පස්, වෙනත් ඛනිජ ද්‍රව්‍ය, රබර් ආශ්‍රිත නිෂ්පාදන.
කාලය පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා

| | | රු: ශත |
|---|---|---|
| (IV) | ට්‍රැක්ටර් ලෝඩ් එකක් ගමන් වාරයක් සඳහා | රු:- 100.00 |
| (V) | කියුබ් එකක වාහනයක් එක් ගමන් වාරයක් සඳහා | රු:- 100.00 |
| (VI) | ලොරි,ටිපර්,ට්‍රක් රථයක් සඳහා එක් වාරයක් සඳහා | රු:- 300.00 |

04. දර, උණ දඬු හා දැව කඳන් ප්‍රවාහනය

| | |
|---|---|
| ට්‍රැක්ටරයක් සඳහා එක් ගමන් වාරයකට | රු. 100.00 |
| ලොරි, ටිපර්,ට්‍රක් රථයක් එක් ගමන් වාරයකට | රු. 200.00 |
| ඇතුන් ලවා දැව කඳන් ඇද්දවීම, එක් දිනකට | රු. 500.00 |

## 11. උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ සති පොළ ගාස්තු අය කිරීමේ යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සති පොළෙහි 2023 වර්ෂය වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි බදු අය කිරීමට 2022 වර්ෂයෙහි .......... මස ............. දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 08. | ස්ථිර කඩ කාමරයක් සඳහා | රු. | 200.00 |
| 09. | තාවකාලික කඩ කාමරයක් සඳහා අවම ගාස්තු අය කිරීම (වර්ග අඩි 2x2) | රු. | 50.00 |
| 10. | තාවකාලික කඩ කාමරයක් සඳහා වර්ග අඩි 2x2 සිට වැඩි වන සෑම වර්ග අඩියකට | රු. | 5.00 |
| 11. | වෙළඳ ලොරියක් සඳහා | රු. | 200.00 |
| 12. | වෙළඳ වෑන් රථයක් ත්‍රී රෝද රථයක් සඳහා | රු. | 150.00 |
| 13. | මාළු ලෑල්ලක් සඳහා | රු. | 500.00 |
| 14. | සති පොළේ/භූමියේ වෙළඳාම් නොකරන සියලුම වාහන ගාල් කිරීම සඳහා (සතිපොළ භූමිය අවහිරවීම පිළිබඳ මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ) | රු. | 500.00 |

## 12. උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීමේ යෝජනාව

### ඉහත කී යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බල ප්‍රදේශය තුල යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් එම ඉඩම

විකිණීමෙන් ලත් මුදලින් 2023 වර්ෂය සඳහා උහන ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

## 13. උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වාහන කුලියට දීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයෙහි ............... මස .......... දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් මිල ගණන් යටතේ වාහන කුලියට දීම ගැසට් පත්‍රයේ පළ කිරීමට යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| | | |
|---|---|---|
| 08. ටොන් 01 ගල්රෝල දිනකට<br>රැඳවීම් ගාස්තු දිනකට (රු. **1**,000.00) | රු. | **6**,000.00 |
| 09. ටොන් 08 ගල්රෝල පැයකට<br>(නවතා තැබීමේ ගාස්තු 50% දිනකට අවම පැය 04) | රු. | 5,500.00 |
| 10. ටොන් 12 ගල්රෝල පැයකට<br>(රැඳවීම් ගාස්තු 50% දිනකට අවම පැය 04) | රු. | 12,000.00 |
| 11. JCB යන්ත්‍රය පැයකට කුලියට දීම (දිනකට අවම පැය 02) | රු. | 7,000.00 |
| 12. මෝටර් ග්‍රේඩරය පැයකට කුලියට දීම<br>(දිනකට අවම පැය 04) | රු. | 10,000.00 |
| 13. ජල බවුසර 01 ක් සඳහා (ජල ගාස්තු හැර) | රු. | 1,000.00 |
| 14. ට්‍රැක්ටරය දිනකට කුලියට දීම | රු. | 7.500.00 |

## 14. උහන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා රැස්වීම් ශාලාව කුලියට දීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව

1989 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයෙහි ............. මස ............ දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

| 1වන තීරුව | 11 වන තීරුව | |
|---|---|---|
| | රු. | ශත |
| 03. රැස්වීම් ශාලාව එක් දිනකට කුලියට දීමේ ගාස්තු | 3,000. | 00 |
| 04. ශබ්ධ විකාශන යන්ත්‍ර අවශ්‍ය වූ විට (1ක් දිනකට) | 1,500. | 00 |

**04. කඩ කාමර බදු ගෙවීමේ ගිවිසුම සම්බන්ධව 2022.08.09 දිනැති මහ සභාවේ ගනු ලැබූ තීරණයට අනුව ආර්.ජී. කුලරත්න නීතිඥ මහතා විසින් සකස් කරන ලද ගිවිසුම ප්‍රකාරව කඩ බදුකරුවන් හා ගිවිසුම්ගත වීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලදි.**

**එහිදී බදු ගිවිසුමෙහි සඳහන් ‘‘ගිවිසිලි’’ යන යෙදුම වෙනුවට ‘‘1-35 දක්වා පොරොන්දු වගන්ති’’ යන්න සඳහන් වීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදි. එසේම උහන කඩ කාමර රු. 6000.00 ක මුදලකටත් වැරැන්කැටගොඩ කඩ කාමර පද්ධතියේ උඩ තට්ටුවේ කඩ කාමර සඳහා**

රු. 5000.00 ක් යට තට්ටුවේ කඩ කාමර සඳහා රු. 7000.00ක මුදලකටත් නව බදු ගිවිසුම යටතේ ලබා දීමට කමිටුව විසින් අනුමත කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

**මෙම මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව අතට අරගෙන කියවා බැලුවේ නැති මන්ත්‍රීවරුන් මේ සභාවේ සිටින්නට පුළුවන් බවත් , එසේ නොකියවා සිට මෙම යෝජනා අයවැය කෙටුම්පතට දැමූ පසු විවිධ මත ඉදිරිපත් නොකර දැන්ම මෙහි සංශෝධනය කලයුතු දේවල් ඇත්නම් ප්‍රකාශ කිරීම සිදුකරන ලෙස පැහැදිලි කරන ලදි. මෙහි සංසෝධනය විය යුතු දේවල් තිබෙන බවත් , තිස්ස දසනායක ආදායම් පරීක්ෂකවරයා යෝජනා රාශියක් ඉදිරිපත් කර ඇති බවත් ,කමිටුවක් ලෙස එම මොහොතේ විරුද්ධවුනු යෝජනා නැවත මෙම ප්‍රතිපත්ති කමිටු වාර්තාවට ඇතුලත් කර ඇති බවත් , එම යෝජනා ඉවත් කරන ලෙසත් පෙන්වා දෙන ලදි.උහන සුසාන භූමිය ඉදිරිපස අඩි 20 ක ප්‍රමාණයක් වෙළදකුටි සඳහා රැකියා විරහිත පුද්ගලයන් හට ලබා දීම යන යෝජනාව ප්‍රතිපත්ති කමිටුවේදී විරුද්ධ වූ බවත් , ඒය නැවත කමිටු වාර්තාවට ඇතුලත් කර ඇති බවත් , එය ඉවත් කරන ලෙසත් පෙන්වා දෙන ලදි.තවද ගොනාගොල්ල හංදියේ ත්‍රී රෝද රථ ගාල විවෘත කිරීමේදී ලබා දී ඇති පෙට්ටි කඩ කිසිදු පුද්ගලයකු විසින් වෙළදාමක් නොකරන අතර , සභාවට මුදල්ද නොගෙවයි. එම පෙට්ටි කඩ උහන ළමා උද්‍යානය අසල භූමියට දමා දිනකට රු.300.00 මුදලකට ලබා දීම සුදුසු බව යන යෝජනාවද ඉවත් කරන ලෙස ප්‍රකාශ කලද එයද මෙම මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාවට නැවත ඇතුලත් කර ඇත.එම යෝජනාවද ඉවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.මාගේ කොට්ඨාශය තුල පෙට්ටි කඩ , රෝද කඩ , තියන්නට සූදානම් නොවන ලෙසත් , මම එය සිදු කිරීමට ඉඩ නොදෙන බවත් ප්‍රකාශ කරන ලදි. තවද දයාතිලක මන්ත්‍රීතුමාගේ යෝජනාවක් වන රජගලතැන්න මංසන්දියේ ප්‍රාදේශිය සභාව මගින් කඩකාමර පේලියක් සාදා බදු දීම යන්න ගැන කතා කල යුතු බවත් , ඒ සදහා ඉඩමක් හෝ ස්ථානයක් තිබෙනවාද යන්න විමසන ලදි.යෝජනාව හොද වුනත් ඉඩමක් නොමැතිව ඒය සිදු කරන්නේ කෙසේදැයි විමසන ලදි.**

**ගරු උප සභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

ගොනාගොල්ල මං සන්දියේ ත්‍රී රෝද රථ ගාලේ පෙට්ටි කඩ ගැන කතා කල නිසා මෙය පවසන බවත්, ගොනාගොල්ල ඇල ඉවුර සෝදාගෙන ගොස් තිබූ ස්ථානය පස් පුරවා කොන්ක්‍රීට් කර සකස් කර අලංකාරව සකස් කර සරත් විරසේකර මහතා විසින් පෙට්ටි කඩත් සකස්කර දුන් නිසා ගොනාගොල්ල ලස්සනට තිබෙන බවත්, ත්‍රී රෝද රථ ගාලේ මුදල් ක්‍රමවත්ව ලබාදෙන බවත් එහි අඩුපාඩු බලනවාදැයි කියා නොදන්නා බවත් , ප්‍රකාශ කරන ලදි.අලංකාර දෙස වහලක් සකසා ඇති බවත්, විදුලිය හා ජලය ලබා දී ඇති බවත් ,පෙන්වා දෙන ලදි.එමෙන්ම එතන තිබෙන කඩ පේලියේ දැනට මාළු කඩය පමණක් විවෘතව තිබෙන බවත් ,එක කඩයක් කැඩී විනාශ වී ඇති බවත් , එම කඩ වලින් මුදල් ගන්නවානම් ඒවා නඩත්තු කර මුදල් ගැනීම සිදුවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි. හංදියේ විදුලි ආලෝකය සඳහා මාගේ අතේ මුදලින් විදුලි බුබුළු දමන බවත් ප්‍රකාශ කරන ලදි. දැනටත් විශාල බල්බ් දෙකක් ඉල්ලා ඇති බවත්, ගොනාගොල්ල මං සන්දිය යනු උහ සභාවේ ප්‍රධාන නගර දෙකෙන් එකක් බවත්. ප්‍රකාශ කරන ලදි. ඒසේම එම නගරයේ ඇති පෙට්ටි කඩ ටික ප්‍රතිසංස්කරණය කර මුදල් ලබා ගැනීමට ක්‍රම වේදයක් සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදි. ගොනාගොල්ලේ තිබෙන පෙට්ටි කඩ උහන නගරයට ගෙන ඒමට හදන්න එපා යැයි ද ප්‍රකාශ කරන ලදි. එම යෝජනාව මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේදී ඉවත් කල යෝජනාවක් බවත් පෙන්වා දෙන ලදි. එසේම බක්කිඇල්ල ස්ථානාධිපතිතුමාගේ යෝජනා හතක් තිබෙන බවත් එම යෝජනා හතම නිවැරදි බවත් . එය බක්කිඇල්ලට පමණක් පොදු කාරණයක් නොවන බවත්, එය මුළු උහනටම පොදුව කරන්නට ඕන කාර්ය භාර්යයක් බවත් පෙන්වා දෙන ලදි. එම යෝජනා වල නුගේලන්ද සතිපොල භූමියේ පිරිසිදු කිරීම හා ලදු කැලෑ ඉවත් කිරීම යන යෝජනාව ගත්විට එය සභාවෙන් සිදුවිය යුතු කාර්යයක් බවත්, අදායම අඩුවෙන් ලැබෙනවා යැයි එම ස්ථාන අත්හැරීම සිදු නොකළයුතු බවත් , ඒවා සොයා බලා කළයුතු කාර්යන් බවත් පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

බක්කිඇල්ල ස්ථානාධිපතිතුමාගේ යෝජනා හතෙහි හතරවන යෝජනාව වන අතුරු මාර්ග වල දෙපස අනවසර වැටවල් ආදිය හා අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා නියෝග යොමු කිරීම යන යෝජනාව ගත් විට අනතුරුදායක ගස් ඉවත් කිරීමට පනතින්ම සභාවට බලය ලබා දී ඇති බව ප්‍රකාශ කරන ලදි. අනාරක්ෂිත ගසක් ඇති විට අපගේ සභාවේ කාර්මික නිළධාරියෙකු එම ගස අනාරක්ෂිත යැයි සනාථ කල විට දින 14 ක් ඇතුලත ගස කැපුවේ නැත්නම් නැවත දැනුම් දීමක් සිදු කර අප විසින් එම ගස කපා ඉවත් කලොත් ගස කපන්න යන වියදම සභාවට ගෙවිය යුතු බවත්,එය ගෙවීම පැහැර හැරිය හොත් අධිකරණයට යොමුකර වන්දිය සහ දඩය යන සියල්ලම ලබාගත යුතු බවත් පැහැදිලි කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්.කරුණාසේන දයාතිලක මයා.**

මාගේ යෝජනා වල රජගල පුරාවිද්‍යා භූමිය සංචාරකයින්ට පහසුකම් සැපයීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ වන යෝජානාව සම්බන්ධව ගිය සභා වාරයේදි සාකච්ඡා කල බවත් එදිනම ඒ සඳහා කටයුතු කිරිමට සූදානම් වන බව ප්‍රකාශ කල බවත් ඒ පිළිබඳව විමසන ලදි.එසේම වීපීලාම්පු ටික සවිකිරීම සඳහා අවශ්‍යය ක්‍රමවේදය සකස් කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදි.

**ගරු සභාපතිතුමා.**

අපි මේ සම්බන්ධව කතාකල බවත්, එම රජගල පුරා විද්‍යාභූමියට ඇතුල්වීම සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂතුමාගෙන් අවසර ගතයුතු බවත්, මා ඒ සම්බන්ධව දුරකතනයෙන් කතා කල විට ලිඛිතව ලිපියක් යොමු කරන ලෙස ප්‍රකාශ කර සිටි බවත්, කොළඹින් අවසරය ගත යුතු බවත්,අපි ලිඛිතව ඒ සඳහා ලිපි යොමු කළ බවත්, එම ලිපිය කොළඹට යොමු කර ඇති බවත්. ප්‍රකාශ කරන ලදි. එයට අනුමැතිය ලැබේවි යැයි ප්‍රකාශ කරන ලදි. එසේම වරිපනම් බදු මුදල සංශෝධනය කළ යුතු බවත් එය දැනට රු.1,000,000.00 තිබෙන බවත් , ලබන මාසයේ සිට වරිපනම් තක්සේරු කර මුදල් ප්‍රමාණය වැඩිකළ හොත් එම මුදල වැඩි කළ යුතු බව පෙන්වා දෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් ප.ව. 12.10 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඒ.නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය පිටවී යන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ගරු සභාපතිතුමනි,අපට නෛතිකව දැනට තිබෙන තක්සේරුවේ වටිනාකම මෙහි දමා ඇති බවත් ,තවම අළුතින් තක්සේරුව සිදු කර නොමැති බැවින් තක්සේරු කරන තුරු එම මුදලම තිබිය යුතු බවත් , තක්සේරු කල පසු පරිපූරක ඇස්තමේන්තුවක් දමා ඇතුලත් කල හැකි බවත් පැහැදිලි කර දෙන ලදි.අතර මැදදී මේ මේ ක්‍රියාදාමය සම්පූර්ණ බව පෙන්වා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ඇතුලත් කිරීම කළ හැකි බව පෙන්වා දෙන ලදි. තවද 1/61 යටතේ සභාව නමින් තැන්පත් කර ඇති ස්ථාවර තැන්පතු වලින් වාර්ෂිකව ලැබෙන පොලිය ආදායමට රු. 200,000.00 අපේක්ෂිතව ඇත. ඒ පිළිබඳව කතා කිරීමේදී මේ ස්ථාවර තැන්පතුවෙන් අතර මගදී මුදල් ගත හොත් එම මුදල රු.150,000.00 දක්වා සංශෝධනය විය යුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා**

සභාව සතු ස්ථාවර තැන්පතු දෙකක් තිබෙන බවත් , එහි පොලී ආදායම ලෙස රු.200,000.00 සඳහන් කර ඇති බවත් ,ස්ථාවර තැන්පතුවෙන් මුදල් ලබා ගැනීමට සභා අනුමැතිය අරගෙන තිබුනද එම තැන්පතුවෙන් මුදල් නොගත් බවත්, තවම එම ගිණුමෙන් මුදල් ලබා ගැනීමට තරම් අර්බුදයක් නොමැති බවත් පෙන්වා දෙන ලදි. නමුත් රංජිත් මන්ත්‍රීතුමා පවසා සිටින කාරණාව සාධාරණ බැවින් එය රු.150,000.00 දක්වා සංශෝධනය කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

5/24 පොල බදු යටතේ සති පොල සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම හා උහන නව සති පොල ඉදිකිරීමට අපේක්ෂිත බැවින් මෙම ආදායම රු.4,000,000.00 දක්වා ඇස්තමේන්තු කර ඇත උහන සතිපොල යන්න ඉලක්ක නොකොට සියළුම පොල ආදායම් ලෙස සලකා අපේක්ෂිත මුදල රු.2500000.00 ලෙස සංශෝධනය කරන ලෙස ප්‍රකාශ කරන ලදි.ගොඩනැගිලි අයදුම් පත්‍ර ගාස්තු වැඩි කිරීම සිදුකල හැකි බව පෙන්වා දෙන ලදි. 6/43 අය කරගත හැකි ගාස්තු යටතේ රජගල පුරාවිද්‍යා භූමිය නැරඹීම සඳහා එන පිරිස් සඳහා පහසුකම් සැපයීම සිදුකර ඒ සඳහා ගාස්තු අය කිරීම තුලින් යන්නෙහි රු.350,000.00 මුදල රු.500,000.00 දක්වා වැඩි කිරීම සිදුවිය යුතු බව පැහැදිලි කරන ලදි. සභාවට ඉඩමක් මිලදීගෙන ඉඩමෙහි රථගාලක් සකස් කර එම රථ ගාලෙහි නවත්වන ලද වාහන සඳහා ටිකට් එකක් ඉදිරිපත් කර මුදල් අය කිරීම සිදුකලයුතු බව පැහැදිලි කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

තව සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින ලදි.තව යෝජනා තිබේනම් මේ සභාවේ කතාකර ලිඛිතව ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී ඩබ්.රාණි මණිකේ මිය.**

2020 වර්ෂයේ හිටපු රාජ්‍ය අමාත්‍ය ගරු ශ්‍රියානි විජේවික්‍රම මැතිණියගේ විමධ්‍යගත අරමුදලින් මාගේ ඉල්ලීම පරිදි වැරැන්කැටගොඩ කාන්තා සතිපොල ඉදිකිරීම සඳහා රු.1,500,000.00 හා උහන තිස්සපුර ප්‍රදේශය සඳහා රු.2,000,000.00 කුත් ලැබුනු බවත්, අපි හෙල බොජුන් හල කියා නම හදා ගත්තාට කාන්තා සතිපොල ලෙස ව්‍යාපෘතිය නම්කර අපට ලැබුනු බවත්, එම සතිපොලවල් දෙක වැඩ නිමකර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් අපේ සභාවට පවරා දී අවසාන බවත්, නමුත් රු.3,500,000.00 මුදලක් යනු විශාල මුදලක් බවත්, තවම එය ආරම්භ කර ගැනීමට නොහැකි වීම සභාවක් වශයෙන් ගත්කල සභාවට එය හොද නැති බවත් පෙන්වා දෙන ලදි. ගොඩනැගිලි දෙකම සාදා අවසන් කර ඇති නමුත් මේ වන විට බල්ලෝ බලල්ලු බුදියන තැනට පත්වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි.මෙම කාන්තා සතිපොල පුළුවන් තරම් ඉක්මනින් ක්‍රියාත්මක කලයුතු බවත් ,එයට අවශ්‍යය වැඩපිලිවෙල සකස්කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා.

මේ යෝජනාව මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේදී සාකච්ඡා කළ බවත් ,ටෙන්ඩර් ක්‍රමවේදයකට යායුතු බවත් ,එය එසේ කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදි. මෙය හෙල බොජුන් සංකල්පයට ගියොත් දින දෙක තුනක් ආහාර හදා ඒවා විකුණුනේ නැත්නම් එය වසාදැමීමට සිදුවන බවත් , එම නිසා හෙල බොජුන් සංකල්පයට යන්නේ නැතිව කඩ කාමර ලෙස මේවා ටෙන්ඩර් කර ලබා දීමට බලාපොරොත්තු වන බව පෙන්වා දෙන ලදි. පොදුවේ ගත් කල කොට්ඨාශ තුනක් වන තිස්සපුර, උහන, දෙමටමල්පැලැස්ස කොට්ඨාශ එතනට සම්බන්ධ වන බවත්, ඒ කොට්ඨාශ තුනෙන්ම කාන්තාවන් සම්බන්ධ වන පරිදි එම කඩ ලබා දීම සිදුකිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි. එසේම එම ගොඩනැගිල්ලට ජලය, විදුලිය ලබා දීම සිදුකර මාසික ජල බිල්පත් හා විදුලි බිල්පත් එම කඩ කරන අය ගෙවිය යුතු බවත් ප්‍රකාශ කර ලදි. එසේම එක් කඩයකින් දිනකට රු.100.00 ක ආදායමක් ලබාගත යුතු බවත්, මාසයකට රු.3,000.00 ලෙස සභාවට ආදායම ලැබෙන බවත් පෙන්වා දෙන ලදි. එම යෝජනාව අයවැය කෙටුම්පතට ඇතුලත් කරන ලෙසත් කඩ කාමර 8 ක් ඇති බැවින් රු.288,000.00 ආදායම අයවැය ලේඛනයට යෙදීම සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් ප.ව. 12.35 ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී කේ.වී.ජී.නයනා කුමුදුනී මිය පිටවී යන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

විමලරත්න මන්ත්‍රීතුමාටත් යම් සංශෝධන කරන්නට යම් යෝජනා ලබා දීමට තිබේනම් කෙටුම්පත අවස්ථාව තිබෙන බවත් , එම යෝජනා සලකා බලා අපි ඒවා කෙටුම්පතට ඇතුලත් කරනවානම් එතුමාට අයවැයට විරුද්ධ වීමට සදාචාරාත්මක අයිතියක් නැති බවත් පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.ආර් චන්ද්‍රසේකර බණ්ඩාර මයා.**

පාලම් කදවුර ඉදිකරන ලද කාන්තා සති පොල සදහා විදුලිය හා ජලය අප විසින් ලබා දෙන විට ඒ කඩ කාමරය සදහා වෙන වෙනම ජලය විදුලිය ලබා දෙනවාදැයි විමසන ලදි.

**ගරු සභාපතිතුමා.**

එසේ වෙන වෙනම ජලය ලබා නොදෙන බවත් එක මීටරයකින් වෙන වෙනම ටැප් දමා ජලය ලබා දෙන බවත් . මාසික බිල කඩ භාවිතා කරන සියළුම දෙනා එකතු වී ගෙවිය යුතු බව පෙන්වා දෙන ලදි.එසේම ආදායම් සම්බන්ධව සියළුම දේ හිටපු සභාපතිතුමා සහ කිහිපදෙනෙකු සමග සාකච්ඡාකර සැදුව බවත් , මෙම ලේඛනයේ වියදම් සම්බන්ධව ප්‍රශ්නයක් තිබේනම් සාකච්ඡා කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

අපේ සභාවේ මුරකරුවන් අඩු බවත්,ස්ථිර මුරකරුවන් සිටින්නේ එක් අයෙකු පමණක් බවත් , නමුත් මාර්ග කම්කරුවන් මුරකරුවන් ලෙස රාජකාරී කරන බවත් , දැන් සියළුම දෙනා මුරකරු තනතුරෙහි රාජකාරි කිරීමට කැමති බවත් , එසේ වීමට හේතුව රාත්‍රියට පැමිණ නිදාගැනීමට හැකි නිසා බවත් වැඩක් නොකර සිට අතිකාල දීමනාත් ලබාගත හැකි නිසා බවත් පෙන්වා දෙන ලදි.මම එදා ඉදන් පවසා සිටියේ මේ සේවකයන් සියළුදෙනාගෙන්ම ෂිප්ට් ක්‍රමයක් හදන ලෙස බවත් , නමුත් තවම එය ක්‍රියාත්මක වී නොමැති බවත් , මාසයකට , පැය 8 ක ෂිප්ට් ක්‍රමයකට සේවකයන් බෙදුවොත් ඔවුන් පැය 8 වැඩකර ගෙදර යන බවත් , එසේ වීම තුලින් අතිකාල දීමනා ගෙවීමට සිදු නොවන බවත් , පෙන්වා දෙන ලදි.උදේ 6 ට පැමිනෙන සේවකයා සවස 2 වෙනතුරුත් .2 ට පැමිනෙන සේවකයා රාත්‍රී 10 වන තුරුත් රාත්‍රී10ට පැමිනෙ සේවකයා උදේ 8 වන තුරුත් ආදී ලෙස වෙන් කලහොත් වියදම් අඩු කර ගත හැකි බවත් පෙන්වා දෙන ලදි.රාජකාරී පැවරීමට සභාපති වරයාට බලය තිබෙන බවත් , එසේ සිදු කරන ලෙසත් පෙන්වා දෙන ලදි.

**ගරු උප සභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

කඩ කාමර සදහා 570000.00 ක් දැමූ බවත් , එතනට වියදම් සදහා ජලය හා විදුලිය ලබා ගැනීමට රු.150000.00 ක් පමණ වන බවත් එම නිසා ආදායම රු.550000.00ක් සදහන් කර වියදම රු150000.00 ක් යොදන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපතිතුමා.**

අද දිනයේ සභාවට පැමිණි සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ අයවැය කෙටුම්පත සදහා ඔබගේ යෝජනා ලබා දෙන ලෙසත් හා සංශෝධනය විය යුතු තැන් තිබේනම් ඒවා සාකච්ඡාකරන ලෙසයි.අද දිනයේ සියළුම මන්ත්‍රීවරුන්ට ඒ සදහා අවස්ථාව ලබා දෙන බවත් , අද නොපැමිණි මන්ත්‍රීවරුන්ට කෙටුම්පත ඉදිරිපත් කල පසු ඒ සදහා යෝජනා ලබා දිමට හැකියාව ඇති බවත්,විමලරත්න මන්ත්‍රීතුමාටත් යම් යෝජනා ලබා දීමට ඇත්නම් ඒවා ලබා දෙන ලෙස හා සංශෝධන කිරීමට යම් කාරණා තිබේනම් ඒවාද සිදුකරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.දර්ශන නුවන් මයා.**

කාන්තා සති පොලෙහි කඩ බදු දීමට ප්‍රථම විදුලිය සහ ජලය ලබාදිය යුතු නිසා ඒවාට යන වියදම එම තඩ ලබා ගන්නා අයගෙන් මුලින්ම අයකර ගැනීම සිදුකිරීම සුදුසු බව මා යෝජනාවක් ලෙස ගෙන එන බව ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපතිතුමා.**

ගොනාගොල්ලේ පොදු වැසිකිලිය තිබෙන ඉඩමේ අපට ගබඩාවක් සැදීම සඳහා LDSP ව්‍යාපෘතියෙන් මුදල් ලබා ගැනිම සිදුකල හැකි බවත් . එසේ ගබඩාවක් හැදීමට හැකිවුව හොත් විශාල ආදායමක් ලබාගත හැකි බවත් ප්‍රකාශ කරන ලදි.එසේ ගබඩාවක් සාදා කුලියට ලබාදීම තුලින් ආදායම් උත්පාදනය කරගත හැකි බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ගොනාගොල්ලේ පෙට්ටි කඩ ටික ගොනාගොල්ල පුස්තකාල භූමියට රැගෙන ගොස් ඒවා නැවත අලුත්වැඩියාකොට ප්‍රාදේශිය සභාවේ නම සඳහන් කර නැවත පෙට්ටි කඩ තිබූ ස්ථානයට ගෙන ගොස් ස්ථාන ගත කරන ලෙසත්, එම පෙට්ටි කඩ වලින් දිනකට අයකරන මුදල නිසියාකාරව ලබාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපතිතුමා.**

ගොනාගොල්ලේ පෙට්ටි කඩ ටික අලුත්වැඩියා කර ලබාදුන් පසු මාළු කඩ දෙකෙන් රු.300.00 ගණනේ හා අනෙක් කඩ තුනෙන් රු.150.00 අයකල යුතු බව පෙන්වා දෙන ලදි.ආදායම් වලට මෙය ඇතුලත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා.**

මෙම යෝජනා වලද වීරගොඩ පොල සම්බන්ධව කතා කල යුතු බවත් , එය ආදායම් මාර්ගයක් බවත් , දැන් එය අක්‍රිය වී ඇති බවත් , වීරගොඩ පොල ආරම්භ නොකිරීම ලොකු අසාධාරණයක් වී ඇති බවත් , ඒ ප්‍රදේශයටම එකම පොලක්වත් නොමැති බවත් පෙන්වා දෙන ලදි.එය සාර්ථකව පැවති පොලක් බවත් , එය ආරම්භ කිරීමට අවශ්‍යය කටයුතු සලසා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපතිතුමා.**

ඔබතුමා හා චන්ද්‍රසේකර බංඩාර මන්ත්‍රීතුමා , ජයතිලක මන්ත්‍රීතුමා සම්බන්ධ වී වීරගොඩ පොල නැවත ආරම්භ කිරීමට අවශ්‍යය කටයුතු සකස් කරන ලෙසත් , මාස තුනක කාලයක් පොල ආදායම් ලබා ගැනීම සභාව විසින් නොකරන බවත් ,ඉන්පසු පොල ආදායම් ලබා ගැනීම සිදුකරන බවත් වෙළෙන්දන් දැනුවත් කර එයට අවශ්‍යය වැඩ පිලිවෙල සකස් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්ප කුමාර මයා.**

සභාවට ආදායම් උත්පාදනය කර ගැනීම පිළිබඳව අප මේ මොහොතේ කතා කරන බවත් , නව උත්පාදන යෝජනා වල බොහොම හොඳ යෝජනා ටිකක් තිබෙන බව ප්‍රකාශ කරන ලදි.අප සභාවෙන් වියදම් නොකර මුදල් ලබාගත හැකි තැන් ඇහිරී ඇති බවත් , ඒවා සොයා බලා කටයුතු කලයුතු බව පෙන්වා දෙන ලදි.හිමිදුරාව වැව ගත් විට සංචාරකයින් පැමිණෙන මධ්‍යස්ථානයක් ලෙස පරිවර්තනය වී ඇති බවත් , ඒ පිලිබඳව සොයාබලා කටයුතු කරන ලෙස පෙන්වා දෙන ලදි.එසේම සභාවට මුදල් ලබා ගතහැකි

ආයතනයක් අතහැර ඇති බවත් , එම ආයතනය අතහැරියේ මොන හේතුවකින්ද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.එම ආයතනය නම් අභය පුර තිබෙන මේරියන්ස් හෝටලය බවයි. එය මාසයකට විශාල ආදායමක් සොයන හෝටලයක් බවත් , අපේ සභාවට අයිති බල ප්‍රදේශයක එය සදා ඇති බවත් , එම හෝටලයෙන් සභාවට මුදල් අයකර ගන්නවාදැයි විමසන ලදි.හිමිදුරාව වැව කොටස අපිරිසිදු කිරීම සිදුවන බවත් , ඒවා ගැන සෙවීමට සභාවෙන් නොයන බවත් , පෙන්වා දෙන ලදි.මේ සම්බන්ධව වහාම ක්‍රියාත්මක වී අපට බලය තිබෙනවා නම් කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.අපි මන්ත්‍රීවරු ලෙස ක්‍රියාත්මක වී සභාවට ලැබිය යුතු මුදල අයකර ගතයුතු බවත් , ඔවුන් අත්තනෝමතික ලෙස එම හෝටලය පවත්වාගෙන යන බවත් , අපි මන්ත්‍රීවරු කිහිප දෙනෙක් හෝ ගොස් ඔවුන් සමග සාකච්ඡාකර එම සභාවට ලැබියයුතු මුදල ලබා ගැනීමට කටයුතු කිරීම සිදුවිය යුතු බවත් පෙන්වා දෙන ලදි.මෙයට අවදානය යොමුකර අපට ආදායම් එන ස්ථාන සොයා බලා කටයුතු කිරීම සිදුවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.එසේම හිමිදුරාව වැව ගැන කතා කල යුතු බවත් ප්‍රකාශ කරන ලදි.හිමිදුරාව වැව මගින් ආදායම් උත්පාදන මාර්ග සාදා ගත හැකි බවත් , අප සභාව තුලින් කුණු ටික ඇදීම පමණක් සිදුකර බලා සිටීම පමණක් වියයුතු දැයි විමසන ලදි.හිමිදුරාව වැව තුළින් යම් ආදායම් උත්පාදන වැඩපිලි වෙලක් සකස් කිරීම සුදුසු බව යෝජනා කරන බවත් ඒ පිළිබදව අවදානය යොමු කර කටයුතු කරනවා නම් ඉතා හොද බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා පවසන ආකාරයට හෝටලයකින් අප සභාවට අයකර ගත හැක්කේ රු.3000.00 මුදලක් පමණක් බවත්, ඉන් එහාට අපට එයට බලපෑම් සිදුකල නොහැකි බවත් , එම රු.3000.00ක මුදල එක් වරක් අරගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදි.එසේම හිමිදුරාව වැව පිළිබද යෝජනාව ඉතා හොද බවත් , නමුත් එය ක්‍රියාත්මක කිරීමට යාමේදී පන්සලේ හාමුදුරුවන් හා පොලීසිය මැදිහත් වී එය වලකාලන බවත් , පන්සලේ හාමුදුරුවන් සමග සාකච්ඡා කිරීම සිදුකල හැකිනම් එය ක්‍රියාවට නැංවිය හැකි බවත් පෙන්වා දෙන ලදි.අපි ගොස් මුදල් එකතු කරන්නට ගියවිට හාමුදුරුවෝ හා පොලීසිය මැදිහත් වන බවත් , නමුත් දැන් සංචාරකයින් විශාල වශයෙන් හිමිදුරාව වැව බලන්න යන බවත් , ඒ පිලිබද දැන් හාමුදුරුවෝ වත් පොලිසිය වත් සොයා නොබලන බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චමින්ද පුෂ්ප කුමාර මයා.**

ප්‍රාදේශිය සභාවේ බලය අප විසින් ක්‍රියාත්මක කල යුතු බවත් , පොලිසියට හෝ පන්සලට එය නැවැත්විය නොහැකි බවත් පෙන්වා දෙන ලදි.පන්සලේ හාමුදුරුවන් විරුද්ධ වූයේ මුස්ලිම් ජනතාව පැමිණ කැලිකසල දමා වැව් ප්‍රදේශය අපවිත්‍ර කිරීම් සිදුකර ඇති නිසා බවත්,එයට නියමිත වැඩ පිළිවෙලක් සකස් කරනවානම් හාමුදුරුවන් විරුද්ධ නොවේවි යැයි ප්‍රකාශ කරන ලදි.දැන් මංගල උත්සව ආදි උත්සව එම වැව ආශ්‍රිතව සිදුකරන බවත් එය තුළින් සභාවට ආදායම් ලබාගතහැකි ක්‍රමවේදයකට යායුතු බවත් නිළධාරීන් සමග ගොස් එයට යම් වැඩ පිලිවෙලක් සකස් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.එසේම මේරියන්ස් හෝටලය ගැන අනිවාර්යයෙන්ම සොයා බලා සභාවට ලබාගතහැකි බදු අයකර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු උප සභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

උහන නගරයේ ත්‍රිරෝද රථගාල 06ක් පමණ තිබෙන බවත් , ගොනාගොල්ල නගරයේත් තව ත්‍රී රෝද රථ ගාලක් දැමීම සුදුසු බවත් ගොනාගොල්ල ප්‍රාදේශිය රෝහල අසල එසේ තවත් ත්‍රී රෝද රථ ගාලක් දැමීම සිදු කල හැකි බවත් ප්‍රකාශ කරන ලදි.ඒ තුලින් සභාවට ආදායමක් ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදි.උහන නගරයේ ළමා උද්‍යානය අසල වාහන රථ ගාලක් සෑදිය හැකි බවත් , උහන නගරයට පැමිණෙන වාහන එම ස්ථානයේ නවතා තබන බැවින් එම වාහන වලින් යම් බදු මුදලක් ලබා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදි.බයිසිකලයකින් රු.10.00 ක්ද, මෝටර් බයිසිකලයකින් රු.20.00 හා වෙනත් වාහන වලින් රු.50.00 ක් ආදී ලෙස අයකර ගැනීම සිදු කරන ලෙස යෝජනා කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එම්.කුලතුංග මයා.**

පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා අත්‍යාවශය කටයුත්තක් සාකච්ඡා කල බවත් , මේ සභාව පටන් අරගෙන මුල් කාලයේදීම මේ සම්බන්ධ යෝජනාවක් ලෙස ලබාදුන් බවත් , මුලින්ම අප වැසිකිලි පද්ධතිය පමණක් සකස් කිරීම සිදුකල යුතු බවත් පෙන්වා දුන් බවත් ප්‍රකාශ කරන ලදි.හිමිදුරාව වැව තුලින් විශාල ආදායම් මාර්ගයක් සකස්කර ගතහැකි බව පෙන්වා දෙන ලදි.එසේම එක කාලයක සභාපතිතුමා මැදිහත් වී ඒ තුලින් කෙසේ හෝ ලොකු ආදායමක් ලබා ගත් බවත් , නමුත් හාමුදුරුවෝ හා ගමේ කිසියම් කොට්ඨාශයක් මෙයට විරුද්ධ වූ බවත් ප්‍රකාශ කරන ලදි.නමුත් එක අවුරුද්දක සිවිල් ආරක්ෂක අධිකාරියෙන් විශාල අවුරුදු උත්සවයක් ඔය වැව් පිට්ටනියේ සිදුකල බවත් ,ලොකු ජනගහනයක් එයට සම්බන්ධ වූ බවත් , එම මොහොතේදී පවා මම ප්‍රකශ කලේ සභාව මැදිහත් වූවොත් හොද ආදායම් උත්පාදන මාර්ගයක් සැදිය හැකි බවයි.මාගේ අදහස වූයේ මංගල උත්සව සදහා ශාලාවක් සෑදීම බවත් , එය ග්‍රාමීය මට්ටමේ ශාලාවක් ලෙස සකස් විය යුතු බවත් පෙන්වා දෙන ලදි.එසේ සකස් කලොත් ලොකු ගමනක් යා හැකි බවත් , මූලික මට්ටමේ පියවරවල් ටික ඉතා ඉක්මනින් සකස් කිරීම සුදුසු බව යෝජනා කරන ලදි.ගරු සභාපතිතුමා පවසා සිටියේ වාරිමාර්ගයෙන් අවසර ලබා නොදෙන බවයි.මම මන්ත්‍රීතුමාට පවසා සිටියේ අපි සභාවක් බවත් , සභාවේ බලය පාවිච්චිකර මේ කටයුත්ත සිදු කිරීම සුදුසු බවයි.නමුත් මොන ආකාරයකින් හෝ එය ක්‍රියාත්මක නොවුනු බව ප්‍රකාශ කරන ලදි.දැනුත් මංගල උත්සවවල ඡායාරූප ගැනීම සදහා එම වැව ලගට යන බවත් , වෙන ස්ථානවල නම් එම ඡායාරූප ගන්නා අයගෙන් ගාස්තුවක් අය කරන බවත් , අපටත් එසේ සිදුකල හැකි බව පෙන්වා දෙන ලදි.තවද මේරියන්ස් හෝටලය ගැන කතා කල යුතු බවත් , එම හෝටලය හැදීමට කවුරු අනුමැතිය ලබා දුන්නා දැයි පුදුම හිතෙන බවත් , හෝටලයෙන් භාගයක් තිබෙන්නේ වැවේ බවත් පෙන්වා දෙන ලදි.අභයපුර විද්‍යාලයට කිට්ටුව තිබෙන බවත් , එම හෝටලය ආසන්නයේ දරුවන්ට පාඩම් වැඩ කටයුතු සිදු කරන්නට අපහසු බවත් පෙන්වා දෙන ලදි.තවද උත්සව අවස්ථාවල බීමත්ව මිනිසුන් කෑ ගසන බවත් ,එම හෝටලය මහජාතියෙන් පවත්වාගෙන යන බවත් , සභාවේ බලය යොදා රාජකාරිමය මට්ටමෙන් ඒ සදහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.අදහස් ප්‍රකාශ කලාට පසු ක්‍රියාත්මක විය යුතු ආයතන ඇති බැවින් ඔබතුමා අපිවත් ආරක්ෂා කරගෙන යම් වැඩපිලිවෙලක් සකස්කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපතිතුමා.**

ඔබ තුමාගේ යෝජනාව ඉතා හොද බවත් , ඔබතුමා හා පුෂ්ප කුමාර මන්ත්‍රීතුමා ගොස් හාමුදුරුවන් මුන ගැසී සාකච්ඡා කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.අපි මුලින්ම ගොස් හාමුදුරුවෝ මුන ගැසී සාකච්ඡා කරමු යැයි ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

හිමිදුරාව වැව ගැන කතා කිරීමේදී එය ආගමික ප්‍රශ්නයක් පැන නැගුන බවත් , ගමේ මිනිසුන් එය විසදීමට මැදිහත් වූ බවත් ,සභාවක් ලෙස අප අසරණ බවත් , පොලීසියටත් ඔය දේම සිදු වී ඇති බවත්, හාමුදුරුවෝ පැමිණිලි කරන විට පොලිසිය එය සොයා බැලීම සිදු කළ යුතු බැවින් ඔවුන් ඒසදහා මැදිහත් වන බවත් ප්‍රකාශ කරන ලදි.සභාපතිතුමා හා කොට්ඨාශයේ මන්ත්‍රිවරු දෙදෙනා නායක හාමුදුරුවන් මුන ගැසී මේ පිළිබද සාකච්ඡා කරන ලෙස ප්‍රකාශ කරන ලදි.සභාව වැටී ඇති තත්වය හා වෙන සභාවලින් සිදුවන කාර්යයන් කතාකර වෙන සභාවල මේ ආකාරයට මුදල් ලබා ගන්නා බව පැහැදිලි කර දෙන ලෙසත් එසේම ඔබ වහන්සේගෙන් ඒ සදහා ආශිර්වාද ලබා ගැනීමට පැමිණි බවත් ප්‍රකාශ කර සිටින ලෙස පෙන්වා දෙන ලදි.පැහැදිලි කරන්නට යාමේදී තර්ක පැමිනිය හැකි බවත් , එම නිසා ඒ සම්බන්ධව හොදින් අධ්‍යනය කර යාම සුදුසු බවත් පෙන්වා දෙන ලදි.එසේම අපි මේ කටයුත්ත සිදු කරනවානම් හරි පරිපාලකයෙක් සිටිය යුතු බවත් , එම ස්ථාන වල වෙන අසංවර දේවල් මැඩපැවැත්විය හැකි තත්වයක් අප විසින් සූදානම්කර තැබිය යුතු බවත් පෙන්වා දෙන ලදි.එසේම මෙය නිවැරදි ආකාරයට නම් ටෙන්ඩර් කිරීමද සිදුකල හැකි බවත් පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

නව ආදායම් උත්පාදන මාර්ග ගැන කතා කිරීමේදී බ්ලොක් ගල් කර්මාන්ත ආරම්භ කිරීම යෝජනාව කවදාවත් ක්‍රියාත්මක නොකරන බවත්,සුසාන භූමියේ භූමිදාන කටයුතු සඳහා මුදල් ලබා ගැනීම සිදුකල නොහැකි බවත්, ඒවා ඉවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.වාර සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම ඉවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරුසභාපතිතුමා.**

ඔබ සියළු දෙනාටම මා විසින් ප්‍රකාශ කර සිටියේ ඔබතුමාලාගේ යෝජනා ලබා දෙන ලෙසයි.එසේම මූල්‍ය ප්‍රතිපත්ති වාර්තාව සාකච්ඡාවට ලක් වූ බවත් , එම මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව අප විසින් අයවැය කෙටුම් පතට ගන්නා බවත් ,එතන දී කවුරුවත් වෙනස් කිරීම සිදු කරන්නට කතා නොකරන ලෙසත් , විමලරත්න මන්ත්‍රීතුමාටත් යෝජනා ලබා දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

2017 වර්ෂයේ වීරගොඩ වැවට දයා ගමගේ මැතිතුමා මාළු පැටව් ගෙනත් දැමූ බවත් , ඒ ආකාරයට වැව් වලට මාළු පැටවු දමා ධීවර සමිති වලින් දිනකට යම් මුදලක් අය කිරීම කලහැකි බව යෝජනා කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.ඒ.ඩී.සිසිර ශාන්ත කුමාර මයා.**

මැනුම් සිදු කිරීමේදී ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ දැනට අපට අයත් ප්‍රදේශයක ඉන්ධන පිරවුම් හල් දෙකක් හා වාහන සර්විස් සෙන්ටර් එකක් ආදී ලෙස අපට ආදායම් ලබා ගත හැකි ස්ථාන කීපයක් නාවිදන්වෙලි සභා බල ප්‍රදේශයට අයිති වී ඇති බවත්, ඒපිළිබද සොයා බලන ලෙස ප්‍රකාශ කරන ලදි.සිංහල පවුල් කීපයක ඉඩම්ද ඒ බල ප්‍රදේශයට ගොස් ඇති බව පෙන්වා දෙන ලදි.

**ඉහත මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව මගින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ට සභාවේ දක්වන ලද සංශෝධනයන් සහිතව අනුමැතිය ලබා දෙන ලදී.**

**08.2022 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම**

## ආදායම් විග්‍රහය - 2022 අගෝස්තු 01 සිට අගෝස්තු 30 දක්වා

| | | | |
|---|---|---|---|
| 01. පොදු පරිපාලන | වරිපනම් | රු: | 43,704.14 |
| | ව්‍යාපාර බදු | රු: | 187,100.00 |
| | බයිසිකල් | රු: | |
| | විවිරේබා සහතික | රු: | 11,000.00 |
| | වරිපනම් දඩ | රු: | |
| | වරිපනම් දඩ/උසාවි දඩ | රු: | |
| | පෝරම ගාස්තු | රු: | 2,640.00 |
| | අභ්‍යන්තර බිල්කිරීම් | රු: | 881,155.00 |
| | සේවක ණය පොළී | රු: | 8,911.44 |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | |

| | | | | |
|---|---|---|---|---|
| | | | 1,757,492.50 | |
| | **එකතුව** | රු: | | **2,892,003.08** |
| 02.සෞඛ්‍ය සේවා | වෙළඳ බලපත්‍ර | රු: | 55,000.00 | |
| | පරිසර බලපත්‍ර | රු: | | |
| | පරිසර බලපත්‍ර පරීක්ෂාව | රු: | 12,000.00 | |
| | සුනඛ එන්නත් | රු: | | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 344,380.00 | |
| | **එකතුව** | රු: | | **411,380.00** |
| 03.භෞතික සැලසුම් | ගෙවල් කුලි | රු: | | |
| | කුලියට දීම (වාහන) | රු: | | |
| | කුලියට දීම් (භූමිය) | රු: | | |
| | දීර්ඝ කාලීන බලපත්‍ර | රු: | | |
| | ගොඩනැගිලි පරීක්ෂාව | රු: | 8,250.00 | |
| | සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු: | | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 403,282.75 | |
| | **එකතුව** | රු: | | **411,532.75** |
| 04.ජල සේවා | ජල බවුසරය | රු: | | |
| | නල ළිං | රු: | | |
| | **එකතුව** | රු: | | **-** |
| 05.උපයෝගී සේවා | කඩකාමර කුලි (උහන, වෑරැන්කැටගොඩ) | රු: | 74,589.44 | |
| | මස්කඩ | රු: | | |
| | පොල බදු | රු: | 85,400.00 | |
| | අයකර ගතහැකි ගාස්තු | | | |
| | පොළ/කඩකාමර ප්‍රමාද ගාස්තු | රු: | 4,338.57 | |
| | **එකතුව** | රු: | | **164,328.01** |
| 06.සුභසාධන සේවා | විනෝද බදු | රු: | | |
| | ප්‍රචාරක දැන්වීම් පුවරු | රු: | 46,200.00 | |
| | ගවයන් ඇල්ලීම | රු: | | |
| | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | රු: | | |
| | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | 134,276.28 | |
| | **එකතුව** | රු: | | **180,476.28** |
| 07.විදුලිය | වැටුප් ප්‍රතිපූර්ණය | රු: | | |
| | **එකතුව** | රු: | | **-** |
| | පුනරාවර්තන ආදායම් එකතුව | | | **4,059,720.12** |
| | ප්‍රාග්ධන ආධාර | රු: | 21,678,901.07 | **21,678,901.07** |

| | | | |
|---|---|---|---|
| | **එකතුව** | | **25,738,621.19** |
| වෙනත් ලැබීම් | පුස්තකාල තැන්පත් | රු: 2,010.00 | |
| | සේවක ණය | රු: 174,500.00 | |
| | විවිධ තැන්පත් | රු: 100,000.00 | |
| | ටෙන්ඩර් තැන්පත් | රු: | |
| | මුද්දර තැන්පත් | රු: 5,775.00 | |
| | වැටුප් තැම්පත් | රු: | |
| | අත්තිකාරම් පියවීම | රු: 151,130.00 | |
| | මුදල් මාරු | රු: | |
| | ණය ගැති | රු: | |
| | **එකතුව** | රු: | **433,415.00** |
| | **මුළු එකතුව** | | **26,172,036.19** |

## උහන ප්‍රාදේශිය සභාවේ මාසික ඒකාබද්ධ වැය සාරාංශය
## 2022 අගෝස්තු මාසය

| | | |
|---|---|---|
| **1** | **අතිකාල ගෙවීම** | |
| | 01. ඒ. ප්‍රියන්ත කුමාර මයා (2022 ජූලි මස පැය 60 ක් සඳහා) | 6,999.60 |
| **2** | **ජල බිල්පත් පියවීම** | |
| | 01. උහන ප්‍රධාන කාර්යාලය (2022.08.08 දින දක්වා) | 6,210.03 |
| | 02. උහන පොලිසිය අසල ජල කාරාමය (2022.08.04 දක්වා) | 643.07 |
| | 03. උහන පොදු වෙළඳ පොළ මාළු ලැල්ල (2022.08.07 දක්වා) | 2,520.37 |
| | 04. වීරගොඩ පොළ (2022.07.25 දක්වා ) | 308.00 |
| | 05. නුගේලන්ද පොළ ජල බිල්පත පියවීම) 2022.05.15-2022.07.16 දක්වා) | 1,675.90 |
| | 06. නුගේලන්ද පොළ ජල බිල්පත පියවීම) 2022.08.15 දක්වා) | 632.80 |
| **3** | **දුරකථන බිල්පත් පියවීම** | |
| | 01. 0632250355 ( 2022.07.01-2022.07.31 දක්වා ) | 6,566.65 |
| | 02. 0632250357 ( 2022.07.01-2022.07.31 දක්වා ) | 407.43 |
| | 03. 0632250357 ( 2022.06.01-2022.06.30 දක්වා ) | 407.43 |
| **4** | **විදුලි බිල්පත් පියවීම** | |
| | 01. වීරගොඩ නව පුස්තකාලය (2022.06.27-2022.07.21) | 240.00 |
| | 02. උහන මහජන පුස්තකාලය (2022.07.02-2022.08.05) | 1,008.60 |
| | 03. උහන ප්‍රධාන කාර්යාලය (2022.07.02-2022.08.05) | 16,806.25 |
| | | |
| **5** | 01. ඒ.පී.ප්‍රදීප් පත්මචන්ද්‍ර මයා (2022 ජූලි මස දෛනික වැටුප් ගෙවීම) | 20,420.14 |

| | | |
|---|---|---|
| | 02. ටී.පී.ඩී. හේමමාලි රණවීර මිය (2022 ජුනි මස දෛනික වැටුප් ගෙවීම) | 9,926.19 |
| | 03. එච්.එම්. ප්‍රදීප් සඳකැලුම් මයා (2022 ජූලි මස දෛනික වැටුප් ගෙවීම) | 29,554.99 |
| | 04. ඩී.එම්. දිලාන් තනුජ මයා (2022 ජූලි මස දෛනික වැටුප් ගෙවීම) | 18,050.37 |
| | 05. ඒ.ආර්.ඩී.පී.සී. බණ්ඩාර මයා (2022 ජූලි මස දෛනික වැටුප් ගෙවීම) | 28,702.03 |
| | 06. සේවක අර්ථසාධක අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 24,886.61 |
| | 07. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 3,732.98 |
| | 08. ප්‍රාදේශීය සභා සුභ සාධක සංගමය (දෛනික වැටුප් අවකරණ) | 1,500.00 |
| | 09. ආර්.එම්. නවීන් සදීප බංඩාර මයා (ජූලි මස පරිගණක පුහුණු දීමනාව ගෙවීම) | 10,000.00 |
| **6** | **වවුචර් ගෙවීම්** | |
| | 01. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (ලියාපදිංචි තැපැල සඳහා මුද්දර ලබා ගැනීම) | 2,500.00 |
| | 02. එච්.එච්.එස්.චන්ද්‍රසිරි මයා,නුවර පාර,උහන (2021 අය-වැය සංවර්ධන යෝජනා යටතේ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම- ගරු මන්ත්‍රීවරුන් විසින් යෝජිත අනුමත සමිති සඳහා ලබා දීමට) | 50,000.00 |
| | 03. ඒ.පී.පී.පත්මචන්ද්‍ර මයා, ආදේශක රියදුරු, ප්‍රාදේශීය සභාව, උහන (මෙම ආයතනයට අයත් 204-4895 ත්‍රිරෝද රථය සඳහා අතින් මුදල් ගෙවා ලබා ගත් පෙට්‍රල් ලීටර් 10 සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම) | 4,500.00 |
| | 04. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (ලියාපදිංචි තැපැල සඳහා මුද්දර ලබා ගැනීම) | 2,500.00 |
| | 05. කේ.ඒ.සරත් ගුණසේකර ගුණකරු ඉන්ධන පිරවුම්හල, ආඳල්ඔය (2022.04.25-2022.06.20) මෙම ආයතනයට ලබා ගත් ඉන්ධන සඳහා බිල්පත් පියවීම) | 113,680.00 |
| | 06. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (සුලු මුදල් ඉල්ලීම) | 4,800.00 |
| | 07. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (උහන ප්‍රාදේශීය සභාවේ පුස්තකාල ප්‍රවර්ධන සාකච්ඡාව සඳහා සංග්‍රහ කිරීමේ කටයුතු) | 1,440.00 |
| | 08. එච්.එම්.බණ්ඩාර,දමිත් ඉන්ධන පිරවුම්හල,උහන (2022.08.12 දින කම්පැක්ටර් රථයට ලබා ගත් ඉන්ධන ඩීසල් ලීටර් 100 සඳහා ගෙවීම) | 43,000.00 |
| | 09. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (E-Learning Center සහ මහජන පුස්තකාලය භාවිතයට හුරු කිරීම සම්බන්ධව පැවැත්වූ වැඩ සටහන වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම) | 4,185.00 |
| | 10. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (E-Learning Center සහ මහජන පුස්තකාලය භාවිතයට හුරු කිරීම සම්බන්ධව පැවැත්වූ දෙවන වැඩ සටහන වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම) | 7,000.00 |
| | 11. ඩී.එම්.සී.ඒ.දිසානායක මිය (ගෙවතු වගා කටයුතු සඳහා කෘමිනාශක ලබා ගැනීම) | 1,250.00 |
| | 12. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (උහන පුස්තකාල සාමාජික කාඩ් වල ඇලවීම සඳහා පත්‍රිකා ප්‍රින්ට් කිරීම සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන්) | 1,600.00 |
| | 13. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (ලියාපදිංචි තැපැල සඳහා මුද්දර ලබා ගැනීම) | 2,500.00 |
| | 14. ඩී.ආර්.එස්.ප්‍රියදර්ශනී,ධාරණ පොත්හල,උහන (උහන ළමා උද්‍යානයේ දැන්වීම් පුවරු ලැමිනේට් කිරීම කිරීම සඳහා බිල්පත පියවීම) | 1,300.00 |
| | 15. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (ලියාපදිංචි තැපැල සඳහා මුද්දර ලබා ගැනීම) | 2,500.00 |

| | | |
|---|---|---|
| | 16. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (සුලු මුදල් ඉල්ලීම) | 4,894.00 |
| | 17. සභාපති - එක්සත් ජනතා සුභසාධක අවමංගලයාධාර සමිතිය, උදාගිරිගම,බටහිර (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ 24/106/4 නිවස අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීම) LA/16/21/CC/129 | 1,715,667.91 |
| | 18. සභාපති - එකමුතු සුභසාධක සමිතිය, අංක 21,තිස්සපුර,බටහිර (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ 21/31 හංදිය සිට 21/44/1 නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම) LA/16/21/CC/402 | 412,779.63 |
| | 19. ලුමිනස් සෝලා එනර්ජි පුද්ගලික සමාගම (PP I ව්‍යාපෘතිය යටතේ සූර්යය බල විදුලි පහන් මිලදී ගැනීම සඳහා මුදල් ගෙවීම) | 900,000.00 |
| | 20. ලුමිනස් සෝලා එනර්ජි පුද්ගලික සමාගම (PP I ව්‍යාපෘතිය යටතේ සූර්යය බල විදුලි පහන් සවි කිරීම වෙනුවෙන් රැඳවුම් මුදල ආපසු ගෙවීම.) | 50,000.00 |
| | 21. ඩබ්.ඩී.මහේෂිකා මිය (2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දීමනාව ලබා ගැනීම,සාමාජික) | 4,000.00 |
| | 22. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්,අම්පාර ශාඛාව (මෙම ආයතනයට අයත් UC-2977 යතුරු පැදියේ 2022/04/28 සිට 2023/04/27 දක්වා කාල සීමාව තුළදී රක්ෂණ සහතිකය ලබා ගැනීම. | 4,464.98 |
| | 23. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන (2022/08/30 වන දින පැවැත්වීමට නියමිත පරිසර කමිටුව සඳහා දීමනා සහ සංග්‍රහ වියදම් වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම.) | 12,000.00 |
| | 24. එච්.එම්.ප්‍රදීප් සඳකැලුම් මයා ( මෙම ආයතනයට අයත් PE-8373 කැබ් රථයට අතින් ගෙවා ලබා ගත් ඉන්ධන සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම) | 17,200.00 |
| | 25. ඩී.එම්.විජේරත්න මයා 1/1,E,ලාතුගල (වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතිකය සඳහා ලබා ගත් වීථි රේඛා පරික්ෂා කිරීමේ ගාස්තුව නැවත ගෙවීම) | 3,000.00 |
| **7** | ස්ථිර වැටුප් (අගෝස්තු මස) | 2,619,368.06 |
| **8** | මන්ත්‍රී දීමනා (අගෝස්තු මස) | 465,000.00 |
| | එකතුව | 6,642,329.02 |

**හරස් සටහන්** 390,866.47

**මුළු එකතුව** **7,033,195.49**

**09.2022** අගෝස්තු මස ධාවන සටහන් ඉදිරිපත් කිරීම

**2022 අගෝස්තු මස ධාවන සටහන් විස්තරය LL - 7523 කෘෂ කැබ් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **05 L** | |
| 2022.08.01 | ප්‍රා.ස. සිට දෙමටමල්පැලැස්ස අවට වීථි ලාම්පු නඩත්තු කිරීම සඳහා ගොස් ආපසු ප්‍රා.ස. වෙත | 75 | | 14 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.08.03 | ප්‍රා.ස. සිට අම්පාර පුබුදු එන්ටර්ප්‍රයිසස් වෙත ගොස් අම්පාර අවට ගොස් ප්‍රා.ස. වෙත | | | 28 |
| 2022.08.04 | ප්‍රා.ස. සිට අම්පාර ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත ගොස් අම්පාර සහ ඒ අවට ආපසු ප්‍රා.ස. වෙත | | | 28 |
| 2022.08.05 | ප්‍රා.ස. සිට අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.08.08 | ප්‍රා.ස. සිට අම්පාර පෙරකදෝරු නිවස වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.08.10 | ප්‍රා.ස. සිට ලයිට් ලයින් පාර හා ඒ අවට වීථි ලාම්පු නඩත්තු කිරීමට ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 7 |
| 2022.08.18 | ප්‍රා.ස. සිට සියනෑ ස්ටෝර්ස් සහ ඒ අවට ගොස් නැවත ප්‍රා.ස. වෙත | | | 7 |
| 2022.08.20 | ප්‍රා.ස. සිට අශෝක හාඩ් වෙයාර් සහ ඒ අවට ගොස් ප්‍රා.ස. වෙත | | | 7 |
| 2022.08.21 | ප්‍රා.ස. සිට අම්පාර වෙත ගොස් නැවත ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.08.25 | ප්‍රා.ස. සිට පැරණිගම වීථි ලාම්පු නඩත්තු කිරීම සඳහා ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 7 |
| 2022.08.26 | ප්‍රා.ස. සිට අම්පාර කොමසාරිස් කාර්යාලය සහ වාරිමාර්ග කාර්යාලය වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 21 |
| 2022.08.29 | ප්‍රා.ස. සිට කුමාරිගම වීථි ලාම්පු නඩත්තු කටයුතු සඳහා ගොස් ආපසු ප්‍රා.ස. වෙත | 26 | | 21 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **101** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **106 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති පැ.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 07 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 203 ක් ධාවනයේ යෙදී ඇත) | | **29 L** | **203 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **77 L** | |

**2022 අගෝස්තු මස ධාවන සටහන් විස්තරය ZB-0351 කම්පැක්ටර් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **88 L** | |
| 2022.08.01 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උයදගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.08.02 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.03 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.05 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.08.08 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 50 | | 49 |
| 2022.08.09 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.10 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.12 | ප්‍රා.ස. සිට උහන නගරය උහන පොළ ආපසු අම්පාර කසළ ප්‍රවාහනය ආපසු උහන ප්‍රා.ස. වෙත | | | 35 |
| 2022.08.15 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 100 | | 49 |
| 2022.08.16 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.17 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය ආපසු උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ ආපසු උහන ආපසු අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.18 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 159 | | 56 |
| 2022.08.19 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.08.22 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2022.08.23 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ පියංගල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.24 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය ආපසු උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න ආපසු උහන ආපසු අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.25 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල පොළ සෙනරත්පුර රෝහල ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | 82 | | 63 |
| 2022.08.26 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර එයාපෝර්ට් හන්දිය ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උහන පොළ අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 42 |
| 2022.08.29 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර ආපසු උහන වීරගොඩ පාර ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ පොළ ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 49 |
| 2022.08.30 | ප්‍රා.ස. සිට වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලතැන්න නුගේලන්ද පොළ ආපසු උහන නගරය අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| 2022.08.31 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර සිවිල් ආරක්ෂක බලකාය උහන වීරගොඩ පාර ළමා නිවාසය ඩිස්පෙන්සරිය පාර උහන නගරය උදයගිරිය වැරැන්කැටගොඩ ගොනාගොල්ල රජගලැත්නන ආපසු උහන අම්පාර කසළ ප්‍රවාහනය ආපසු ප්‍රා.ස. වෙත | | | 70 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **391 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **479 L** | |
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 3.5 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1225 ක් ධාවනයේ යෙදී ඇත) | | **350** | **1225 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **129L** | |

**2022 අගෝස්තු මස ධාවන සටහන් විස්තරය PE-8373 කැබ් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **61 L** | |

| | | | | |
|---|---|---|---|---|
| 2022.08.01 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත උහන අවට ආපසු අම්පාර අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.08.02 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු නවගිරියාව ආපසු ප්‍රා.ස. දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.08.03 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු නවගිරියාව ආපසු ප්‍රා.ස. දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.08.04 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු සේනාගම වැරැන්කැටගොඩ සහ ඒ අවට ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 64 |
| 2022.08.05 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු නුගේලන්ද නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.08.06 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 50 | | 24 |
| 2022.08.08 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.08.09 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා | | | 8 |
| 2022.08.10 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 40 |
| 2022.08.12 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු ගොනාගොල්ල නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 32 |
| 2022.08.13 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු වළගම්පුර නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත අම්පාර ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.08.15 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.08.16 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.08.17 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |

| | | | | |
|---|---|---|---|---|
| 2022.08.18 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු ගොනාගොල්ල නැවත වළගම්පුර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 48 |
| 2022.08.19 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. අපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 24 |
| 2022.08.20 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර නගරය අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත රුහුණුගම ආපසු ප්‍රා.ස. දක්වා නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 72 |
| 2022.08.21 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත අම්පාර සහ ඒ අවට ආපසු නුගේලන්ද නවගිරියාව සහ ඒ අවට ආපසු උහන නගරය දක්වා නැවත හිම්දුරාව ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 88 |
| 2022.08.22 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත උහන අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 79 | | 24 |
| 2022.08.23 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු උහන අවට නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 16 |
| 2022.08.24 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට නැවත ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 40 |
| 2022.08.25 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු උහන අවට නැවත අම්පාර සහ ඒ අවට ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 56 |
| 2022.08.26 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. දක්වා ආපසු අම්පාර සහ ඒ අවට ආපසු ප්‍රා.ස. දක්වා ආපසු නුගේලන්ද හා ඒ අවට ආපසු උහන අවට නැවත කුමාරිගම ආපසු ප්‍රා.ස. නැවත සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | | | 88 |
| 2022.08.27 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. ආපසු මහඔය ප්‍රා.ස. දක්වා ආපසු උහන ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා නැවත ප්‍රා.ස. වෙත | | | 120 |
| 2022.08.28 | ප්‍රා.ස. සිට සභාපතිතුමාගේ නිවස දක්වා නැවත කඩුවෙල නවාතැන්පල වෙත | 40 | | 256 |
| 2022.08.29 | කඩුවෙල නවාතැන්පල සිට බත්තරමුල්ල ප්‍රධාන මහා මාර්ග කාර්යාලය වෙත නැවත නෙලුම් මාවත අගමැති කාර්යාලය දක්වා ආපසු කඩුවෙල නවාතැන්පල වෙත | | | 64 |
| 2022.08.30 | කඩුවෙල නවාතැන්පල සිට නුගේගොඩ ලුම්නස් ආයතනය සහ ඒ අවට නැවත බත්තරමුල්ල මහා මාර්ග ඉංජිනේරු කාර්යාලය දක්වා නැවත කඩුවෙල නවාතැන්පල වෙත | | | 88 |
| 2022.08.31 | කඩුවෙල නවාතැන්පල සිට උහන ප්‍රා.ස. දක්වා ආපසු සභාපතිතුමාගේ නිවස දක්වා ආපසු ප්‍රා.ස. වෙත | 35 | | 272 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **204 L** | | |
| | මුළු ඉන්ධන ප්‍රමාණය | | **265 L** | |

| | | | | |
|---|---|---|---|---|
| | වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 08 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 1880 ක් ධාවනයේ යෙදී ඇත) | | **235** | **1880 Km** |
| | මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | | **30 L** | |

**2022 අගෝස්තු මස ධාවන සටහන් විස්තරය 252-6471 කැබ් රථය**

| දිනය | සිදු කළ කාර්යය | ලබා ගත් ඉන්ධන ප්‍රමාණය | පසු ගිය මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය | ධාවනය කළ කි.මී. පැ.මී. |
|---|---|---|---|---|
| | | | **20 L** | |
| 2022.08.01 | ප්‍රා.ස. සිට ගොනාගොල්ල නැවත අහන ප්‍රා.ස. ආපසු වළගම්පුර ආපසු ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.08.02 | ප්‍රා.ස. සිට ආදල්ඔය නැවත උහන ප්‍රා.ස. නැවත ගලපිටගල වළගම්පුර ගොස් ආපසු ප්‍රා.ස. වෙත | | | 68 |
| 2022.08.13 | ප්‍රා.ස. සිට ආදල්ඔය නැවත උහන ප්‍රා.ස. නැවත අම්පාර නැවත ප්‍රා.ස. වෙත | 50 | | 34 |
| 2022.08.15 | ප්‍රා.ස. සිට අම්පාර වාරිමාර්ග කාර්යාලයට ගොස් නැවත ප්‍රා.ස. නැවත අම්පාර නැවත ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.08.16 | ප්‍රා.ස. සිට අම්පාර පළාත් පාලන ආයතනය නැවත ප්‍රා.ස. නැවත අම්පාර ලංකා ගමනා ගමන මණ්ඩලය නැවත ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.08.17 | ප්‍රා.ස. සිට ගොනාගොල්ල නැවත ප්‍රා.ස. නැවත අම්පාර ලංකා ගමනා ගමන මණ්ඩලයට නැවත ප්‍රා.ස. වෙත ආපසු ආදල්ඔය නැවත ප්‍රා.ස. වෙත | | | 68 |
| 2022.08.18 | ප්‍රා.ස. සිට ගොනාගොල්ල නැවත ප්‍රා.ස. ආපසු වීරගොඩ නැවත ප්‍රා.ස. නැවත ආදල්ඔය නැවත ප්‍රා.ස. වෙත | | | 68 |
| 2022.08.19 | ප්‍රා.ස. සිට අම්පාර ලංකා ගමනා ගමන මණ්ඩලය නැවත ප්‍රා.ස. ආපසු අම්පාර නැවත ගොනාගොල්ල නැවත ප්‍රා.ස. වෙත | | | 68 |
| 2022.08.20 | ප්‍රා.ස. සිට පාළම් කඳවුර නැවත උහන වැරැන්කැටගොඩ නැවත ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.08.22 | ප්‍රා.ස. සිට දමිත් ඉන්ධන පිරවුම්හල නැවත ආදල්ඔය නැවත උහන ප්‍රා.ස. නැවත කුමාරිගම නැවත උහන ප්‍රා.ස. නැවත ගොනාගොල්ල නැවත ප්‍රා.ස. වෙත | | | 68 |
| 2022.08.23 | ප්‍රා.ස. සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය උහන ආපසු කුමාරිගම සුහදගම වීරගොඩ උහන හිම්දුරාව ප්‍රා.ස. වෙත ආපසු වීරගොඩ පොළ හන්දිය වෙත ගොස් ආපසු ප්‍රා.ස. වෙත | 29 | | 85 |
| 2022.08.24 | ප්‍රා.ස. සිට නුගේලන්ද බදුලු හන්දිය රජගලතැන්න උහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය උහන ආපසු ප්‍රා.ස. වෙත | | | 51 |
| 2022.08.25 | ප්‍රා.ස. සිට අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස් ආයතනය වෙත ගොස් අම්පාර අවට ධාවනයෙන් පසු උහන ප්‍රා.ස. වෙත | | | 34 |
| 2022.08.27 | ප්‍රා.ස. සිට උහන කුමාරිගම තිස්සපුර හරහා ප්‍රා.ස. වෙත | | | 17 |
| 2022.08.29 | ප්‍රා.ස. සිට ලාතුගල වළගම්පුර කොහොඹාන නැවත ප්‍රා.ස. වෙත | 52 | | 34 |
| | මේ මස ලබා ගත් ඉන්ධන | **131 L** | | |

| | | | | |
|---|---|---|---|---|
| | **මුළු ඉන්ධන ප්‍රමාණය** | | **151 L** | |
| | **වැය වූ ඉන්ධන ප්‍රමාණය හා ධාවනයේ යෙදී ඇති කි.මී. ගණන (ඉන්ධන ලීටර් 01 කින් කි.මී. 08.5 ක් ධාවනය කළ හැකිය. මෙම මස කි.මී. 782 ක් ධාවනයේ යෙදී ඇත)** | | **92 L** | **782 Km** |
| | **මෙම මස ඉතිරි ඉන්ධන ප්‍රමාණය** | | **59 L** | |

10. වෙනත්.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ගේ නිවාඩු සම්බන්ධ ලිපි සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම .

1. **ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මයා** **ගරු ප්‍රා.ස.මන්ත්‍රී**
2. **කේ.බී. විමලරත්න මයා** **ගරු ප්‍රා.ස.මන්ත්‍රී**
3. **එන්.පී. චතුරංග දර්ශන කුමාර මයා** **ගරු ප්‍රා.ස.මන්ත්‍රී**
4. **ඒ. ලලිත් කුමාර මයා** **ගරු ප්‍රා.ස.මන්ත්‍රී**
5. **එන්. අමරකීර්ති මයා** **ගරු ප්‍රා.ස.මන්ත්‍රී**
6. **ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය** **ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී**

මූලාසනය.

න්‍යාය පත්‍රානුකූලව අදට නියමිත වැඩ කටයුතු අවසන් බවත් මීළඟ සභාවාරය 2022.10.06 වන දින පෙ.ව. 9.30 මෙම ස්ථානයේදී පැවැත්වෙන බවත් දක්වන ලදි. එදින ප.ව. 2.35 ට පමණ සභා කටයුතු අවසන් කරන ලදි.

ලේකම්
ප්‍රාදේශිය සභාව
උහන.

2022/**10**/06 දින රැස්වීමේදී සංශෝධන සහිතව/රහිතව සභා සම්මත කරන ලදි.

ගරු සභාපති.